

# නිවනේ නිවීම

## සත්වන වෙළුම

කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

# නිවනේ නිවීම

## ( දෙසුම් පෙළකි )

සත්වන වෙළුම - තෙවන මුද්‍රණය

*(19-21 දෙසුම්)*

**ISBN 955 - 8832 - 11 - 1**

**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර,
දේවාලේගම.

ප්‍රකාශනය
ධම්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය

ධම්මදානයකි

මුදලට විකිණීම සපුරා තහනම් වෙයි.

ප්‍රථම මුද්‍රණය - 1999 අගෝස්තු

## පොත ලබාගත හැකි ස්ථාන

1. පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
   'පහන් කණුව' කන්දේගෙදර, දේවාලේගම.

2 රෝයල් ඉන්ස්ටිටියුට්,
   191, හැව්ලොක් පාර,
   කොළඹ 5.

3. ඩී. ටී. වේරගල මහතා
   422, වැලිපාර, තලවතුගොඩ.

4. අනුර රූපසිංහ මහතා
   27, කොළඹ වීදිය, මහනුවර

5. මහා භාරකාර දෙපාර්තමේන්තුව
   2, බුලර්ස් පටුමග,
   කොළඹ 07.

මුද්‍රණය
කොලිටි ප්‍රින්ටර්ස්
17/2, පැඟිරිවත්ත පාර, ගංගොඩවිල,
නුගේගොඩ.
ටෙලි : 011-4302312

මෙම දේශනාමාලාව පැවැත්වීමට ආරාධනාකොට

අප ධෛර්යවත් කළ

මීතිරිගල නිස්සරණ වන සේනාසනාධිපතිව වැඩවිසූ

අපවත් වී වදාළ

අතිපූජනීය, මහෝපාධ්‍යාය

## මාතර ශ්‍රී ඥානාරාමාභිධාන

අප ගුරුදේවයන් වහන්සේගේ ශ්‍රී නාමයට

## 'නිවනේ නිවීම'

පූජෝපහාරයක්ම වේවා!

එතං සන්තං

එතං පණීතං

යදිදං

සබ්බ සංඛාර සමථො

සබ්බූපධිපටිනිස්සග්ගො

තණ්හක්ඛයො

විරාගො

නිරොධො

නිබ්බානං

"මෙය ශාන්තය

මෙය ප්‍රණීතය

එනම්

සියලු සංස්කාරයන්ගේ සංසිඳීම

සියලු උපධීන් අතහැර දැමීම

තණ්හාව ක්ෂය කිරීම

නොඇල්ම නම්වූ විරාගය

නැවැත්ම නම් වූ නිරෝධය

නිවීම නම් වූ නිබ්බානය''

# පටුන


| | පිටුව |
|---|---|
| හැඳින්වීම | vi |
| ප්‍රකාශක නිවේදනය | x |
| අමාගඟ | xi |
| ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය | xiii |
| ග්‍රන්ථ සංකේත නිරූපණය | xiv |
| 'නිවනේ නිවීම' - 19 | 1 |
| 'නිවනේ නිවීම' - 20 | 25 |
| 'නිවනේ නිවීම' - 21 | 49 |

# හැඳින්වීම

බුද්ධ දේශනාවෙහි දැක්වෙන ප්‍රතිපත්ති මාර්ගයේ අවසාන පරමාර්ථය වන 'නිවන' පිළිබඳව ඈත අතීතයේ පටන්ම විවිධ මතිමතාන්තර ප්‍රකාශයට පත් වී ඇත. ආර්ය අෂ්ටාංගික මාර්ගය 'සම්මා දිට්ඨි' නම් වූ 'හරි දැක්ම' පෙරටු කරගත් ප්‍රතිපදාවකි. එබැවින් ඒ මාර්ගයෙහි ගමන් කරන්නෙකුට ගමනෙහි ඉලක්කය ගැන නිරවුල් අවබෝධයක් ඇතිවිය යුතුමය. බුද්ධ වචනයට අනුකූලව එවැනි අවබෝධයකට මඟ හෙළි කිරීම මෙම දේශනා මාලාවේ පරමාර්ථය විය.

මීතිරිගල නිස්සරණ වන සෙනසුනෙහි ප්‍රධාන කර්මස්ථානාචාර්යයන් වහන්සේ වශයෙන් වැඩ විසූ, අපවත් වී වදාළ අතිපූජනීය මහෝපාධ්‍යාය මාතර ශ්‍රී ඤාණාරාම මාහිමිපාණන් වහන්සේ විසින් අප වෙත කරන ලද සමාරාධනය මේ දේශනා පෙළට ආසන්න නිමිත්ත විය. අපගේ ගුරුදේවයන් වහන්සේ වූ උන්වහන්සේ, මෙයට වසර කීපයකට පෙර නිස්සරණ වන යෝගාවචර සඟ පිරිසට ඉදිරිපත්වූ එක්තරා ධර්ම ගැටළුවකදී 'නිවන' පිළිබඳව දේශනා පෙළක් පැවැත්වීම ප්‍රයෝජනවත් විය හැකි බවත්, ඒ දේශනා පටිගත කරගැනීමට කටයුතු යෙදිය හැකි බවත් පවසමින් අප වෙත කරන ලද දයාන්විත ආරාධනය පිළිගැනීමට මුලදී පසුබට වීමු. යළිත් එම ආරාධනාව කළ අවස්ථාවේදී, එසේ පසුබට වීමට එක් හේතුවක් වශයෙන් අප සඳහන් කළේ 'නිවන' සම්බන්ධයෙන් දැනට ප්‍රචලිතව ඇති ඇතැම් මතිමතාන්තර කෙරෙහි අප දක්වන වෙනස් ආකල්පය නිසා ඇතිවිය හැකි ප්‍රතිචාරයය. එවිට උන්වහන්සේ වදාළේ: "ඒකට කමක් නෑ ...... මා ආරාධනා කළ බව දේශනාවේදීම කියන්න" යනුවෙනි.

ඒ සා උදාර පැවරීමකින් උත්සාහවත්ව ආරම්භ කැරුණු මෙම දේශනා මාලාව දෙවසරකට වැඩි කාලයක් තිස්සේ (1988.08.12 - 1991.01.30) දෙපෝයකට වරක් බැගින් අප ගුරුදේවයන් වහන්සේගේ අතිපූජනීය පාදමූලයේදී නිස්සරණ වනයේ අප සබ්‍රහ්මචාරී ගරුතර යෝගාවචර සඟ පිරිස හමුවේ පවත්වන්නට යෙදුණි. ගිලන්වූ ඇතැම් අවස්ථාවලදී පවා මාහිමිපාණන් වහන්සේ යහන්ගතව දෙසුමට සවන් දුන්හ. උන්වහන්සේ බැහැර සෙනසුනෙක වැඩ විසූ එක් අවස්ථාවෙක, මාහිමිපාණන් වහන්සේ මුල'සුනෙහි නොමැතිව දේශනා පැවැත්වීම සම්බන්ධයෙන් පැනනැඟුනු ප්‍රශ්නයක් නිසා එක් දේශනා වාරයක් මඟ හැරුණි. ඒ බැව් සැළවූ විට. නොකඩවාම දේශනාමාලාව පැවැත්විය යුතු බවත්, තමන් වහන්සේට ඒ දෙසුම් පටිගත කළ පසුව වුවද ඇසිය හැකි බවත්, උන්වහන්සේ වදාළහ.

අප ගුරු දේවයන් වහන්සේගේ ඒ උදාර මුදිතා ගුණයට හා ධර්මකාමී ශාසන දයාවට නමස්කාර වේවා!

දෙසුම් 33 කින් පරිමිත මෙම දේශනා මාලාව පැවැත්වීමේදී අප අනුගමනය කළ විවරණ මාර්ගය අනුව හේතුසාධක වශයෙන් පෙළ අටුවා ආදියෙන් කොතෙකුත් උද්ධෘත පාඨ ගෙනහැර දැක්වීමට සිදුවිය. ඒ අනුව එක්තරා බුද්ධිගෝචර රටාවක් මෙහි දැකිය හැකි නමුදු අප පරමාර්ථය වූයේ සද්ධර්මයේ සජීව ප්‍රායෝගික පක්ෂය ඉස්මතු කර දීමමය. ඇතැම් විට හුදු බුද්ධිවාදයක අතරමං වී සිටින උගතුන් කිසියම් ධර්මප්‍රබෝධයක් තුළින් ප්‍රතිපදාව වෙතට යොමුකරවා ගැනීමට මේ විවරණ මාර්ගය උපකාරවත් විය හැකිය. කෙසේ හෝ වේවා, යමෙකුට ධර්මරසය විඳිමින්ම දෙසුමකට සවන්දිය හැකිවන අයුරින් විවිධ උපමා, උපමා කථා, නිදර්ශන ආදියෙන් දෙසුම් පෙළ පණපෙවීමට උත්සාහවත් වීමු. බුදු පියාණන් වහන්සේ වදාළ පරිදිම, "මෙහි ඇතැම් නුවණැති පුරුෂයෝ උපමාවෙකිනුදු දෙසුමෙක අරුත මැනැවින් වටහා ගනිත්".

අසන්නවුන්ගේ අවධානය නොවිසිරෙන අයුරින් මුතු ඇට පෙළක් නූලක අවුණන්නාක් මෙන් ධර්ම කාරණා සාධක සහිතව ගොනු කර දැක්වීම දේශනාවක් තුළ දී කළ හැකි පහසු කාර්යයක් නොවේ. එබැවින් එවැනි ගැටමුසු තැන්වලදී හේතුසාධක කීපයක් පමණක් දැක්වීමෙන් සෑහීමකට පත්වීමට සිදුවිය. එහිලා වඩාත් සවිස්තර විවරණ විග්‍රහ අප අතින් ලියැවී පළවූ ග්‍රන්ථ කීපයක ඇතුළත් වී ඇත.[1]

දෙසුම් පෙළ නිමකොට සත්වසරකට පසු "නිවනේ නිවීම" නමින් එළිදැක්වෙන මෙම ග්‍රන්ථයෙන් යම් ශාසනාර්ථයක් ඉටු වෙතොත් එයින් ජනිත කුශල සම්භාරය දෙසුම්පෙළට ඇරයුම් කොට වදාළ අප ගුරුදේවයන් වහන්සේ වූ මීතිරිගල නිස්සරණ වන සේනාසනාධිපතිව වැඩවිසූ අතිපූජනීය මහෝපාධ්‍යාය මාතර ශ්‍රී ඥානාරාම මාහිමිපාණන් වහන්සේ අනුමෝදන් වන සේක්වා! ඒ දුර්ලභ ගුරු ඇසුර ලබාගැනීමට මඟපෑදූ ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ සමුත්පාදක අතිපූජනීය පණ්ඩිත කඩවැද්දුවේ ශ්‍රී

---

1 * 1 Concept and Reality in Early Buddhist Thought - (1971)
* 2 Samyutta Nikaya - An Anthology Part II - (Wheel No. 183/185)
* 3 Ideal Solitude - Wheel No. 188
* 4 උත්තරීතර හුදෙකලාව - (දම්සක් අංක 172/173)
* 5 The Magic of the Mind - (1974)
6 Towards Calm and Insight-Printed for free distribution by J.Alwis
* Published by Buddhist Publication Society. P.O. Box 61, Kandy
බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය, තැ.පෙ. 61. මහනුවර

ජිනවංශ මාහිමිපාණන් වහන්සේටත් අතිපූජනීය නාඋයනේ අරියධම්ම මාහිමිපාණන් වහන්සේටත් මෙම ධර්මදානමය කුශලය හිමිවේවා!

පටිගත වූ දෙසුම් 33 පිටපත් කිරීමේ භාරදූර කාර්යය මහත් පරිශ්‍රමයකින් ඉටුකළ හපුරුදෙණියේ පියදස්සන හිමියන්ටද, සමීක්ෂණ ශුද්ධි ආදියෙන් පසුව එම අත්පිටපත මුද්‍රණය සඳහා සකස් කර දුන් පූජ්‍ය උඩර්රියගම ධම්මජීව, පූජ්‍ය මහයායේ ධම්ම සුනෙත්ත යන හිමිවරුන්ටද දෙසුම් පටිගත කිරීම් පිටපත් කිරීම් ආදී කටයුතුවලට සහායවූ හැමදෙනා වහන්සේලාටද මෙම ධර්මදානමය පින පරම ශාන්ත නිර්වාණාවබෝධය පිණිසම වේවා! එමෙන්ම, අවශ්‍ය අවස්ථාවලදී කැසට් පටි සපයාදීමෙන් හා ලිපි ද්‍රව්‍ය, ඡායා පිටපත් ලබාදීමෙන් අනුග්‍රහය දැක්වූ ඩඩ්ලි ප්‍රනාන්දු මහතා ප්‍රධාන ඩී. එච්. පී. මුණවීර සහ සමාගමේ කාර්යමණ්ඩලයටද අපගේ පුණ්‍යානුමෝදනාව හිමිවේ.

අමිලවූ ධර්මය මිල කිරීමකින් නොපිරිහෙළා ධර්මකාමීන් අතට පත්කිරීම අපගේ අභිලාෂය විය. එහෙත් විශාල ග්‍රන්ථයක් බවට පත්වන මෙම දෙසුම් පෙළ එක්වරම බොහෝදෙනෙකුන් අතට පත් කිරීමේ දුෂ්කරතාව වැටහුණෙන් දෙසුම් 3 බැගින් වෙළුම් 11ක් වශයෙන් එළි දැක්වීමට අදහස් කළෙමු. මේ අනුව යටත් පිරිසෙයින් දෙසුම් කිහිපයක් හෝ කියවීමට වැඩිදෙනෙකුට අවස්ථාව සැලසෙන අතරම ධර්මදානමය පුණ්‍ය කර්මයට බොහෝදෙනාගේ සහභාගිත්වයද ලැබෙනු ඇතැයි හඟිමු. එබැවින්, ග්‍රන්ථය තවමත් ශුද්ධිපත්‍ර අවස්ථාවේ පවතින නමුදු මෙසේ පළමු වෙළුම නිකුත් කිරීමට තීරණය කළෙමු. යථා කාලයේදී සම්පූර්ණ ග්‍රන්ථය පුස්තකාල මුද්‍රණයක් වශයෙන් අංග සම්පූර්ණව මුද්‍රණය කෙරෙනු ඇත. කෙසේ වෙතත්, 'නිවනේ නිවීම' වෙළුම් එකොළොසම පිළිවෙළින් එකතු කරගන්නා පාඨකයින්ගේ පහසුව තකා අවසන් වෙළුම සමග උපමා ඉඟිවැලක් හා ගාථා ඉඟිවැලක් ද සහිත 'පදයතුරක්' (අනුක්‍රමණිකාවක්) නිකුත් කිරීමට බලාපොරොත්තු වෙමු. එම පදයතුර සකස් කිරීමේදී අපට සහාය වූ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් උපාලි ජයනෙත්ති මහතාට ඒ පින නිවන් දොර ඇරෙන යතුරක්ම වේවායි පතමු.

ග්‍රන්ථ මුද්‍රණයෙහිලා මුද්‍රණාලය හා අවශ්‍ය සම්බන්ධීකරණය පිළිබඳ සම්පූර්ණ වගකීම භාරගෙන විශේෂ කැපවීමකින් ග්‍රන්ථය එළිදැක්වීමට කටයුතු කරන මහාභාරකාර තැන්පත් ය්‍ර. මාපා මහතාට මෙම ධර්මදානමය කුශලය ස්වකීය ධර්ම ප්‍රාර්ථනා ඉෂ්ට කරගැනීම පිණිස හේතුවාසනා වේවා! එසේම, වෙළුම් එකොළොසකින් නිමාවන ග්‍රන්ථයෙහි බරපැන, 'බර පැනයක්' නොවනු පිණිස 'ධර්මග්‍රන්ථ මුද්‍රණ භාරය' නමින් විශේෂ අරමුදලක් පිහිටුවීමෙන් පුරෝගාමීවූ පින්වත් ජී.ටී. බණ්ඩාර මහතාට එම ආදර්ශවත් පරිත්‍යාගයෙන් ජනිත කුශලය පරම ශාන්තවූ 'නිවනේ

නිවීම' පසක් කරගැනීමට උපනිශ්‍රය වේවායි ! යි පතමු. මුද්‍රණ භාරයේ තීරණාත්මක අවසාන අදියර සඳහා පූර්ණ සහයෝගය දෙන කරුණාරත්න සහ පුත්‍ර සමාගමේ කාර්ය මණ්ඩලයට ද අපගේ පුණ්‍යානුමෝදනාව හිමි විය යුතුව ඇත.

මෙයට
සසුන් ලැදි,
**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දෙගෙදර
දේවාලේගම

**(25 41) 1997 ජුලි 1**

# ප්‍රකාශක නිවේදනය

අතිපූජ්‍ය ඤාණනන්ද ස්වාමීන් වහන්සේගේ ඉතා අගනා දෙසුම් පෙළක්, මෙසේ කොටස් වශයෙන් මුද්‍රණය කොට, බුදුදහම පිළිබඳ නිරවුල් දැනුමක් ලබා ගැනීම පිණිස උනන්දු වන අය අතට පත් කිරීමට හැකිවීම ගැන මහත් සේ සතුටු වෙමි.

පටිගත කරන ලද දේශනවලට සවන් දීමෙන් පසු, එම දේශන කෙසේ හෝ මුද්‍රණය කොට ධර්ම දානයක් ලෙස බෙදාදීමේ අවශ්‍යතාව අපහට දැනුනි. එවැනිම උද්යෝගයකින් එම කාර්යය ඉටු කර ලීමට ජී.ටී. බණ්ඩාර මහතා අපගෙන් කිසිදු පෙළඹීමක් නොමැතිව, සිය කැමැත්තෙන්ම සැදැහැසිතින් ඉදිරිපත් වීම ධර්ම ශක්තිය විදහා පෑමක් මෙන් විය.

එම මහඟු පුණ්‍යකර්මය උදෙසා ඒ මහතා විසින් මහා භාරකාර දෙපාර්තමේන්තුවේ ඒ සඳහාම වූ විශේෂ අරමුදලක් "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් පිහිටුවන ලදී.

මෙවැනි උතුම් ශාසනික කටයුත්තක් සඳහා අනුග්‍රහය දැක්වූ ජී.ටී. බණ්ඩාර මහතාටත් ග්‍රන්ථය ඉතා ඕනෑකමින් මුද්‍රණය කොට එළි දැක්වීම පිණිස කටයුතු කළ මුද්‍රණ ශිල්පී කරුණාරත්න සහ පුත්‍ර සමාගමේ රවි කරුණාරත්න මහතාටත්, ශාසන චිරස්ථිතිය සඳහා තම ධනයත්, ශ්‍රමයත් වැය කිරීමෙන් ලැබෙන ප්‍රීතිය අපමණය.

'නිවනේ නිවීම' නමින් ප්‍රකාශයට පත් කෙරෙන මෙම දේශනා මාලාවේ ඉතිරි දේශන කොටස් වශයෙන් මුද්‍රණය කිරීම පිණිස දායකවීමට කැමති භවතුන්හට, ඒ සඳහා "ශ්‍රී ලංකාවේ මහා භාරකාර තැන" නමින් චෙක්පත් හෝ මුදල් ඇණවුම්, (මුදල් ඇණවුම් නම් ටොරින්ටන් චතුරශ්‍රය උප තැපැල් කාර්යාලයෙන් මාරු කරගත හැකි පරිදි) ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාර අරමුදලට බැර කිරීම පිණිස පහත සඳහන් ලිපිනයට එවිය හැකි බැව් කරුණාවෙන් දන්වා සිටිනු කැමැත්තෙමි.

යූ.මාපා<br>
ශ්‍රී ලංකාවේ මහා භාරකාර තැන

මහා භාරකාර දෙපාර්තමේන්තුව
තැ.පෙ. 548
2, බුලර්ස් පටුමග
කොළඹ 07.
(2541) 1997 ජුලි 1

# අමා ගඟ

මහවැලි ගඟ උතුරට හැරැවීමෙන් පසු එතෙක් නිසරු මුඩු බිම් ලෙස පැවති පෙදෙස්වල සිදුවූයේ ඉමහත් වෙනසෙකි. පිපාසයට පැන්බිඳක් නොලබා සිටි ගොවීහු පෙදෙස පුරා නිහඬව ගලා යන සිසිල් දිය දහරින් පිනා ගියහ. මැලවුනු ගොයම සරුව නිල්වන්ව කරලින් බර විය. මල් පලින් ගැවසීගත් තුරු-ලිය බලා සැනසෙන පෙදෙස් වැසියෝ තුටු කඳුළු වගුළහ.

දහම් අමා ගඟ "උතුරට" හැරැවීමේ වැඩ පිළිවෙළක් මෙයට තෙවසරකට පෙර ඇරඹුණි. දහම් පත-පොත තබා "එදා-වේල" සඳහා වත් විය පැහැදම් කිරීමට වත්-කමක් නැත්තෝ, නිහඬව නොමිලයේ ගලායන අමිල දහම් අමා දිය දහරින් සදහම් පිපාසය සන්සිඳුවා ගත්හ. අරිටු මිසදිටු හැර, සැදැහැයෙන් සරුව, ගුණ නුවණින් බරව පිළිවෙත් මඟට නැමී ගත්හ. ලොවී - ලොවුතුරු මල් පල නෙලා ගනිමින් හද පුරා පිරි බැතියෙන් නන් අයුරින් සොම්නස පළකළහ.

"ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් දියත් කළ මෙම ධර්මදාන වැඩපිළිවෙල සඳහා අපගෙන් වැයවුනේ පිරිසිදු ධර්මදාන සංකල්පය පමණි. අමාගඟ "උතුරට" හැරැවූවෝ සසුන් ගුණ හඳුනන පරිත්‍යාගශීලී සැදැහැවත්හුමය. "නිවනේ නිවීම" පොත් පෙළ එළි දැක්වීමෙන් නොනැවතී "පහන් කණුව ධර්මදේශනා" පොත් පෙළෙහි "බර පැන" දැරීමටත්, දෙස් - විදෙස්වල දහම් පිපාසිතයින් උදෙසා අප අතින් ලියැවෙන අනිකුත් පොත - පත ඒ අයුරින්ම එළි දැක්වීමටත් ඔවුහු උත්සුක වූහ. "දෙන දේ පිරිසිදුවම දීමේ" අදහසින් අමිල වූ දහම ඊට නිසි ශෝභන මුද්‍රණයකින්ම ධර්මකාමීන් අතට පත් කිරීමට පියවර ගත්හ. මුද්‍රිත පිටපත් සංඛ්‍යාව අවසන්වනු හා සමගම "නැවත මුද්‍රණ" පළකිරීමෙන් දහම් අමා ගඟ වියළී යා නොදීමට දැඩි අදිටනකින් ඇප කැපවූහ.

"පොත් අලෙවිය" පිළිබඳව මෙකල බහුලව දක්නට ලැබෙන වාණිජ සංකල්පයට පිටුපා, තහංචිවලින් තොරව, තමන් අතට නොමිලයේම පත් කැරෙන "දහම් පඬුර" තුළින් ධර්මදාන සංකල්පයෙහි අගය වටහා ගත් බොහෝ පාඨක පින්වත්හු තමන් ලද රස අහරක්, නෑ-හිතවතුන් සමග බෙදා-හදා ගන්නාක් මෙන් නොමසුරුව අන් දහම් ලැදියනටද දී ධර්ම දානයට සහභාගී වූහ. ඉනුදු නොනැවතී, ශක්ති පමණින් "ධර්ම ග්‍රන්ථ මුද්‍රණභාරයට" උරදීමටද ඉදිරිපත්වූහ, ඇතැමෙක් ලොකු කුඩා දහම් පොත් මුද්‍රණය කරවීමේ හා නැවත-නැවත මුද්‍රණය කරවීමේ බරපැන ඉසිලීමට පවා පසුබට නොවූහ.

සම්බුදු සසුන මේ ලක් පොළොවෙහි පවතින තාක් මේ දහම් අමාගඟ ලෝ සතුන් සිත් සනහමින් නොසිඳී ගලා යේවා යනු අපගේ පැතුමයි.

**"සබ්බදානං ධම්මදානං ජිනාති"**

මෙයට,
සසුන් ලැදි
**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර,
දේවාලේගම.
2000 ජුනි 05 (2544 පොසොන්)

## පුණ්‍යානුමෝදනාවයි.

මෙම ධර්ම ග්‍රන්ථය සදහම් පිපාසිතයින් අතට පත්කිරීම උදෙසා කාලය, ධනය, ශ්‍රමය ශාසන දයාවෙන් පරිත්‍යාග කළ සැම දෙනාටම අමිලවූ ධර්මය නොමිලයේ බෙදාදීමෙන් ජනිත කුශල ශක්තිය පරම ශාන්ත උතුම් නිර්වාණාවබෝධය පිණිස හේතුවාසනා වේවායි පතමු.

- සම්පාදක -

# ධම් ග්‍රන්ථ මුද්‍රණ භාරය

ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පළ කරනු ලබන "නිවනේ නිවීම" පොත් පෙළෙහි සයවැනි වෙළුම දක්වා මුද්‍රණය කිරීමේ සම්බන්ධීකරණය මෑතක් වනතුරු කරන ලද්දේ ශ්‍රී ලංකාවේ මහාභාරකාර තනතුර දැරූ යූ. මාපා මහතා විසිනි. ඉතා ගැඹුරු ධර්ම කරුණු සහිත එම වටිනා දහම් පොත් පෙල එළි දැක්වීමට හැකිවූයේ ඒ මහතාගේ අප්‍රතිහත ධෛර්යය නිසාමය.

මෙම පොත් පෙලෙහි හත්වැනි වෙළුම මුද්‍රණයට සකස් වෙමින් තිබෙන අවස්ථාවේදී මාපා මහතාට ශ්‍රී ලංකා ජනරජයේ තානාපති ලෙස මියන්මාර් (බුරුමය) දේශයට යෑමට සිදුවිය. ථෙරවාදී බුදු දහම නිර්මලව පවතින එවැනි දේශයකට පත් වී යෑම හුදෙක් ඒ මහතාගේ ශාසනික සේවයේ තවත් පියවරක් ලෙස දකිමු.

මාපා මහතා විසින් එසේ නික්ම යාමට පෙර, "නිවනේ නිවීම" සෙසු කාණ්ඩ මුද්‍රණය කිරීමේ කටයුතු කිසිදු බාධාවකින් තොරව කරගෙන යාම පිණිස, අති පූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද ස්වාමීන් වහන්සේගේ මෙම දේශනවල අගය දන්නා අප කීපදෙනෙක් මහාභාරකාර කාර්යාලය වෙත කැඳවා, ඒ පිළිබඳව වැඩ පිළිවෙලක් සකස් කරන ලදී. එම ක්‍රියා පිළිවෙල අනුව "නිවනේ නිවීම" දේශන මාලාව සහ ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පළකරනු ලබන "පහන් කණුව ධම් දේශනා" ග්‍රන්ථ එපරිද්දෙන්ම ඉදිරියේදී පළකෙරෙනු ඇත.

මෙම උතුම් ශාසනික සේවය ඉටු කිරීමට මාහට එම භාරයේ ස්ථාපක වශයෙන් මෙතැන් සිට වගකීම පැවරී තිබේ. එම මහඟු කාර්යය ඉෂට කරගැනීම පිණිස ඒ පිළිබඳව උනන්දුවක් දක්වන සියලුම බැතිමත් දායක දායිකාවන්ගේ අනුග්‍රහය අපි බලාපොරොත්තු වෙමු.

මෙම ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරයට එවනු ලබන ආධාර පහත සඳහන් ලිපිනයට ද එවිය හැක.

**ආධාර දෙන පින්වතුන්ගේ පහසුව තකා දැන් නුගේගොඩ සම්පත් බැංකු ශාඛාවෙහි "ධම් ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් ගිණුම් අංක 00036 0001415 දරණ ජංගම ගිණුමක් විවෘත කර ඇති බව සලකන්න.**

ජේ.ටී. බණ්ඩාර,
ස්ථාපක, ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය
රෝයල් ඉන්ස්ටිටියුට්, 191, හැව්ලොක් පාර,
කොළඹ 5.

1999 ඔක්තෝබර් 25 වැනි දින.

# ග්‍රන්ථ සංකේත නිරූපණය

මහා. - මහා වගග පාළි

දී.නි. - දීඝ නිකාය

ම.නි. - මජ්ඣිම නිකාය

සං.නි. - සංයුත්ත නිකාය

අං.නි. - අංගුත්තර නිකාය

ඛු.නි. - ඛුද්දක නිකාය

ධ.ප. - ධමමපද

උදා. - උදාන

ඉති. - ඉතිවුත්තක

සු.නි. - සුත්තනිපාත

ථෙර. - ථෙරගාථා

ථෙරී. - ථෙරීගාථා

මහානි. - මහා නිදෙදස

චූ.නි. - චූලල නිදෙදස

නෙත්ති - නෙත්තිපපකරණ

සු.වි. - සුමඞගලවිලාසිනී (දීඝ නිකාය අටුවාව)

ප.සූ. - පපඤ්චසූදනී (මජ්ඣිම නිකාය අටුවාව)

සා.ප. - සාරත්ථපපකාසිනී (සංයුත්ත නිකාය අටුවාව)

මනො. - මනොරථපූරණී (අංගුත්තර නිකාය අටුවාව)

ධ.අ. - ධම්මපදට්ඨ කථා

ප.ජෝ. - පරමත්ථජෝතිකා

ජා.අ. - ජාතකට්ඨකථා

ප.දී. - පරමත්ථදීපනී

වි.ම. - විසුදධිමගග

බු.ජ. - බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා

හේ.මු. - සයිමන් හේවාවිතාරණ මුද්‍රණය

# 19 වන දේශනය

# 19 වන දේශනය

**"නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස"**

''එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාර සමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං"

"මෙය ශාන්තය, මෙය ප්‍රණීතය, එනම් සියලු සංස්කාරයන්ගේ සංසිඳීම, සියලු උපධීන් අතහැර දැමීම, තණ්හාව ක්ෂය කිරීම, නොඇල්ම නම් වූ විරාගය, නැවැත්ම නම් වූ නිරෝධය, නිවීම නම්වූ නිබ්බානය."

**අති පූජනීය මහෝපාධ්‍යාය මාහිම්පාණන් වහන්සේ ප්‍රධාන ගරුතර යෝගාවචර මහාසංඝරත්නයෙන් අවසරයි. 'නිබ්බාන' යන මාතෘකාව යටතේ පවත්වනු ලබන දේශනා මාලාවේ දහනව වෙනි දේශනයයි මේ.**

'සඋපාදිසෙසා නිබ්බාන ධාතු' 'අනුපාදිසෙසා නිබ්බානධාතු' යන පද දෙක පිළිබඳ විවරණයක් අප පසුගිය දේශනය අගහරියේදී ආරම්භ කළා. ඉතිවුත්තක පාළියේ දුක නිපාතයෙන් උපුටා දැක්වූ සූත්‍රයකුයි අපි ඒකට මූලාශ්‍රය කරගත්තේ. ඒ එක්කම, සූත්‍රවලින්ම මතුකරගත් එක්තරා උපමාවක් ආශ්‍රයෙන් අපි පැහැදිලි කළා මේ කියන නිබ්බාන ධාතු දෙක ඇත්ත වශයෙන්ම 'නිබ්බාන' යන පදයෙන් කියැවෙන නිවීමෙහි අවස්ථා දෙකක් පෙන්නුම් කරන බව. බොහොම බලවත්ව දල්වෙමින් තිබුන ගින්නකට අමුතුවෙන් දර එකතු කිරීම නතර කළාම, ගිනිදැල් සංසිඳිලා, කලින් ගිනි ඇල්ලූ දර කෑලි පමණක් ගිනි අඟුරු වශයෙන් නිවෙමින් පවතිනව. යම්කිසි වෙලාවක් ගතවුනාට පස්සේ, ඒවත් නිවිල අඟුරු බවට පත්වෙනව. දැන් මේ රහතන් වහන්සේ පිළිබඳ තත්ත්වයෙදිත් අපට කියන්න වෙන්නෙ ඒ උපමාවයි. මේ උපමාව අනුවයි අපට තෝරගන්න වෙන්නෙ' සඋපාදිසෙසා නිබ්බානධාතු' අනුපාදිසෙසා නිබ්බාන ධාතු' කියන පද දෙක. රහතන්වහන්සේ ජීවමානව සිටියදී උපාදානයෙන් සිත මුදාගත් නිසා - උපාදාන කියල කියන්නෙ දරටමයි - මේ අමුතු උපාදානයන්ට හිත නොයොදන නිසා, රාග, ද්වේෂ, මෝහ ගිනිදැල් හටගන්නෙ නැහැ. ඒ සන්තානයෙ. නමුත් අර උපාදින්නවූ කය පරිහරණය කරන තාක්, මේ ශරීර කූඩුව පරිහරණය කරන තාක්, යම් යම් කායික දැවිලි - තැවිලි, මනාප - අමනාප, සැප-දුක් වින්දන ආදියට රහතන් වහන්සේ භාජනය වෙනව. ඒ කොයි අන්දමේ දේවල් ආවත් ඒ රහත් සිත නිවුන සිතක් රාග, දෙවිෂ, මෝහ ගිනිදැල් හට නොගන්න නිසා. අන්න ඒ අර්ථයෙන් රහතන්වහන්සේ ජීවමානව සිටියදී ඒ

තිබෙන තත්ත්වය - එදිනෙදා ජීවිතයේදී පංචේන්ද්‍රියන්ගෙන් අරමුණු ගන්නා අවස්ථාවල සිටින තත්ත්වය - සඋපාදිසෙස නිබ්බාන ධාතුවයි.

රහතන් වහන්සේගේ ජීවිතය කෙළවර වන අවස්ථාවෙදි මේ උපාදින්න කයත් අතහරින්න වෙනව. අන්න ඒ අවස්ථාවෙදි මේ කයෙන් ඒ සිත මුදාගැනීම් වශයෙන් තිබෙන අවස්ථාව තමයි, අනුපාදිසෙස පරිනිබ්බාන ධාතුවෙන් පිරිනිවන් පාන අවස්ථාව. ඒ උපාදින්නවූ කයත් අතහරිනව. මේ කාරණය කෙටියෙන් සඳහන් වන ගාථාවක් අර අපි කලිනුත් උපුටා දැක්වූ, අඞ්ගුත්තර නිකායෙ ඡක්ක නිපාතයෙ නාග සූත්‍රයෙ සඳහන් වෙනව.

'වීතරාගො වීතදොසො - වීතමොහො අනාසවො
සරීරං විජහං නාගො - පරිනිබ්බිස්සති අනාසවො'[1]

පහකළ රාගය, ද්වේෂය හා මෝහය ඇති, අනාශ්‍රව වූ රහතන් වහන්සේ (නාගො) 'සරීරං විජහං', ශරීරය අතහරිමින් අනාශ්‍රවව පිරිනිවන් පාන්නාහ' එතකොට සඋපාදිසෙස නිබ්බානධාතු අනුපාදිසෙස නිබ්බානධාතු කියන පද දෙක ඒ විදියට සැකෙවින් සලකාගත්තොත්, ඊට වඩා අමාරු ප්‍රශ්නයක් අපට ඉදිරිපත් වෙනව - මේ කියන නිබ්බානධාතු දෙක 'දිට්ඨධම්මික' වශයෙනුත් 'සම්පරායික' වශයෙනුත් හැඳින්වීමේ අර්ථය කුමක්ද කියන එක. දිට්ඨධම්මික' කියල කියන්නෙ 'මේ ජීවිතයට අදාළ, 'සම්පරායික' කියන්නේ 'මරණින් මතු'. සඋපාදිසෙස නිබ්බානධාතුව 'දිට්ඨධම්මික' හැටියටත් අනුපාදිසෙස නිබ්බානධාතුව 'සම්පරායික' - මරණින් මතු දෙයක් හැටියටත් දැක්වීමේ අදහස කුමක්ද? දැන් සාමාන්‍යයෙන් කර්මය ගැන කථා කරන කොට නම් දිට්ඨධම්මික සම්පරායික කියන පද දෙක බොහොම පහසුයි තේරුම් ගන්න. ඒ කියන්නෙ, මේ ජීවිතයේදී විඳින විඳීම්. ඒ කර්මවිපාක සම්බන්ධයෙන් එහෙමත් කියවෙනව. ඊළඟට මරණින් මතු විඳීම්. නමුත් මේ විධියටම තේරුම් ගත්තොත් නිබ්බානය පිළිබඳව, අපට නිගමනය කරන්ට වෙනව, ජීවත්ව සිටින අවස්ථාවෙ විඳින නිවන් සැපයකුත් මරණින් මතු විඳින නිවන් සැපයකුත්. නමුත් එහෙම නිගමනයක් ධර්මානුකූල වන්නෙ නැත්තෙ මක් නිසාද? බුදුරජාණන් වහන්සේ නිතරම අවධාරණය කරනව මේ නිවන පිළිබඳ ප්‍රත්‍යක්ෂය මේ ජීවිතයේදීම ලබන අංග සම්පූර්ණ ප්‍රත්‍යක්ෂයක් කියල. ආයි මරණින් මත්තට ඉතිරිවන්නේ නැහැ යමක් ප්‍රත්‍යක්ෂ කරගන්න. මේ ජීවිතයේදීම ලබන ප්‍රත්‍යක්ෂයක් හැටියටයි දිට්ඨෙව ධම්මෙ', 'සන්දිට්ඨික' 'අකාලික', ආදී පදවලින් නිතර අවධාරණය කෙරෙන්නෙ. මෙතෙන්දි අපට කියන්න වෙන්නෙ, මේ නිබ්බානය පිළිබඳව කථාකරනකොට දිට්ඨධම්මික සම්පරායික කියන පද තේරුම්

ගන්න වෙන්නෙ මේ ජීවිතයේදීම ලබන යම්කිසි අංගසම්පූර්ණ ප්‍රත්‍යක්‍ෂයක දෙඅංශයක් දක්වීමට මේ පද දෙක යොදාගෙන තිබෙන බවයි. මේ කාරණය අපට සැකෙවින් හඳුන්වන්න පුළුවන්. මේ ජීවිතයෙදි රහතන් වහන්සේ අත්දකින නිවීම මරණින් මත්තටත් තහවුරු බව නිසැකව දැනගැනීම තමයි- කල්තබාම නිසැකව දැනගැනීම තමයි- මේ අනුපාදිසෙස නිබ්බානධාතුව කියන එකෙන් හැඟෙන්නෙ. අපි දැන් කිව්ව, මරණින් මතු තත්ත්වයක් කොහොමද ප්‍රත්‍යක්‍ෂ කරගන්නෙ? එහෙම ප්‍රශ්නයක් කෙනෙකුට ඉබේම පැන නගිනව. අන්න ඒකට හොඳ පිළිතුරක් අපට හමුවෙනව මජ්ඣිම නිකායෙ ධාතුවිභංග සූත්‍රයේ එක්තරා ඡේදයක. බුදුරජාණන් වහන්සේ පුක්කුසාති ස්වාමීන්වහන්සේට ප්‍රකාශ කරන ඒ ධර්ම විග්‍රහවලින් එක කොටසක තිබෙනව මෙන්න මෙහෙම :-

> 'සෙය්‍යථාපි භික්ඛු තෙලඤ්ච පටිච්ච වට්ටිඤ්ච පටිච්ච තෙලපප්දීපො ඣායති තස්සෙව තෙලස්සච වට්ටියාච පරියාදානා අඤ්ඤස්ස ච අනුපාහාරා අනාහාරො නිබ්බායති, එවමෙව ඛො භික්ඛු කායපරියන්තිකං වෙදනං වෙදියමානො කායපරියන්තිකං වෙදනං වෙදියාමීති පජානාති. ජීවිතපරියන්තිකං වෙදනං වෙදියමානො ජීවිතපරියන්තිකං වෙදනං වෙදියාමීති පජානාති කායස්ස භෙදා උද්ධං ජීවිතපරියාදානා **ඉධෙව** සබ්බවෙදයිතානි අනභිනන්දිතානි **සීතිභවිස්සන්තීති පජානාති,** [2]

මේ ඡේදයේ තේරුම- මේ පුක්කුසාති ස්වාමීන්වහන්සේටයි ආමන්ත්‍රණය කෙරෙන්නෙ 'මහණ කියල - යම්සේ මහණ, තෙල්ද පහන්වැටියද නිසා තෙල් පහනක් දල්වෙයිද, ඒ තෙලෙහිද වැටියෙහිද අවසන් වීමෙන්, අනෙක් තෙල් වැටි ආදියක් නොලැබීම නිසා, ආහාර නැතිව ඒ තෙල් පහන නිවීයේද, එසේම යම්කිසි භික්‍ෂුවක් (විමුක්තවූ රහතන් වහන්සේ පිළිබඳවයි මේ කියන්නෙ) 'කායපරියන්තිකං වෙදනං වෙදියමානො' කය කෙළවර කොටගත් වේදනාවක් විඳින්නේ, කය කෙළවර කොටගත් වේදනාවක් විඳිමියි දැන ගනියි. දිවි කෙළවර කොටගත් වේදනාවක් විඳින්නේ (ජීවිතාන්තය පිළිබඳ මරණ වේදනාවක් විඳින්නේ) එබඳු වේදනාවක් විඳිමියි දැනගනියි. කය බිඳීයාමෙන් ජීවිතය කෙළවර වීමෙන් මත්තෙහි **'මෙහිදීම'** සියලු වේදයිතයෝ තෘෂ්ණා වශයෙන් සතුටු නොවන ලද්දාහු සිසිල් භාවයට **පැමිණෙන්නාහයි දැනගනී.** මෙන්න මෙතන 'දැනගනී' කියන වචනයෙ විශේෂයක් තියෙනව. ඒ වගේම අනාගත කාලික සිදුවීමකුයි මෙතන කියැවෙන්නෙ. අනාගත කාලික ක්‍රියාපදයක් එක්ක යොදල තියෙන්නෙ, මේක කලින්ම නිසැකව දැනගත්තු කාරණයක් නිසා. රහතන් වහන්සේ

මරණ අවස්ථාව එළඹෙන්නට කලින්ම දන්නව මේ සියලුම වේදයිතයන් සිසිල් වෙනව කියල. ඒ පිළිබඳව නිසැකයි. මේ නිසැක බව ලැබීමට හේතුව රහතන් වහන්සේ අර්හත්ඵල සමාධියේදීම මේ කියාපු සියලු වේදයිතයන්ගේ සිසිල්වීම පිළිබඳ ප්‍රත්‍යක්ෂය ලබන නිසයි. ඒක නිසා තමයි ඔය ථෙරගාථා ආදියෙ නිතර සඳහන් වෙන්නෙ, රහතන් වහන්සේ ඒ අර්හත්ඵල සමාධියේදි ලැබූ නිවන් සුවය පිළිබඳව 'සීතිභූතොස්මි නිබ්බුතො,[3] සිසිල්වූයේ වෙමි. නිවුනේ වෙමි.' එතකොට සියලු වේදයිතයන්ගේ සිසිල්භාවය, සිසිල්වීම පිළිබඳ ඒ ප්‍රත්‍යක්ෂය, මේ ජීවිතයේදීම ඒ රහතන්වහන්සේ ලබාගන්නව. අන්න ඒක නිසාම තමයි ඒ ප්‍රත්‍යක්ෂය සූත්‍රවල හඳුන්වල තියෙන්නෙ 'අනුපාදා පරිනිබ්බාන,[4] කියන නමින්. දැන් මෙතන එක පාරටම වෙනසක් පෙනෙනව. අපි කථාකරන්ට පටන් ගත්තෙ 'අනුපාදිසෙස' පරිනිබ්බානය ගැන දැන් මෙතන කියැවෙනව 'අනුපාදා පරිනිබ්බාන'. අනුපාදිසෙස පරිනිබ්බානය තියෙන්නෙ රහතන්වහන්සෙගෙ ජීවිතය කෙළවරවන අවසථාවෙදි, අර උපාදින්නවූ කය සම්පූර්ණයෙන්ම අතහරින අවස්ථාවෙදි. නමුත්, අනුපාදා පරිනිබ්බානය' කියන්නෙ අර්හත්ඵල සමාධියමයි. ඒකට නොයෙකුත් වචන අපට පහුගිය දේශනවලදි හමුවුන. 'අනුපාදා විමොක්ඛො' කියලත් කියනව. ඉතින් මෙතන 'අනුපාදා' පරිනිබ්බාන'. එතකොට පරිනිබ්බාන' යන වචනයම මෙතන 'අනුපාදා' යන්නට ඇඳල තියෙනව. ඒ කියන්නෙ උපාදානයන්ගෙන් තොර පිරිනිවීම මේ ජීවිතයෙදිම ප්‍රත්‍යක්ෂ කරගන්නව රහතන්වහන්සේ, ඒ අරහත්ඵල සමාධියේදි. ඒ නිසා තමයි ඔය රථවිනීත සූත්‍රයෙ එහෙම සැරියුත් ස්වාමීන්වහන්සෙ පූර්ණ මන්තානිපුත්ත ස්වාමීන් වහන්සේගෙන් අහන්නෙ 'කුමක් සඳහාද භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර වස් වසන්නෙ' කියල. ඒ අවස්ථාවෙ පූර්ණ මන්තානිපුත්ත ස්වාමීන්වහන්සේ දෙන පිළිතුර 'අනුපාදා පරිනිබ්බානය සඳහායි මේ බ්‍රහ්මචර්යාව වාසය කරන්නෙ භාග්‍යවතුන් වහන්සේ වෙත. එයින් හැඟෙන්නෙ නැහැ ජීවිතය කෙළවර කරගන්නව කියන එක. මෙතන කියන්නෙ නිර්වාණ අවබෝධයමයයි, නිර්වාණ ප්‍රත්‍යක්ෂයමයි. එතකොට මේ 'අනුපාදා පරිනිබ්බාන' කියන්නෙ ජීවිත කාලය තුළදීම රහතන්වහන්සේ ලබන අර්හත්ඵල සමාධියෙන් අර වේදයිතයන් සිසිල්කරගැනීම පිළිබඳ ප්‍රත්‍යක්ෂයයි. ඒකම හඳුන්වනව සමහර තැන්වල 'නිරුපධි' කියන වචනයෙනුත්. මෙන්න මෙතනත් තිබෙනව පොඩි ගැටළුවක්. මොකක්ද? පසුකාලයකදි ව්‍යවහාරයට ඇවිල්ල තියෙනව 'නිරුපධිසෙස' කියන පදයක්. ඒක අර 'අනුපාදිසෙස' කියන වචනය බලාගෙන හදාගත්තු එකක් වගෙයි පේන්නේ. මක්නිසාද? සූත්‍රවල කොතැනකවත් සඳහන් වෙන්නෙ නැහැ 'නිරුපධිසෙස පරිනිබ්බාන' කියල එකක්. සඳහන් වෙන්නෙ 'නිරුපධි'

'නිරුපධිං'[6] 'නිරුපධි ධම්මං'[7] ආදි වශයෙනුයි, ඒ අර කියාපු අර්හත්ඵල සමාධියමයි. කලින් අවස්ථාවකත් අපට හමුවුනා ගාථාවක් :-

**'කායෙන අමතං ධාතුං - ඵුසයිත්වා නිරූපධිං**
**උපධි පටිනිස්සග්ගං - සච්ඡිකත්වා අනාසවො**
**දෙසෙති සම්මාසම්බුද්ධො - අසොකං විරජං පදං'[8]**

'කයින් මේ නිරුපධි නම් වූ අමෘතධාතුව ස්පර්ශ කරල, සියලු උපධීන් අතහැර දැමීම ප්‍රත්‍යක්ෂ කරගෙන, බුදුරජාණන් වහන්සේ ඒ නිඃශෝකීවූ නිර්වාණය පිළිබඳව දේශනා කරනව, කියල. එතකොට එහෙම දේශනා කරන්න නම් ජීවත්ව ඉන්න ඕන නේ. එයින් පේනව මේ 'නිරුපධි' නියන එක යොදල තියෙන්නෙ සූත්‍රවල, අර්හත්ඵල සමාධියටම බව. 'අනුපාදා පරිනිබ්බාන' 'අනුපාදා විමොක්ඛ' 'නිරුපධි' ආදි පදවලින් හැඳින්වෙන්නෙ ඒ කියාපු වේදයිතයන්ගේ සිසිල්භාවය පිළිබඳ පැහැදිලි ප්‍රත්‍යක්ෂයයි. ඒක තවත් හොඳට පැහැදිලි වෙනව සංයුත්ත නිකායෙ වෙදනා සංයුත්තයෙ. බොහෝ අවස්ථාවල නිබ්බානය එක් එක් ශීර්ෂය යටතේ ඉදිරිපත් කරනව. වේදනා ශීර්ෂයෙන් ඉදිරිපත් කරනව අර වෙදනා සංයුත්තයෙ. එතනත් කියැවෙනව මෙහෙම :-

'සමාහිතො සම්පජානො - සතො බුද්ධස්ස සාවකො
වෙදනා ච පජානාති - වෙදනානඤ්ච සම්භවං
යත්ථ චෙතා නිරුජ්ඣන්ති - මග්ගඤ්ච ඛයගාමිනං
වෙදනානං ඛයා භික්ඛු - නිච්ඡාතො පරිනිබ්බුතො'[9]

ඒ කියන්නෙ, රහතන් වහන්සේගේ ඒ අර්හත්වය සම්බන්ධ අවබෝධය වේදනා ශීර්ෂයෙන් ඉදිරිපත් කරනව. වේදනා ශීර්ෂයෙන් ඉදිරිපත් කරනව කියන්නෙ වේදනාවට මුල්තැන දීලයි ඒ අර්හත් ඵල සමාධිය මෙතෙන්දි විස්තර කෙරෙන්නෙ. 'සමාහිතො සම්පජානො සතො බුද්ධස්ස සාවකො' 'සමාධිමත් වූ සති සම්පජඤ්ඤයෙන් යුක්තවූ, ඒ බුද්ධශ්‍රාවක තෙම, 'වෙදනා ච පජානාති' වේදනාවන් දැනගන්නව, වේදනාවන්ගේ ස්වභාවය පිළිබඳ සම්පූර්ණ පරිඤ්ඤාව ලබාගන්නව. 'වෙදනානඤ්ච සම්භවං' වේදනාවන්ගේ ප්‍රභවයත් තේරුම් ගන්නව - ඒව හටගන්න ආකාරය. ඊළඟට, 'යත්ථ චෙතා නිරුජ්ඣන්ති', යම් තැනක වේදනාවන් නිරුද්ධ වෙනවද - ඒ කියන්නෙ අර අවේදයිත සුඛය වන නිර්වාණය- එතනින් කියැවෙන්නෙ නිබ්බානයයි. 'මග්ගඤ්ච ඛයගාමිනං' ඒ වේදනාවන්ගේ ක්ෂයවීම පිළිබඳ-

ඒ ක්‍ෂයවීම කරා යන- මාර්ගයත්, මෙන්න මේ හැම එකක්ම අවබෝධ කරගන්නවයි කියන එකයි. ඊළඟට වෙදනානං ඛයා භික්ඛු නිච්ඡාතො පරිනිබ්බුතො' - ඒ වේදනාවන්ගේ ක්‍ෂය කිරීම නිසා ඒ රහතන්වහන්සේ, 'නිච්ඡාතො' තෘෂ්ණාව කියන කුසගින්න නැතිව, 'පිරිනිවීමට පත්වෙනව'. මෙතන පරිනිබ්බුතො කියන්නෙ මරණය නොවෙයි. ඉතින් මෙයින් අපට පෙනෙනව 'පරිනිබ්බුත' කියන වචනය සූත්‍රවල යෙදිල තියෙන බව ජීවමාන රහතන් වහන්සේ පිළිබඳවත්. පසුකාලීන අටුවාවල යම්කිසි විශේෂයක් පෙන්නුම් කරනව ජීවමානව සිටියදී රහතන් වහන්සේට සිදුවන්නේ කිලෙස පරිනිබ්බානයය මරණ අවස්ථාවෙදි - පිරිනිවන් පානව කියන එක දැන් කාලේ යොදන අවස්ථාවෙදි - සිදුවන්නෙ ඛන්ධ පරිනිබ්බානයය කියල. නමුත් එහෙම වෙනසක් සූත්‍රවල යෙදිල නැහැ. අර විධියට වෙනසක් කරන්න සිද්ධ උනෙ 'පරිනිබ්බාන' කියන වචනයෙ මූලික අර්ථය ටික ටික ගෙවීයන්න පටන්ගත්තු නිසයි. මේක සිත පිළිබඳ තත්ත්වයක් බව- පිරිනිවීම කියන එක සිත පිළිබඳ තත්ත්වයක් බව - කල්යාමේදී යටපත්වුන බවයි පෙනෙන්නෙ. ඒක නිසා දැන් මේ කාලයේ 'පරිනිබ්බාන' කියන වචනය ඇහෙනවත් එක්කම, එකපාරටම මතක් වෙන්නෙ බුදුරජාණන් වහන්සේගේ හෝ රහතන්වහන්සේගේ අවසාන අවස්ථාවයි. ඔන්න ඔහොම තත්ත්වයක් තියෙනව. නමුත් සූත්‍රවල අර පිරිනිවීම රහතන් වහන්සේ අර්හත් ඵල සමාධියෙදි පැහැදිලිවම ලබන ප්‍රත්‍යක්‍ෂයක්. අන්න ඒක නිසා තමයි අපි අර ධාතුවිභංග සූත්‍රයෙන් උපුටා දැක්වූ ඡේදයේ සඳහන් වෙන්නෙ: 'තස්ස ඉධෙව සබ්බවෙදයිතානි සීතිභවිස්සන්තීති පජානාති' - සියලු වේදයිතයෝ මෙහිදීම සිසිල්වන්නාහ කියල දැනගන්නව. ඒ ඥානය තිබෙනව. ඒ දැන ගැනීමම තමයි එතන වැදගත් වන්නෙ. ඒ කියන්නෙ, නිසැකවෙනව 'මරණ අවස්ථාවෙදි මට පුළුවන් මෙන්න මේ විධියට වේදනාවන්ගේ සීතිභාවය පිළිබඳ ප්‍රත්‍යක්‍ෂයක් මගින් මාරයා පරද්දන්න' කියල. ඒ වගේම, 'ජීවිත පරියන්තිකං වෙදනං' කියල අර ඡේදයෙ සඳහන් වුනෙ මේ කියාපු මේ මරණ වේදනාවෙදි මේක ඉදිරිපත් කරගන්න පුළුවන් බවයි. 'ජීවිත පරියන්තික' වේදනාව ආවත් - ජීවිතය කෙළවර වන අවස්ථාවෙ මරණවේදනාව ආවත් - ඒ අවස්ථාවෙදි රහතන් වහන්සෙ ඉදිරිපත් කරගන්නෙ මෙන්න මේ අරහත්ඵල සමාධියයි. අන්න ඒ අර්ථයෙන් තමයි මේකට, අකුප්පා චෙතොවිමුත්ති' කියන්නෙ. අපට කීප අවස්ථාවක මේක ගැන විස්තර කරන්න සිද්ධ වුනා. 'අකුප්පා චෙතොවිමුත්ති' කියන්නෙ චංචල නොවන, සසල නොවන, කම්පා නොවන විදියෙ චෙතො විමුත්තියක්. අනෙකුත් ලෞකික චෙතොවිමුත්ති හැම එකක්ම කම්පා වෙනව මරණ වේදනාව හමුවෙ - බරපතලම වේදනාව. නමුත් මේ 'අකුප්පා චෙතොවිමුත්තිය'

අරහත්ඵල සමාධියෙදි ලබන ඒ නිර්වාණ ප්‍රත්‍යක්‍ෂය, වේදනාවන්ගේ සීතිභාවය පිළිබඳ ප්‍රත්‍යක්‍ෂය, ඒක කම්පාවෙන්නෙ නැහැ. ඒ අකුප්පා චෙතො විමුත්තිය තමයි, රහතන් වහන්සේලා, බුදුරජාණන්වහන්සෙ එහෙම, ජීවිතය කෙළවර වන අවසථාවෙදි ඉදිරිපත් කරගන්නෙ. මාරයා උදුරගන්න එන අවස්ථාවෙදි ඉදිරිපත් කරගන්නෙ ඒකයි. දැන් එතකොට අපට මතක් කරගන්න පුළුවනි, අපි අර ඉතිවුත්තකයෙන් උපුටා දැක්වූ ඒ දීඝි සූත්‍රයේ අග ගාථාව :-

'යෙ එතදඤ්ඤාය පදං අසංඛතං
විමුත්තචිත්තා භවනෙත්ති සංඛයා
තෙ ධම්මසාරාධිගමා ඛයෙ රතා
පහංසු තෙ සබ්බභවානි තාදිනො'

ඒ ගාථාවෙ අර්ථය - මේක සමහර කෙනෙකුට ටිකක් ගැටලුවක් වෙන්න පුලුවන් විධියෙ ගාථාවක්, ඒ මොකද නිර්වාණ ධාතු දෙක පිළිබඳව සඳහන් ඡේදයක අගටම එන ගාථාව මේකයි. 'යෙ එතදඤ්ඤාය පදං අසංඛතං' 'යම්කෙනෙක් මේ අසංඛත පදය පිළිබඳව හරියට තේරුම් අරගෙන', 'විමුත්තචිත්තා භවනෙත්තිසංඛයා' - 'භවනෙත්ති නම් වූ තෘෂ්ණාව ක්‍ෂය කිරීමෙන් විමුක්ත සිත් ඇත්තාහු'. අන්න එතනින් ඒ කියැවෙන්නෙ සඋපාදිසෙස නිබ්බානධාතුවයි. එකම ගාථාවෙ දෙවන පදයෙන් කියැවෙන්නෙ සඋපාදිසෙස නිබ්බානධාතුවයි. ඊළඟ පද දෙකේ තියෙන්නෙ: 'තෙ ධම්මසාරාධිගමා ඛයෙ රතා' 'ධම්මසාර' කියන එක - අටුවාවෙ පවා ඒක පිළිගන්නව - 'ධම්මසාර' කියල කියන්නෙ අකුප්පා චෙතොවිමුත්තියයි. අපි මේ කථාකළ අකුප්පා චෙතොවිමුත්තිය තමයි, මුළුමහත් ධර්මයේම සාරය, හරය. ඒ නිසා ඒකට 'ධම්මසාර' කියල කියනව. 'තෙ ධම්මසාරාධිගමා' - මේ ධර්මසාරය ලබාගැනීම නිසාම, මේ අකුප්පාචෙතො විමුත්තිය ලබාගැනීම නිසාම - 'ඛයෙ රතා', මෙතන මේ ක්‍ෂය කියල කියන්නේ, වේදනාක්‍ෂය. 'වෙදනානං ඛයා භික්ඛු නිච්ඡාතො පරිනිබ්බුතො' කියල අපි දැන් ටිකකට කලින් ප්‍රකාශ කළ ඒ වේදනාවන්ගේ ක්‍ෂයයයි මෙතන මේ 'ඛය' කියන වචනයෙන් තේරුම් ගන්න ඕනෙ. එතකොට අර අකුප්පා චෙතො විමුත්තිය ලබා ගැනීම නිසා, ඒ වගේම, 'ඛයෙ රතා වේදනාවන්ගේ ක්‍ෂය පිළිබඳව ඇල්ම ඇත්තාහු, 'පහංසු තෙ සබ්බභවානි තාදිනො' ඒ පදයෙන් තමයි ඒ සූත්‍රය ඉවර වෙන්නෙ - ඒ තාදීවූ ස්ථිරසාර ගුණ ඇති රහතන්වහන්සේලා, 'පහංසු තෙ සබ්බභවානි' සියලුම භවයන් අතහැරියාහ. ඒ කියන්නෙ භව නිරෝධයයි. ඒ කියන්නෙ රහතන්වහන්සේ භව නිරෝධ ප්‍රත්‍යක්‍ෂය මෙලොවදීම ලබාගත්තා කියන එකයි. අර්හත් ඵල සමාධිය නොයෙකුත් නම් වලින් හඳුන්වන්න පුළුවන්. 'භව නිරොධො

නිබ්බානං' කියන ඒ හැඳින්වීම අනුව, භව නිරෝධය පිළිබඳ ප්‍රත්‍යක්‍ෂයයි. ඒ භව නිරෝධයම තමයි 'අසංඛත' ධාතුව. අසංඛත කියල කියන්නෙත් ඒකමයි. භවය 'සංඛත' නම් භව නිරෝධය අසංඛතයි. ඔතැනයි ඕකෙ වෙනස තියෙන්නෙ. එතකොට මේ එකම අසංඛත ධාතුවෙ දෙපැත්තක්. මෙතනින් අපට පේනව මේ එකම අසංඛත ධාතුවෙ දෙපැත්තක් තමයි 'සඋපාදිසෙස පරිනිබ්බාන ධාතු' අනුපාදිසෙස පරිනිබ්බානධාතු කියල කිව්වෙ. සඋපාදිසෙස අවස්ථාවෙදි සිත විමුක්තයි. විමුක්ත සිත නිසා රාග, ද්වේෂ, මෝහ ගිනිදැල් පැන නගින්නෙ නැහැ. ගිනි අඟුරු තිබුනට ගිනිදැල් පැන නගින්නෙ නැහැ. මක්නිසාද? අමුතු උපාදාන - දර - එකතුවීමක් නැති නිසා. ඊළඟට, මේව එහෙම පිටින්ම නිවුන අවස්ථාව ගැන කියන කොට තමයි අර අනුපාදිසෙස කියල කියන්නෙ. නමුත් ඒ අවස්ථාව ගැනත් - එතන 'පරිනිබ්බාන' කියන වචනයෙදි ගන්න තියෙන්නෙ, ඒ මරණ අවස්ථාව එනවිට රහතන් වහන්සේල - මාරය එනකොටම - මේ දිවයිනටයි ගොඩ බහින්නෙ. මේ අකුප්පා චෙතොවිමුත්තියට හිත යොමු කරනව.

මේකට හොඳම නිදසුන - අපි ඉස්සෙල්ලම පටන් ගනිමු බුදුරජාණන් වහන්සේගෙන් - බුදුරජාණන් වහන්සේ මරණයට මුහුණ දුන් ආකාරය හොඳ ලස්සනට ප්‍රකාශ කරනව අනුරුද්ධ ස්වාමීන්වහන්සේ, මහා පරිනිබ්බාන සූත්‍රයෙ:

**1. නාහු අස්සාස පස්සාසො - ඨිත චිත්තස්ස තාදිනො**
**අනෙජො සන්තිමාරබ්භ - යං කාලමකරී මුනි**

**2. අසල්ලීනෙන චිත්තෙන - වෙදනං අජ්ඣවාසයි**
**පජ්ජොතස්සෙව නිබ්බානං - විමොක්ඛො චෙතසො අහු**[10]

අනුරුද්ධ ස්වාමීන්වහන්සේ බුදුරජාණන්වහන්සේ පිරිනිවන් පෑ ආකාරය මේ ගාථා දෙකෙන් ප්‍රකාශ කරනව. 'නාහු අස්සාස පස්සාසො ඨිතචිත්තස්ස තාදිනො, - අනෙජො සන්තිමාරබ්භ යං කාලමකරී මුනි' - එජා' නම් වූ තෘෂ්ණාවෙන් තොරවූ ඒ බුද්ධ මුනිවරයා යම් ශාන්තියක් මුල්කොට ගෙන කාලක්‍රියා කළේද? ඒ තාදීවූ, ස්ථිර සිත් ඇති ඒ බුදුරජාණන් වහන්සේගේ ආශ්වාස ප්‍රශ්වාස නතර විය.' ඒකයි මුල් ගාථාවෙ අදහස.

ඊළඟට දෙවෙනි ගාථාවෙ අදහස: 'අසල්ලීනෙන චිත්තෙන වෙදනං අජ්ඣවාසයි' - 'අසල්ලීනෙන' කියන්නෙ ' නොසැඟවුන' - නොසැඟවුන සිතින් වේදනාව දරාගත් සේක. 'පජ්ජොතස්සෙව නිබ්බානං - විමොක්ඛො

චෙතසො අහු'. පන්දමක නිවීයාම මෙන් සිතෙහි විමුක්තිය විය. මෙතන කියැවෙන්නෙ **සිතෙහි විමුක්තිය**. මෙතනින් එතකොට පෙන්නුම් කරන්නෙ බුදුරජාණන්වහන්සේ පිරිනිවන් පෑ හැටි. දැන්, මේ ගාථාවෙ තිබෙන ගැඹුර ඇත්ත වශයෙන්ම ඉතාමත්ම විශාලයි. නමුත් මේ පිළිබඳව අටුවාවෙ දෙන විග්‍රහයෙදි එක්තරා පටලැවිල්ලක්, ව්‍යාකූලත්වයක්, සිදුඋන බවයි පෙනෙන්නෙ. මක්නිසාද, අර පළමුවෙනි ගාථාවේ සඳහන් වෙනවනෙ 'අනෙජො සන්තිමාරබ්භ යං කාලමකරී මුනි, කියන එක. එතන 'යං සන්තිං ආරබ්භ බුද්ධ මුනි කාලං අකරි' කියන එකක් කියැවෙනව. ඒ කියන්නෙ, යම් ශාන්තියක් අරභයා බුද්ධමුනිවරයා කාලක්‍රියා කළේද' යන්නයි. මේකෙදි අටුවාවෙ තෝරන්නෙ 'බුද්ධ මුනි සන්තිං ගමිස්සාමීති සන්තිං ආරබ්භ කාලමකරි' කියල, ඒ කියන්නෙ. බුද්ධ මුනිවරයා ශාන්තියට යන්නෙමියි යන අදහසින්, ශාන්තිය අරභයා කාලක්‍රියා කළේය. දැන් මෙතන එක්තරා ක්‍රම විරෝධී බවක් පෙනෙනව. මක්නිසාද? මේ ආරබ්භ' කියන වචනය අටුවාචාරීන් වහන්සේලම යොදල තියෙන්නෙ 'සඳහා' කියන අර්ථයෙන් නොවෙයි. දැන් මෙතන මේ අටුවාව අරගෙන තියෙන හැටියට ශාන්තියට යෑම සඳහායි බුදුරජාණන්වහන්සේ කාලක්‍රියා කළේ. එහෙම ගත්තොත් අර 'ආරබ්භ' කියන එක යොදල තියෙන්නෙ 'සඳහා' කියන අර්ථයෙන්. නමුත් අටුවාචාරීන් වහන්සේලාම ජාතකට්ඨකථා ධම්මපදට්ඨකථා ආදී අටුවාවල, ඔය 'ආරබ්භ' කියන පද බොහෝවිට යොදන්නෙ - නිදානකථා පිළිබඳව - යම්කිසි කෙනෙකු 'අරභයා' කියල කීමෙදි, යම්කිසි කෙනෙකු සඳහා නොවෙයි. දැන් අපි හිතමු දෙව්දත් තෙරුන් අරභයා බුදුරජාණන් වහන්සේ ධර්ම දේශනාවක් කළයි කියල. එහෙම සඳහන් වෙන තැනක් ගැන. ඒ කියන්නෙ ඒක දෙව්දත් තෙරුන් **සඳහා** දේශනා කළ එකක් නොවෙයි. දෙව්දත් තෙරුන් ඒ පිරිසෙවත් නැහැ. සමහරවිට දෙව්දත් තෙරුන්වහන්සේ අපවත් වෙලත් ඉවරයි. එතැනින් කියැවෙන්නෙ දෙව්දත් තෙරුන් මුල්කොට, එහෙම නැත්නම් යම්කිසි කෙනෙකු හෝ යම්කිසි කාරණයක් මුල්කොට දේශනා කළා' කියන එකයි. ඉතින් එහෙම ගත්තොත් අපට මේ ගාථාව තෝරන්න වෙන්නෙ, සූත්‍රයේ අර්ථයට අනුකූල වෙන්න නම්, 'බුද්ධ මුනිවරයා ශාන්තියට යන්නෙමියි කාලක්‍රියා කළේය' කියන එක නොවෙයි. 'බුද්ධ මුනිවරයා කාලක්‍රියා කරන්නෙමියි ශාන්තියට සිත යෙදීය කියලයි අපට ගන්න වෙන්නෙ. අටුවාවට අනුව **කාලක්‍රියාව** මුලට **ශාන්තිය පසුවට**, නමුත් සූත්‍රාර්ථයට අනුව අපට පෙනෙන්නෙ **ශාන්තිය** මුලට **කාලක්‍රියාව පසුවට**. මෙතන ලොකු ගැඹුරු වෙනසක් පෙනෙනව. මක්නිසාද? අටුවාව තෝරන ආකාරයෙන් ගත්තොත්, බුදුරජාණන් වහන්සේ කාලක්‍රියා කළේ අර නිර්වාණධාතුවට එකතු වෙන්න. ඒ අර්ථය තමයි

අටුවාවල බොහෝ තැන්වල මතුවෙන්නෙ. ධර්මානුකූලව නොකිය බැරි තැන්වල කියනව, නමුත් බොහෝ අවස්ථාවල එක්තරා විධියක ශාස්වත වාදයකට නැඹුරුවන අන්දමේ සදාකාලික නිර්වාණයක් පිළිබඳ අදහසක් මතුවන විදියෙ ප්‍රකාශන අටුවාවල සඳහන් වෙනව. දැන් මෙතනත් ඒ විධියටයි 'ආරබ්භ' කියන එක තෝරල තියෙන්නෙ. 'ශාන්තියට යන්නෙමියි කාලක්‍රියා කළේය'. නමුත් අපි මෙතෙක් තේරුවේ 'කාලක්‍රියා කරන්නෙමියි ශාන්තියට සිත යෙදීය' කියල. කාලක්‍රියා කරන අවස්ථාව එනකොට අර ශාන්තිය **ඉදිරිපත් කරගන්නව**, ශාන්තිය **මුල් කරගන්නව. පෙරටු කරගන්නව.** ඒක පෙරටු කළාම මාරයගේ බල බිඳිල. මක්නිසාද? අර වේදනාවන්ගේ සීතිභාවය ලබා ගන්න නිසා. මෙයින් අපට පේනව අකුප්පා චෙතො විමුත්තියෙ වටිනාකම. අර්හත්ඵල සමාධිය ඇත්තවශයෙන්ම මෙලොවදීම නිසැකවම ලබන ප්‍රත්‍යක්ෂයක්. මෙන්න මේ ප්‍රත්‍යක්ෂය තමයි බුදුරජාණන්වහන්සේ, ඒ වගේම රහතන් වහන්සේල, ඉදිරිපත් කරගන්නෙ මාරය පරද්දන්න. ඒක නිසාම තමයි, **'තාණං' 'ලෙනං' 'දීපං' 'සරණං' 'පරායණං' 'ඛෙමං' 'අමතං'** ආදි පද රාශියක්ම මේ නිර්වාණයට' යොදල තියෙන්නෙ. ඒ කියන්නෙ, මරණ වේදනාව, හමුවෙ මරණය හමුවෙ, කෙනෙකුට, 'තාණං' - ආරක්ෂාව වශයෙන් හිටින්නෙ, 'දීපං' - ගොඩවෙන්නෙ පුළුවන් දිවයින, ලෙනං' - ඇතුල් වෙන්න පුළුවන් ලෙන, 'සරණං' - 'පරායණං' - 'පිහිට', 'ඛෙමං' - ආරක්ෂා සහිත තැන. 'අමතං' අමෘතත්වය කියල කියන්නෙත් මෙන්න මේ අර්ථයෙන්. මෙ **අමෘතත්වය** බුදුරජාණන් වහන්සේල, රහතන් වහන්සේල, **මෙලොවදීම ලබන ප්‍රත්‍යක්ෂයක්.** ඒ ප්‍රත්‍යක්ෂයම තමයි අර මරණ අවස්ථාවෙ ඉදිරිපත් කරගන්නෙ.

දැන් මේ බුදුරජාණන් වහන්සේගෙ පිරිනිවන් පෑම පිළිබඳව ප්‍රකාශ කළ ගාථාවක අනුරුද්ධ ස්වාමීන් වහන්සේ මේ කාලක්‍රියා කිරීම කියන වචනයක් යොදාගත්තෙ මොකද කියන එකත් අපට කල්පනා කරන්න සිද්ධ වෙනව. 'කාලං අකරි'. මේක මේ සාමාන්‍ය ජනයා පිළිබඳව යොදන වචනයක්, කාලක්‍රියා කළයි කියන එක. ඇයි මේ වචනය මෙතන යෙදිල තියෙන්නෙ? **අර සිත පිළිබඳ විමුක්තිය-** 'විමොක්ඛො චෙතසො අහු' කියල කියන සිත පිළිබඳ විමුක්තිය- **මේ මරණය පිළිබඳ අදහසින් වෙන්කර දක්වීමටයි.** අනිත් අයට වගේම මේ ශරීරයෙන් වෙන් වීමක් සිද්ධ වෙනව රහතන් වහන්සේලාට. අන්න ඒ අදහසට තමයි මේ 'කාලං අකරි' කාලක්‍රියා කළා' කියල යොදල තියෙන්නෙ. ඇත්ත වශයෙන්ම බුදුරජාණන් වහන්සේයි රහතන්වහන්සේලායි පමණයි මේ කාලක්‍රියාව කාල ක්‍රියාවක් හැටියට කරන්නෙ. හරියට කාලය ආවම ඒකට කළයුතු ක්‍රියාවක් හැටියට කරන්නෙ. අනිත් අය ඒකට බයයි. ඒකට කැමති නැහැ. එයින් ගැලවෙන්න බලනව. බුදුරජාණන්

වහන්සේත් රහතන් වහන්සේලත් පමණමයි කාලක්‍රියාව කාලක්‍රියාව හැටියටම කරන්නෙ. මක්නිසාද? වෙලාව එනකොටම ඊට සූදානම් මේ 'අකුප්පා චෙතොවිමුත්තිය' ඉදිරිපත් කරගෙන. අන්න ඒක නිසා මෙතනින් ගතයුතු වැදගත්ම කාරණය තමයි 'අනෙජො සන්තිමාරබ්භ යං කාලමකරී මුනි' යන පදයෙන් කියැවෙන්නෙ. ඒ පදයෙන් කියැවෙන්නෙ 'යම් ශාන්තියක් මුල්කරගෙන ඒ බුද්ධමුනිවරයා කාලක්‍රියා කළේද' යන්නයි. අන්න ඒ කාලක්‍රියාව පිළිබඳ අනිත් විස්තර තමයි අනිත් පදවල සඳහන් වෙන්නෙ. එතකොට මෙයින් අපට පැහැදිලි වෙනව මේ ජීවිතයෙදිම 'දිට්ඨධම්මිකවම' අර සම්පරායික තත්ත්වය- ඇත්ත වශයෙන්ම සම්පරායික තත්ත්වය කියල කියන්නෙ මරණින් මතු තවත් උත්පත්තියක් නැත, භවයක් නැත, කියන ඒ භව නිරෝධය පිළිබඳ ප්‍රත්‍යක්ෂය - මෙලොවදීම රහතන් වහන්සෙලා ලබාගන්නව මේ අරහත්ඵල සමාධියෙන්. ඒ වගේම අර අමෘතත්වය. **අනිකුත් හැම ආගමකම අමෘතත්වය මරණින් මත්තටයි තියෙන්නෙ.** මේ බුද්ධ ධර්මයත් ඒවට සමාන කළොත් සදාකාලික නිර්වාණයක් පිළිබඳ අදහසක් එකතු කරගෙන, ඒකටත් අනික් ආගම්වලට යන කලමයි යන්නෙ. එතකොට අනිත්‍යතා ධර්මයට විරුද්ධ වෙනව. අනාත්ම ධර්මයට විරුද්ධ වෙනව. දැන් **මෙතන තිබෙන්නෙ එහෙම පිටින්ම වෙනස් සංකල්පයක්. අදහසක්. මාරයගෙ බල බිඳින සමාධියකට සිත යොමු කිරීමෙන් මරණ අවස්ථාව ජය ගැනීමක්.** එතකොට මෙයින් අපට පේනව මේ අසංඛත ධාතුවෙම අංශ දෙකක් දක්වීමටයි 'සඋපාදිසෙස පරිනිබ්බාන ධාතු' 'අනුපාදිසෙස පරිනිබ්බාන ධාතු' කියල පද දෙකක් යොදල තියෙන්නෙ. ඇත්ත වශයෙන්ම කියනව නම්, වෙන එකක් තබා මරණින් මතු තත්ත්වය පවා- මෙලොවම ලබන ඒ නිවීම පමණක් නොවෙයි මරණින් මතු ඒ නිවීම තහවුරු බව, මරණින් මතු භවය නිරුද්ධ බව - ඒ හැම එකක්ම රහතන් වහන්සේල කලින්ම ප්‍රත්‍යක්ෂ කරගෙන තිබෙනව. කල්තබාම ප්‍රත්‍යක්ෂ කරගෙන තිබෙනව. මෙතන තියෙන වැදගත්කම කොයිතරම්ද කියතොත් මේ ලෝකයේ තියෙන අනෙකුත් සාමාන්‍ය 'සන්දිට්ඨික- සම්පරායික' පද පිළිබඳ විග්‍රහයන්ට වඩා එහෙම පිටින්ම වෙනස් මාර්ගයකිනුයි බුදුරජාණන්වහන්සේ ධර්මය ඉදිරිපත් කරල තියෙන්නෙ. මක්නිසාද? සාමාන්‍යයෙන් ලෝකයා සළකන්නෙ කෙනෙකුට නිසැකවම ප්‍රත්‍යක්ෂ කරගත හැක්කේ සන්දිට්ඨික දේ පමණයි කියල. 'සන්දිට්ඨික' කියන වචනයෙ තේරුමත් 'මේ ජීවිතයට අදාළ දේවල්. එහෙම නම් යමෙකුට නිසැක වශයෙන්, ප්‍රත්‍යක්ෂ වශයෙන්, තේරුම් ගන්න පුළුවන් වන්නෙ සන්දිට්ඨික දේ පමණයි. සාමාන්‍ය ලෝකයේ සිරිත එයයි. 'සම්පරායික' දේ - මරණින් මතු තත්ත්වය - පිළිබඳව ඒ විධියට නිසැක වෙන්න බැරි නිසාම ලෝකයාගේ සිරිත යම්කිසි ශාස්තෘ කෙනෙකු කෙරෙහි

හෝ දෙවිකෙනෙකු කෙරෙහි හෝ ශ්‍රද්ධාවෙන් ඒ ගැන විශ්වාස කිරීමයි. ටිකක් කල්පනා කරල බැලුවහම මේ කාරණය පැහැදිලි වෙනව. මේ මූලධර්මය තව ටිකක් පැහැදිලි කරගන්න අපි අංගුත්තර නිකායෙ පඤ්චක නිපාතයෙ සුමනා වග්ගයේ එන සීහ සේනාපතිගේ පොඩි කතා පුවතක් ඉදිරියට ගනිමු.[11] මේ ගැඹුරු සූත්‍ර අතරට 'දාන කථාවකුත්' එකතු වුනාම ටිකක් සහනයකුත් වෙනව.

මේක මේ 'දාන කථා' පිළිබඳ බොහොම සැහැල්ලු කථාන්තරයක් - අපි මේ නිදසුනක් හැටියට ඉදිරිපත් කරන්නෙ. මේ සීහ සේනාපතිය බොහොම ශ්‍රද්ධාවන්ත දානපති කෙනෙක්. එක දවසක් බුදුරජාණන් වහන්සේ ළඟට ඇවිල්ල විමසනව: 'සක්කා නු ඛො භන්තෙ සන්දිට්ඨිකං දානඵලං පඤ්ඤාපෙතුං' 'ස්වාමීනි, සන්දිට්ඨික දානඵලයක් දක්වන්න පුළුවන්ද?' කියල. සාමාන්‍යයෙන් දාන ඵල, දානානිසංස, ගැන කියන කොට පරලොව පිළිබඳව නේ කියන්නෙ. ඒක නිසා වෙන්න ඇති සීහ සේනාපතිය මේ විශේෂයෙන් අහන්නෙ. සන්දිට්ඨික වශයෙන්, මේ ජීවිතයේදීම අත්දකින්න පුළුවන්, දානානිසංසයකුත් තිබෙනවද කියල බුදුරජාණන් වහන්සේගෙන් ප්‍රශ්න කළා. බුදුරජාණන් වහන්සෙ ඒ අවස්ථාවෙ 'සන්දිට්ඨික' දානඵල හතරකුයි '**සම්පරායික**' - **මරණින්මතු** - දාන ඵලයකුයි කියන දාන ඵල පහක්ම ප්‍රකාශ කළා. ඒ සන්දිට්ඨික දානපල හතර: 'දායකො සීහ දානපති බහුනො ජනස්ස පියො හොති මනාපො- 'සීහ, දානපති දායකයා බොහෝ දෙනාට ප්‍රිය මනාප කෙනෙක් වෙනව.' ඒක පළමුවෙනි සන්දිට්ඨික දානඵලය. මේ ජීවිතයේදීම අත්දකින්න පුළුවන් දානානිසංසය. 'දායකං දානපතිං සන්තො සප්පුරිසා භජන්ති'- 'යහපත් සත්පුරුෂයෝ මේ දායක දානපතියාව ඇසුරු කරනව. මේ දෙවෙනි දානඵලය. 'දායකස්ස දානපතිනො කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති' - තුන්වෙනි කාරණය: දායක දානපතියා පිළිබඳව හොඳ යහපත් කීර්ති රාවයක් පැතිරෙනව'. හතරවෙනි ආනිසංසය, හතරවෙනි දාන ඵලය: 'දායකො දානපති යඤ්ඤදෙව පරිසං උපසඞ්කමති යදි ඛත්තියපරිසං යදි බ්‍රාහ්මණ පරිසං යදි ගහපතිපරිසං යදි සමණපරිසං විසාරදොව උපසඞ්කමති අමඞ්කුභූතො' - 'දායක දානපතියා, යම්කිසි පිරිසක් ක්ෂත්‍රිය හෝ වේවා, බ්‍රාහමණ හෝ වේවා, ගෘහපති හෝ වේවා, ශ්‍රමණ හෝ වේවා යම්කිසි පිරිසක්, සභාවක්, වෙත එළඹෙන කොට, විශාරදවම, භයනැතිවම, නොමකුවම, එළඹෙනව. මෙන්න මේ කියාපු දානානිසංස හතර, දාන ඵල හතර, අත්දකින්න පුළුවන් කෙනෙකුට. ඒ නිසා ඒව සන්දිට්ඨිකයි. ඊළඟට පස්වෙනුව- නොඇසූ ප්‍රශ්නයක් නමුත් තව පස්වෙනුවත් - බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා, තවත් ඒ සීහ සේනාපතියගෙ සිත සතුටු කරන්න වෙන්න ඇති: 'දායකො දානපති

කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති' - ඒ දායක දානපතියා කයබිඳීමෙන් පසු, මරණින් මත්තෙහි, සුගතියෙහි උත්පත්තිය ලබයි කියල. අන්න ඒ අවස්ථාවෙ මේ සීහ සේනාපතිය ප්‍රකාශ කරනව - අන්න ඒ ප්‍රකාශයයි අපට මෙතෙන්දි වැදගත් වන්නෙ: 'යානිමානි භන්තෙ භගවතා චත්තාරි සන්දිට්ඨිකානි දානඵලානි අක්ඛාතානි, නාහං එත්ථ භගවතො සද්ධාය ගච්ඡාමි. අහමෙපතානි ජානාමි..... යඤ්චඛො මං භන්තෙ භගවා එවමාහ 'දායකො සීහ දානපති කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජතී'ති එතාහං න ජානාමි, එත්ථච පනාහං භගවතො සද්ධාය ගච්ඡාමි.' ඒ කියන්නෙ, සීහ සේනාපතිය ප්‍රකාශ කරනව: 'ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ විසින් යම් සන්දිට්ඨිකවූ දානඵල හතරක් ප්‍රකාශ කළාද, ඒවා පිළිබඳව - 'නාහං එත්ථ භගවතො සද්ධාය ගච්ඡාමි' - 'භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාවෙන් මම ඒව විශ්වාස කරන්නෙ නැහැ. මක්නිසාද? 'අහමෙපතානි ජානාමි 'ඒව ප්‍රත්‍යක්‍ෂයෙන් දන්න නිසා'. එතකොට, ප්‍රත්‍යක්‍ෂයෙන් දන්න නිසාමයි බුදුරජාණන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාවෙන් විශ්වාස නොකරන්නෙ. මේක ටිකක් ගැඹුරින් හිතිය යුතු කාරණයක්. ඊළඟට අන්තිම එක ගැන කියන්නෙ: නමුත් භාග්‍යවතුන් වහන්සේ 'සම්පරායික' - මරණින් මතු - දානඵලයක් ගැන ප්‍රකාශයක් කළාද, 'එතාහං න ජානාමි' - ඒක මම දන්නෙ නැහැ 'එත්ථච පන භගවතො සද්ධාය ගච්ඡාමි' - එය මම දන්නෙ නැති නිසා භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාවෙන් ඒ ගැන විශ්වාස කරනව'. ඔන්න ඔතනින් පෙනෙනව, එතකොට, අපි අර කලින් කියාපු මූල ධර්මය. යම්කිසිවක් පිළිබඳව ප්‍රත්‍යක්‍ෂ ඥානය ඇද්ද, එතැනට සද්ධාවක් අනවශ්‍යයි. සද්ධාවක් අනවශ්‍යයි එතෙන්ට. මක්නිසාද? ප්‍රත්‍යක්‍ෂ ඥානය තිබෙන නිසා. දන්නෙ නැති නිසයි සද්ධාවක් ඇති කරගන්නෙ. විශ්වාසයක් ඇති කරගන්නෙ. දන්නව නම් දන්නව. එබඳු ඒ ප්‍රත්‍යක්‍ෂ ඥානයක් නැති තැන තමයි සද්ධාවට ඉඩ ලැබෙන්නෙ. ඒක නිසා තමයි අර පස්වෙනි කාරණය පිළිබඳ සද්ධාව. මුල් කාරණා පිළිබඳව සද්ධාවක් අවශ්‍ය නැහැ. ඔන්න මේ මූලධර්මය දන් අපි හෙළි කරගත්ත නම්, මේකෙන් ප්‍රයෝජනය ගන්න හොඳ දහම් ගැට ගාථාවක් තියෙනව ධම්ම පදයේ. මේ දහම් ගැට තියෙන පලියට ලිහනව නොවෙයි, මේක අපේ මාතෘකාවට අදාළ ගාථාවක් නිසයි.

'අස්සද්ධො අකතඤ්ඤූ ච
සන්ධිච්ඡෙදො ච යො නරො
හතාවකාසො වන්තාසො
ස වෙ උත්තම පොරිසො'

මේ අරහන්ත වග්ගයේ එන ගාථාවක්. මේ විදියෙ ගාථාවලට කියන්නෙ ශ්ලේෂාර්ථවත් ගාථා කියල. ශ්ලේෂාර්ථ කියල කියන්නෙ සමහර වචන තියෙනව දැරුත්, එහෙම නැත්නම් දෙබිඩි අරුත්. අර්ථ කීපයක් ඇති පද තියෙනව. කාව්‍යාලංකාරයක් වශයෙන් යොදනව මේ අහම් ගැට ගාථා ආදිය. දහම් ගැට කවි එහෙමත් තියෙනව. බැලූ බැල්මටම, මේක කියවන කොට එහෙම පිටින්ම ධර්ම විරෝධී අදහසක් තියෙන්නෙ. ඒක එක්තරා උපායක්, අසන්නාගේ, කියවන්නාගේ, අවධානය යොමු කරවීමට, කුතුහලය ඇති කිරීමට. මොකක්ද මේ කියන්නෙ කියල බලනකොට ධර්ම විරෝධී අදහසක් මුලින්ම කියැවෙන්නෙ. මේ ගාථාවෙත් එහෙමයි. අපි ගනිමු ඉස්සෙල්ල ධර්ම විරෝධී අදහස. මොකක්ද මතුපිට පෙනෙන අර්ථය? 'අස්සද්ධො' කියන්නෙ 'සද්ධාවක් නැති', 'අකතඤ්ඤූ' කියන්නෙ 'කළගුණ නොදන්නා', 'සන්ධිච්ඡෙදො' - 'ගෙවල් බිඳින', 'හතාවකාසො' - 'සියලුම ඉඩකඩ අහුරාගත්තු, 'වන්තාසො' 'වැමැරූ දෙයට ආසා කරන', 'යො නරො' යම් මනුෂ්‍යයෙක් වේද, 'ස වෙ උත්තම පොරිසො' ඒ තැනැත්ත තමයි උතුම්ම පුරුෂයා. සමහරවිට මේ කාලෙ හැටියට ඒක ඇත්තත් වෙන්න පුළුවනි. කොහොම නමුත් ඇත්ත වශයෙන්ම මේ ගාථාව රහතන් වහන්සේලා පිළිබඳ ගාථාවක්. නමුත් බැලූ බැල්මට මෙතන කියැවෙන්නෙ ගෙවල් බිඳින හොරෙක් පිළිබඳවයි. මේ එක අර්ථයක් - දැන් මේකෙ ගැඹුරු අර්ථය අපි බලමු, ධර්මානුකූල අර්ථය.

'අකතඤ්ඤූ' කියල කියන්නෙ - 'අකත' කියන්නෙ 'අසංඛතයටයි. නිවනට නමක්. 'අකතං අසංඛතං' කියල එහෙම කියන්නෙ. 'අකතඤ්ඤූ' කියන්නෙ, ඒ නිවන, ඒ අසංඛත තත්ත්වය දැනගත්. ප්‍රත්‍යක්ෂ ඥානයෙන් දැනගත්. 'අස්සද්ධො' ඒ ප්‍රත්‍යක්ෂ ඥානයෙන් දැනගත්තු නිසාම සද්ධාවක් නැති: වැඩි තේරුම පස්සට දමල ඉස්සෙල්ල ගාථාවෙ ගැඹුරු අර්ථය ගත්තොත්, මෙහෙමයි. 'අස්සද්ධො' කියන්නෙ ශ්‍රද්ධාව අනවශ්‍ය. මෙතන පරිවර්තනය කරන්න වෙන්නෙ ශ්‍රද්ධාව නැති හැටියට නොවෙයි 'ශ්‍රද්ධාව අනවශ්‍ය'. දැන් අපි අර සීහ සේනාපතිගෙ කථාවෙන් මතු කරගත්තු ධර්ම න්‍යායය අනුව, ඇත්ත වශයෙන්ම අකතඤ්ඤූ කියන දෙවන පදය තමයි අපට ඉස්සරහට ගන්න වෙන්නෙ. ඒ කියන්නෙ, 'අකතඤ්ඤූ' නිසාමයි 'අස්සද්ධො' වෙන්නෙ. අසංඛත ස්වභාවය, අසංඛත ධර්මය, කල්තබාම ප්‍රත්‍යක්ෂයෙන් දැනගත්තු නිසාමයි රහතන් වහන්සෙට ශ්‍රද්ධාවක් අනවශ්‍ය. අන්න ඒ අර්ථයෙන් රහතන් වහන්සේට මෙතන 'අස්සද්ධො' කියන පදය යොදල තියෙනව. එතකොට, 'අකත' නම් වූ ඒ නිර්වාණය දැනගත්, ඒ නිසාම ශ්‍රද්ධාව අනවශ්‍ය වූ, ශ්‍රද්ධාවෙන් වැඩක් නැති - අනිත් පදත් ඒ විධියට තව ගැඹුරු අර්ථවලින් දක්වනව- 'සන්ධිච්ඡෙදො' කියල කියන්නෙ ගෙවල් බිඳින අදහස

නොවෙයි 'සංසාර සන්ධිය සිඳ දැමූ'. මෙතන අර 'වට්ටුපච්ඡෙදො' ආදී වශයෙන් දක්වන ඒ සංසාර සන්ධිය සිඳ දැමූ'. 'හතාවකාසො' නැවත උත්පත්තියකට ඇති ඉඩකඩ අහුරාගත්. 'තෙ ඛීණබීජා අවිරූළ්හිච්ඡන්දා' ආදි වශයෙන් කියැවෙන විදියට කර්මබීජ නැති කළාවූ. 'වන්තාසො' වමාරා දැමූ ආසාව ඇති'. ඒ කියන්නෙ ආසාව වමාරා දැමූ'. අන්න එබඳු ඒ පුද්ගලයා ඇත්ත වශයෙන්ම උතුම් පුරුෂයෙක්. ඔන්න එතකොට ඒ රහතන් වහන්සේ පිළිබඳවයි. දැන් මෙතන අපට පැහැදිලි වෙනව 'අස්සද්ධො' කියන පදය රහතන් වහන්සෙට යොදල තියෙන්නෙ අර 'අසෙඛො' කියන පදය වගේ. රහතන් වහන්සේ පිළිබඳව යෙදෙනව 'අසෙඛො' කියල පදයක්. 'සෙඛ' කියල කියන්නෙ, 'හික්මෙන' කියන අර්ථයෙන්. සෝවාන් ආදීවූ ඒ ආර්ය අෂ්ටාංගික මාර්ගයට හරිහැටි වැටිල රහත්වීම දක්වා උත්සාහ කරන ආර්ය පුද්ගලයා හඳුන්වන පදයක් තමයි 'සෙඛො'. 'සෙඛ' කියන පදය බලාගෙන 'අසෙඛ' කියන පදය එහෙමම පරිවර්තනය කළොත් කියන්න වෙන්නෙ 'නොහික්මෙන තැනැත්තා'. නමුත් රහතන් වහන්සේ' නොහික්මෙන තැනැත්තා' නොවෙයි, හික්මීම අවසාන කළ' 'හික්මීමෙන් වැඩක් නැති 'අමුතුවෙන් හික්මෙන්ට අවශ්‍යතාවක් නැති' තැනැත්තා. අන්න ඒ අර්ථයෙන් 'අසෙඛො' කියන පදය යොදනව රහතන් වහන්සේට. අන්න ඒ වගේම තමයි මෙතනත් මේ 'අස්සද්ධො' කියල යොදල තියෙන්නෙ. 'අස්සද්ධො අකතඤ්ඤූ ච'. මෙතන මේ 'අකතඤ්ඤූ' කියන පදයෙනුත් අපි අර කලින් සඳහන් කළා වගේ අසංඛතය පිළිබඳව මේ ජීවිතයේදීම රහතන් වහන්සේ -කල්තබාම - අර්හත් ඵල සමාධියේදී ඒ භවනිරෝධය ප්‍රත්‍යක්ෂ කර ගැනීමෙන් දැන ගත්ත. ඒ අසංඛතය දැනගත්තු නිසාම තමයි- අන්න ඒක නිසාම තමයි - අපි ප්‍රකාශ කළේ මේක මහා ආශ්චර්යවත් දෙයක්ය මේ ධර්මය පිළිබඳව කියල. මේ නිර්වාණ ප්‍රත්‍යක්ෂය පිළිබඳ මහා ආශ්චර්යවත් ධර්මතාව කුමක්ද? සන්දිට්ඨික වූ- මේ ජීවිතය හා සම්බන්ධ - දේවල් පමණක් නොවෙයි, 'සම්පරායික' තත්ත්වයක් පිළිබඳවත් - මරණින් මතු තත්ත්වයක් පිළිබඳවත් - නිසැක ප්‍රත්‍යක්ෂ ඥානයක් ලබාගැනීමේ ක්‍රමයක් බුදුරජාණන්වහන්සේ ඉදිරිපත් කරල තියෙනව මේ 'නිබ්බාන' නාමයෙන්. භව නිරෝධය පිළිබඳ ප්‍රත්‍යක්ෂයක්. මරණින් මතු භවයක් නැති බව මෙලොවදීම දකින තත්ත්වයක් මේ කියන්නෙ. 'භව නිරොධො නිබ්බානං'. එතකොට මේ එකම අසංඛත ධාතුවයි තිබෙන්නෙ. ඒ නිසා තමයි අර ගාථාව ඉවර වෙන්නෙ, 'පහංසු තෙ සබ්බභවානි තාදිනො' කියල. ඒ රහතන් වහන්සේල සියලුම භවයන්ගෙන් මිදුන. දැන් අපට මෙයින් පැහැදිලි වෙනව, 'සඋපාදිසෙසා නිබ්බානධාතු' 'අනුපාදිසෙසා නිබ්බානධාතු' කියල මේ දෙකක් තිබුනට, 'අනුපාදිසෙස නිබ්බානධාතු' කියල කියන්නෙ රහතන්

වහන්සේ මරණින් මතු ගිහිල්ල පදිංචි වෙන 'සදාකාලික' තත්ත්වයක් නොවෙයි. ඒ වගේම 'අමරණීය' තත්ත්වයක් නොවෙයි. **නිර්වාණයෙ අමෘතත්වය මෙලොවදීම අත්දකිනව.** ඒක නිසා තමයි 'අමතං පරිභුඤ්ජන්ති' කියල කියන්නෙ. රහතන් වහන්සේල අමෘතය අනුභව කරනව, අර්හත්ඵල සමාධියට සමවැදිල. ඒ වගේම, අර මරණ අවස්ථාව ආවාම ඒක ඉදිරිපත්කරගෙන අමෘතය වළඳන අතරෙයි මාරය හෙමිහිට ශරීරය අහක් කරගන්නෙ. එතකොට, ඕන නම් මේකට ගිනි තියාගන්නත් පුළුවන්, හරියට වෙන කෙනෙකුගෙ ශරීරයට ගිනි තියන්න වගේ. අපි දන් ධර්මයෙ ඉතාමත්ම ගැඹුරු කොටසකටයි මේ ඇවිල්ල තියෙන්නෙ.

මේ 'සංඛත' 'අසංඛත' කියන පද දෙක ගැනත් යමක් කියන්ට සිද්ධවෙනව. අපි ගියවර දේශනයෙදි ප්‍රකාශ කළා ලෝකයා සාමාන්‍යයෙන් මහා පරතරයක් ඇතැයි සළකන එතෙර - මෙතෙර කියන පද දෙකත්, ලෞකික-ලෝකෝත්තර කියන පද දෙකත් පිළිබඳ එක්තරා අමුතු විදියෙ විවරණයක්. සාමාන්‍යයෙන් 'එතෙර-මෙතෙර' 'ලෞකික- ලෝකෝත්තර' යන පද පිළිබඳව 'පරතරය' කියන වචනය ඇහෙනකොටම කෙනෙකුට කාලයත් අවකාශයත් අතින් යම්කිසි විශාල පරිච්ඡේදයක් හැඟෙනව. නමුත් අපි මේ එතෙර - මෙතෙර අතර පරතරයත් 'ලෞකික- ලෝකෝත්තර අතර පරතරයත් උපමා කළේ බුදුරජාණන් වහන්සේගෙන් අවසර ලැබුණු ඒ නෙළුම් උපමාව - පියුම් උපමාව - මාර්ගයෙන්. අර නෙළුම් කොළේ ඉඳල පිණි බින්දුවට යම් දුරක් වේද අන්න එපමණම දුරක් තමයි එතෙරත් මෙතෙරත් අතර තියෙන්නෙ, ලෞකිකයත් ලෝකෝත්තරයත් අතර තියෙන්නෙ. මේව සමහරවිට නිකං තර්ක කියල හිතන්න පුළුවන්. නමුත් ගැඹුරින් කල්පනා කිරීමට හොඳ අවස්ථාවක්. 'යස්ස පාරං අපාරං වා පාරාපාරං න විජ්ජති' කියන ඒ අර ධම්මපද ගාථාව බැලූ බැල්මට මහ අවුල් විදියෙ ගාථාවක්. රහතන් වහන්සේට එතෙරත් නෑ මෙතෙරත් නෑ එතෙර- මෙතෙර දෙකමත් නෑ. අන්න එබඳු ගාථාවලින් පෙනෙන හැටියට රහතන් වහන්සේ මෙතෙරින් පමණක් නොවෙයි එතෙරවුනෙ. මෙතෙර-එතෙර දෙකින්ම එතෙර වුනා. ඒ කියන්නෙ ද්වයතාව ඉක්මෙව්ව. සංඛතය - අසංඛතය දෙක ගැනත් ඒ විදියෙ දෙයක් කියන්න සිද්ධ වෙනව. 'සංඛතය' හරියට මල් රටාවක් වගෙයි. භවය නමැති මේ සංඛතය සකස් වෙල තියෙන්නෙ තණ්හා ලාටුවෙනුයි, දිට්ඨි පටලැවිලිවලිනුයි, මාන ගැටවලිනුයි. තණ්හා ලාටුව ඉවත් කරල, දිට්ඨි පටලැවිලි බේරල, මාන ගැට ලිහා දම්මොත්, අන්න ඒ අවස්ථාවෙ සංඛතයම අසංඛතය බවට පත්වෙනව. එකම මල් රටාව. මේකෙ තියෙන තණ්හා ලාටුව හෝදල ඇරල, දිට්ඨි පටලැවිලි බේරල දමල, මාන ගැටත් ලිහා දම්මහම 'සංඛත' මල් රටාව 'අසංඛත' වෙනව.

ඒකම තමයි භව නිරෝධය. 'නිබ්බාන' කියන වචනයෙන් හැඟෙන නිවීම ගැන කල්පනා කරල බැලුවාම බුදුරජාණන් වහන්සේ 'පරිනිබ්බාන' යන්නෙන් දක්වන්නෙත් අර විධියෙම නිවීමක් බව පේනව. බුදුරජාණන් වහන්සේම උදන් ඇනූ, ප්‍රීතිවාක්‍ය ප්‍රකාශ කළ, එක් අවස්ථාවක් හැටියට සඳහන් වෙනව උදාන පාළියෙ අගටම එන දබ්බමල්ලපුත්ත මහරහතන් වහන්සෙගෙ පරිනිබ්බාන අවස්ථාව[12]. මේ දබ්බමල්ලපුත්ත මහරහතන් වහන්සේ මහත් සෘද්ධිමත් රහත් කෙනෙක්. විශේෂයෙන්ම තේජෝධාතු සමාපත්තියෙන් යම් යම් හපන්කම් කළ ආශ්චර්යවත් රහතන් වහන්සේ නමක්. ඒ රහතන් වහන්සෙගෙ පරිනිබ්බානයත් එක්තරා විදියක ආශ්චර්යවත් සිද්ධියක්. උන්වහන්සේ පිරිනිවන් පෑමට සුදුසු කාලය - ඒ කියන්නෙ ජීවිතය අවසාන වන කාලය - ආවාම, බුදුරජාණන් වහන්සේ ළඟට වැඩල 'පරිනිබ්බාන කාලො 'දානිමෙ සුගත' මගේ පරිනිබ්බාන කාලය දැන් ඇවිල්ල තියෙනව සුගතයන් වහන්ස' කියල ප්‍රකාශ කළා. බුදුරජාණන් වහන්සෙ ඊට දුන් පිළිතුර 'යසස' දානි ත්වං දබ්බ කාලං මඤ්ඤසි' 'යම් වැඩකට දැන් සුදුසු කාලය නම් දබ්බ ඒ වැඩේ කරන එකයි තියෙන්නෙ'. ඒ කිව්ව විතරයි දබ්බමල්ලපුත්ත රහතන් වහන්සෙ බුදුරජාණන් වහන්සේ පැදකුණු කරලා අහසට පැන නැඟිල, තෙජොධාතු සමාපත්තියට සමවැදිල එයින් නැගිටල පිරිනිවන් පෑව. ගිනි දල්වුනු උන්වහන්සෙගේ ශරීරයෙන් අළු ඉතිරි උනෙත් නැහැ. දලි ඉතිරි උනෙත් නැහැ. ඒකයි විශේෂත්වය. අළුත් ඉතිරි උනෙ නැහැ. දලිත් ඉතිරි උනෙ නෑ. මේක එතකොට 'නිබ්බානය' පිළිබඳව අපි මේ ප්‍රකාශ කළ අදහස්වලට හොඳ නිදසුනක්. ඒ නිසාම වෙන්ට ඕන බුදුරජාණන් වහන්සෙ ඒ අවස්ථාවෙදි හොඳ වටිනා උදාන ගාථාවක් ප්‍රකාශ කළේ.

අභෙදි කායො නිරොධි සඤ්ඤා - වෙදනා සීති හවිංසු සබ්බා
සංඛාරා වූපසමිංසු - විඤ්ඤාණං අත්ථං අගමා

'කය බිඳී ගියේය සඤ්ඤාව නිරුද්ධ විය. සියලු වේදනාවෝ සිසිල් භාවයට පත්වූවාහ. සංස්කාරයෝ සංසිඳුනාහ. විඤ්ඤාණය අස්තයට ගියේය (කෙළවර විය)'. තවත් ඉතිරි දෙයක් නැහැ මෙතන. මේ සිද්ධිය කොයිතරම් වැදගත්ද කියතොත්, මේක සිද්ධඋනේ රජගහනුවර වේළුවනාරාමෙ. ඊළඟට බුදුරජාණන් වහන්සේ සැවැත් නුවරට වැඩිය අවස්ථාවෙදි සංඝයා වහන්සේ කෙනෙක් අහපු ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් නොවෙයි, තමන් වහන්සේම ඒ සංඝයා වහන්සේල අමතල 'අපේ දබ්බමල්ලපුත්ත මේ විදියට පිරිනිවන් පෑව. අළුත් ඉතිරි උනෙ නැහැ දලිත් ඉතිරි උනෙ නැහැ' කියල ප්‍රකාශ

කරල අන්තිමට තවත් උදාන ගාථා දෙකක් - තවත් ප්‍රීති වාක්‍ය දෙකක් - ප්‍රකාශ කළා.

1. අයොඝන හතසෙසව - ජලතො ජාතවෙදසො
අනුපුබ්බූපසන්තස්ස - යථා න ඤායතෙ ගති

2. එවං සම්මාවිමුත්තානං - කාම බන්ධොඝතාරිනං
පඤ්ඤාපෙතුං ගති නත්‍ථි - පත්තානං අචලං සුඛං[13]

'අයොඝනහතසෙසව ජලතො ජාතවෙදසො' - මේ මුල් පද දෙක ගැන පොඩි ගැටලුවක් තියෙනව. අටුවාවල එහෙම තෝරන කොට අර්ථ දෙකක් දීල තියෙනව. නමුත් ඉස්සෙල්ලම අපට මෙතන ගතයුතු අර්ථය කියන්න සිද්ධවෙනව. අපට අභිමත අර්ථය මුලින්ම ඉදිරිපත් කරනව. 'අයොඝන හතසෙසව- ජලතො ජාතවෙදසො', ගිනිගත්තු යකඩ ගුලියක් - යකඩ පිඩක් - මෙන් දල්වෙන්නා වූ ගින්නක්, 'අනුපුබ්බූපසන්තස්ස' - අනුපිළිවෙලින්, අනුක්‍රමයෙන්, නිවී ගියවිට, 'යථා න ඤායතෙ ගති'- 'යම්සේ එය ගිය තැන දැනගත නොහැකිවේද? 'එවං සම්මාවිමුත්තානං - එසේම, මැනවින් විමුක්ත වූ', 'කාමබන්ධොඝතාරිනං' කාමබන්ධන නම් වූ සැඩ පහරින් එතෙර වූ ඒ රහතන් වහන්සේලාගේ, 'පඤ්ඤපෙතුං ගති නත්‍ථි- පත්තානං අචල සුඛං', - නොසෙල්වෙන නිවන් සැපයට පත්වූ ඒ රහතන් වහන්සේලා පෙන්නුම් කිරීමට ගියමගක් නැත. ගියමගක් දැකගත නොහැක'. එතකොට මෙතන ප්‍රශ්නයක් හැටියට අපි ප්‍රකාශ කළේ මුල් ගාථාපද දෙක පිළිබඳවයි. අටුවාව විවරණ දෙකක් දෙනව. එක විවරණයක් තමයි කම්මලක කිණිහිරෙනුත් යකඩ මිටියෙනුත් තලනු ලබන යම් කිසි ලෝහ භාජනයකින් පැනනඟින ගින්නක් හෝ එහෙම නැත්නම් ඒ ශබ්දය හෝ ක්‍රම ක්‍රමයෙන් සන්සිඳී ගියාම ඒක කොහේ ගියාද, කොයි පැත්තට ගියාද, කියල දැන ගන්න බැරි වෙන්නෙ යම්සේද' - කියල අන්න ඒ විධියටයි අටුවාචාරීන් වහන්සේ තෝරන්නෙ - ඊළඟට, 'ඇතැම් කෙනෙක් මෙසේද කියත්' කියල (සමහර විට අටුවාවෙ වෙන අයගෙ අදහසුත් දානව 'කෙචිද්වාද' වශයෙන්) තවත් තේරුමක් දෙනව. 'තලනු ලබන යකඩ ගුලියක්' කියන අදහසකුත් දෙනව. අපි මේ අර්ථ දෙකටම වඩා වෙනස් ආකාරයකිනුයි මෙතෙන්දි තේරුවෙ. කම්මලක තලනු ලබන යකඩයක් ගැන නොවෙයි මේ කියන්නෙ, යකඩයක් නිවීයාම ගැන නොවෙයි. 'අයොඝන හතස්ස' කියන එක උපමාවක්. 'ඉව' (-හතස්ස + ඉව) කියලයි මෙතන ගන්න තියෙන්නෙ අටුවාව අරන් තියෙන්නෙ 'එව' කියලයි 'අයොඝන හතසෙසව ජලතො ජාතවෙදසො' - මේ කියන්නෙ අර ගිනිදැල්ල ගැනයි.

දල්වෙන්නාවූ ගින්නක් දකින කොට ඒ ගිනිදැල්ල පිළිබඳ යම්කිසි ඝන සඤ්ඤාවක් ඇතිවෙනව. ලොකු ගිනි දැල්ලක් දිහා බැලුවාම පෙනෙන්නෙ ඇත්තවශයෙන්ම ද්‍රව්‍යමය දෙයක් හැටියටයි. අන්න ඒ අදහසයි මේ 'අයොඝනහතස්ස' කියන එකෙන් පෙන්නුම් කරන්නෙ. ඒ කියන්නෙ, රත්වූ යකඩ ගුලියක් වගේ දල්වෙන්නාවූ ගිනි මැලයක්. 'සෙය්‍යො අයොගුළො භුත්තො - තත්තො අග්ගිසිඛූපමො[14] ආදි ධම්මපද ගාථාවෙ ඒ උපමාව සඳහන් වෙනව වෙනත් ආකාරයකින්. 'ගිනි දැල්ලක් වගේ ගිනිගෙන දිලිසෙන යකඩ ගුලියක් ගිලීම මැනවි' කියල අර දුශ්ශීලත්වය ගැන ප්‍රකාශ කරන කොට දක්වෙනව. අන්න ඒ ගාථාවෙ, එතන ඒ ගිනි ගත්තු යකඩ ගුලිය ගිනිදැල්ලකට උපමා කරල. මෙතන ගිනිදැල්ල යකඩ ගුලියකට උපමා කරල. මේ ගැන සැකයක් තියෙනව නම් එතකොට ඒක අනුව විසඳා ගන්න පුළුවන්. මෙතන කියැවෙන්නෙ 'ජලතො ජාත වෙදසො' දල්වෙන්නා වූ ගිනිදැල්ල. ඒ පිළිබඳව ඇතිවෙන ඝන සංඥාව අන්න අර වගෙයි.

එතකොට මෙයින්ම අපට පේනව - බුදුරජාණන් වහන්සෙ උදාන ගාථා තුනක්ම මේ දබ්බමල්ලපුත්ත මහරහතන් වහන්සේගේ පරිනිබ්බානය පිළිබඳව ප්‍රකාශ කළේ මක් නිසාද? **මේ නිබ්බාන' කියන එක නිවීමක්'.** නිවුනට පස්සේ මේක යන තැනක් නෑ. අනෙකුත් අයගෙ ශරීරවල අළු එහෙම ඉතිරිවෙනව. එතකොට ටිකක් හරි කෙනෙක් හිතා ගන්නව මෙන්න මෙහෙම යම්කිසි දෙයක් ඉතිරි වෙනව කියල. නමුත් මේ දබ්බමල්ලපුත්ත මහරහතන් වහන්සේ නියම විධියට අර තෙජෝ ධාතු සමාපත්තියෙනුත් පාඩමක් උගන්වන්න වගේ අන්තිමට අළුත් ඉතිරිකළෙ නැහැ දැලිත් ඉතිරි කළෙ නැහැ. අන්න ඒ නිසා තමයි බුදුරජාණන් වහන්සේ මේ ප්‍රීතිවාක්‍ය ප්‍රකාශ කළේ. **මේ භව නිරෝධයමයි නිබ්බානය.** අමුතුවෙන් එකතුකරගන්න සදාකාලික 'නිබ්බානයක්' මෙතන නැහැ. අමරණීය නිබ්බානයක් මෙතන නැහැ.

අටුවාවලත් සමහර විට ඉඳහිටල නොයෙකුත් ආකාරයෙන් මතුකරන තර්ක මේ කාලයෙත් අහන්ට ලැබෙනව. නිවන ගැන ලියන ලේඛකයින්, නිවන ගැන දෙසන දේශකයින් බොහෝවිට උපකාර කරගන්නව මේ මෑතදී ඇතිකරගත්තු යම් යම් උපමා. විශේෂයෙන්ම, උපමා දෙකක් නිතර අහන්ට ලැබෙනව, කියවන්ට ලැබෙනව. ඉබි උපමාවයි ගෙඹි උපමාවයි. මේ ඉබි උපමාවෙ තියෙන්නෙ - ඔන්න ඉබ්බෙක් වතුරට බහිනව. මාලුවො අහනව 'කොහේ ඉඳලද යාලුවෙ ආවෙ' කියල. ඉබ්බ කියනව 'මම ගොඩබිම ඉඳලයි ආවෙ' කියල. 'ගොඩබිම කොහොම එකක්ද මෙන්න

මෙහෙමද මෙහෙමද, කියල මාලුවො අහනව, දියේ සවභාවය අනුව. එතකොට ඉතින් ඒ හැම ප්‍රශ්නෙටම 'නෑ නෑ' කියන්න වෙනව. අර ගෙඹි උපමාවත් ඒ වගේ. මැඩිදෙන වතුරට බැස්සාම වතුරෙම ඉන්න ඉස්ගෙඩියට ගොඩබිම තේරුම් කරන්න ගියොත් 'නැහැ නැහැ' කියන්න වෙනව. එතකොට මේ 'නැහැ නැහැ' කියන එක නිබ්බානයට සම්බන්ධ කරන්නෙ කොහොමද? අපි අර අර්හත් ඵල සමාධිය පිළිබඳව දක්වූ ඡේද ටිකයි නිදර්ශන හැටියට දක්වන්නෙ, ඒ දේශකයින්, ඒ ලේඛකයින්. අපි සඳහන් කළා 'අත්ථි භික්ඛවෙ තදායතනං යත්ථ නෙව පඨවී න ආපො' ආදි වශයෙන් 'මෙන්න මෙහෙම ආයතනයක් තිබෙනව පඨවි ආපො ආදි කිසිවක් නැති' කියල. නමුත් අපි සාධක සහිතව පෙන්නුම් කළා ඒ සඳහන් වෙන්නෙ රහතන් වහන්සෙ මරණින් මතු ගිහිල්ල ඇතුල් වෙන, කියන්න බැරි - අර ඉබ්බට කියාගන්න බැරි, මැඩිදෙනට කියාගන්න බැරි - අමුතු ලෝකයක් නොවන බව. මේ නිසා අර වගේ විවරණවලින් මේ ධර්මයෙ තිබෙන භව නිරෝධය පිළිබඳ ගැඹුරු අදහසත්, පටිච්ච සමුප්පාද ධර්මයත් ප්‍රතික්ෂේප වෙනව. අනාත්ම දේශනාව ප්‍රතික්ෂේප වෙනව. එබඳු ඒ දේශනාවලින් බොහෝවිට නිර්වාණය පිළිබඳ ඉලක්කය ගැන වැරදි අවබෝධ ඇතිවෙනව. බලවත් අනවබෝධයකින් එබඳු දේශනා කෙරෙන බවයි කියන්න වෙන්නෙ.

එබඳු තර්ක ඉදිරිපත් කරන්නෙ, මේ නිර්වාණය උච්ඡේදයක් නොවෙයි කියල කීමටයි. උච්ඡේදවීමක් ගැන අදහසක් වැළැක්වීමටයි ඒ විදියෙ සදාකාලික නිර්වාණයක් මවා පෙන්වන්න උත්සාහ කරන්නෙ. නමුත් බුදුරජාණන් වහන්සේම ප්‍රකාශ කරල තියෙනව 'මම මේ භව නිරෝධය පිළිබඳව දේශනාකරන අවස්ථාවලදි මට නොයෙකුත් අය - ශාස්වත දෘෂ්ටි ගත්තු අය - මට 'අභූත අබ්භාචික්ඛණයක්' - ඒ කියන්නෙ අසත්‍ය චෝදනාවක් - කරනවය, 'වෙනයිකො සමණො ගොතමො' ශ්‍රමණ ගෞතමයෝ උච්ඡේද වාදියෙක්ය' - 'සතොසත්තස්ස උච්ඡේදං විනාසං විභවං පඤ්ඤපෙති' - ඇත්ත වශයෙන් තිබෙන්නා වූ ආත්මයක උච්ඡේදයක් ප්‍රකාශ කරනවය' කියල. ඒ අවස්ථාවලදි බුදුරජාණන්වහන්සේ ඒ උච්ඡේද වාදය පිළිබඳ චෝදනාවෙන් ගැලවීමට කවදාවත් කිසිම ආකාරයකින් ශාස්වත වාදයට හේත්තු වුනෙ නැහැ. සදාකාලික නිබ්බානයක් පිළිබඳ අදහසක් ඉදිරිපත් කරගෙන ඒ චෝදනාවෙන් බේරෙන්න ගියෙ නෑ. ඒ වෙනුවට කළේ මොකක්ද? ධර්මයට අනුව ත්‍රිලක්ෂණ දේශනාවට සිත යොමු කරවලා, චතුරාර්‍ය සත්‍ය දේශනාවට සිත යොමු කරවලා, ඒ ප්‍රශ්නය විසඳුව, 'මට මෙහෙම අභූත චෝදනාවක් කරනව. මා නොකියන දේකටයි මේ චෝදනාව

කරන්නෙ' කියල අවසාන කරන්නෙ කොහොමද? '**පුබ්බෙචාහං එතරහි ච දුක්ඛඤ්චෙව පඤ්ඤපෙමි දුක්ඛස්ස ච නිරොධං**[15] මම එදත් කළේ, අදත් කරන්නෙ මෙච්චරයි, දුකත් දුක්ඛ නිරෝධයත් පමණයි මා දේශනා කරන්නෙ'. 'තථාගත' කියල ගන්න ආත්ම වශයෙන් ගතයුතු පුද්ගලයෙක්වත් ඇතෙයි කියල නොවෙයි මම ප්‍රකාශ කරන්නෙ. මේ දුක් ගොඩක්, සංසාරයෙ අවිද්‍යාව අනුව ආපු දුක් ගොඩක්, උපාදානය නිසා ඇතිවෙලා - උපාදානය නිසාමයි 'භවයක් ඇතිවෙන්නෙ - උපාදානය නැතිඋන හැටියෙ කෙළවර වෙනව. භව නිරෝධය එතනමයි'. 'අනුපාදා පරිනිබ්බාන' වශයෙන් ඒ භව නිරෝධ අවස්ථාවෙදි රහතන් වහන්සෙ අර කිසිවක් අල්ලගන්නෙ නැ. යමක් අල්ලගෙන ඉන්නව නම් තමයි හඳුන්වන්න පුළුවන් වන්නෙ. ඒ හැම එකක්ම අතහැරියම ඒකට නමක් දෙන්න බැහැ. සමහර අවස්ථාවල අටුවාවලත් තෝරනව අර විධියට 'අපඤ්ඤත්තිකභාවං ගතා' කියල. එහෙම පනවන්ට බැරිඋනාට මොකද කොහේ නමුත් ගියා. අර කුරුල්ලන් ගිය මාර්ගය වගේ කොහේ නමුත් ගියා. අපට ඒක කියාගන්න බැරි දෝසය විතරයි. අන්න ඒ විදියෙ දුර්වල තර්ක නගනව. මේ හැම එකකින්ම ධර්මයේ තිබෙන 'පටිච්ච සමුප්පාද' 'අනත්ත' ආදී ගැඹුරු අංශ යටපත් වෙනව. ක්‍රම ක්‍රමයෙන් ඒ එක්කම සක්කාය දිට්ඨිය වැඩෙනව. ශාස්වත දෘෂ්ටියට බරවෙනව. නිබ්බානය පිළිබඳ ඉතාමත්ම ගැඹුරු අංශයක් දක්වීමටයි අපි මේ දේශනාවෙ මේ විස්තර ටික ඉදිරිපත් කළේ.

# අධෝලිපි

1. අං.නි. IV 110 පිට (බු.ජ.21)
2. ම.නි. III 506 පිට (බු.ජ.12)
3. ථෙර. 34 පිට. රක්ඛිතත්ථෙර ගාථා (බු.ජ.28)
4. ම.නි. I 368 පිට, රථවිනීත සු. (බු.ජ.10)
5. ම.නි. I 366 පිට (බු.ජ.10)
6. උදා. සක්කාර සු.බු.නි. I 152 පිට (බු.ජ.24)
7. උදා. සොණ සු.බු.නි. I 244 පිට (බු.ජ.24)
8. ඉති.ධාතු සු.බු.නි. I 378 පිට (බු.ජ.24)
9. සං.නි. IV 390 පිට සමාධි සු. (බු.ජ.16)
10. දී.නි. II 246 පිට (බු.ජ.8)
11. අං.නි. III 60 පිට (බු.ජ.20)
12. උදා. පඨම දබ්බ සු.බු.නි. I 316 පිට (බු.ජ.24)
13. උදා. දුතිය දබ්බ සු.බු.නි. I 316 පිට (බු.ජ.24)
14. ධ.ප. නිරය වග්ග. බු.නි. I 102 පිට (බු.ජ.24)
15. අලගද්දූපම සු.ම.නි. I 350 පිට (බු.ජ.10)

# 20 වන
# දේශනය

# 20 වන දේශනය

## "නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස"

"එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං"

"මෙය ශාන්තය, මෙය ප්‍රණීතය, එනම් සියලු සංස්කාරයන්ගේ සංසිඳීම, සියලු උපධීන් අතහැර දැමීම, තණ්හාව ක්ෂය කිරීම, නොඇල්ම නම් වූ විරාගය, නැවැත්ම නම් වූ නිරෝධය, නිවීම නම් වූ නිබ්බානය"

**අතිපූජනීය මහෝපාධ්‍යාය මාහිමිපාණන් වහන්සේ ප්‍රධාන ගරුතර යෝගාවචර මහාසංඝරත්නයෙන් අවසරයි. 'නිබ්බාන' යන මාතෘකාව යටතේ පවත්වනු ලබන දේශනා මාලාවේ විසිවෙනි දේශනයයි මේ.**

'සම්පරායික' නම් වූ මරණින් මතු තත්ත්වය පිළිබඳව 'දිට්ඨධම්මික' වශයෙන් මේ ජීවිතයේදීම ප්‍රත්‍යක්ෂ දැනුමක් ලබාගත හැකිවීම නිර්වාණාවබෝධය පිළිබඳ ආශ්චර්යවත් ධර්මතාවක් හැටියට අපි පසුගිය දේශනයේදී විස්තර කළා. 'දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා' - දිටු දැමියෙහිම ස්වකීය අභිඥාවෙන් සාක්ෂාත් කොට' යන පාඨය නිතරම සූත්‍ර දේශනාවල සඳහන් වෙන්නෙ මේ මරණින් මතු තත්ත්වය ගැන සියැසින් දුටුවාක් මෙන් විමුක්ත පුද්ගලයාට සහතික විය හැකි නිසයි. 'නත්ථිදානි පුනබ්භවො' - 'දැන් ඉතින් නැවත භවයක් නැත', 'ඛීණා ජාති' - 'උපත ක්ෂය විය', වැනි උදාන පාඨ - ප්‍රීති වාක්‍ය - ප්‍රකාශ කිරීමට බුදුරජාණන් වහන්සේටත් රහතන් වහන්සේලාටත් හැකි උනේ භව නිරෝධය ප්‍රත්‍යක්ෂයෙන්ම මේ ජීවිතයේදී දැනගත හැකිවීම නිසයි. ඒ ප්‍රත්‍යක්ෂය තුළින්ම උන්වහන්සේලා සියලු වේදයිතයන්ගේ සිසිල්වීම නම් වූ එක්තරා අවේදයිත සුඛයක් අත් දකිනව. ඒක නිසා තමයි නිවන 'අවේදයිත සුඛයක්' හැටියට හඳුන්වන්නෙ. ජීවිතය කෙළවර මරණ අවස්ථාව එළඹෙන විට මේ රහතන්වහන්සේලා, මේ විමුක්ත පුද්ගලයින්, මරණ වේදනාව හමුවේ පවා නොසැලෙන 'අකුප්පා චෙතො විමුත්තිය' ඉදිරිපත් කර ගැනීමෙන් මරණයට කලින්ම අමරණීය වෙනව. මරණින් පසුව නොවෙයි. මේ අකුප්පා චෙතොවිමුත්තිය ගැන බොහෝ අවස්ථාවල බුදුපියාණන් වහන්සේ ඉතාමත්ම උත්කෘෂ්ට අඳමින් වර්ණනා කරල තියෙනව. ඉතාමත් උතුම් සැපය හැටියට, උතුම්ම ඥානය හැටියට, උතුම්ම 'ණය නැති බව' හැටියට, විස්තර කරල තියෙනව. නිදසුන් වශයෙන් කියතොත්, අඞ්ගුත්තර නිකායෙ ඡක්ක නිපාතයෙ ධම්මික වග්ගයෙ එන ගාථා දෙකක්:

1. 'තස්ස සම්මා විමුත්තස්ස - ඤාණං වෙ හොති තාදිනො
අකුප්පා මෙ විමුත්තීති - භව සංයෝජනක්ඛයෙ

2. එතං ඛො පරමං ඤාණං - එතං සුඛමනුත්තරං
අසොකං විරජං ඛෙමං - එතං ආණණ්‍යමුත්තමං'[1]

'මැනවින් විමුක්ත වූ ඒ තාදී පුද්ගලයාට - 'එහෙවු' ස්ථිර සාර පුද්ගලයාට - භව සංයෝජන ක්ෂය වීමෙන් 'මගේ විමුක්තිය අකෝප්‍යයි, අචලයි, යන ඥානය ඒකාන්තයෙන්ම වෙයි. 'එතං ඛො පරමං ඤාණං' - මෙය පරම ඥානයයි. මෙය උතුම්ම ඥානයයි. 'එතං සුඛමනුත්තරං' - මෙය අනුත්තර සැපයයි. 'අසොකං විරජං ඛෙමං' - නිශ්ශෝකීවූ, කෙලෙස් රජස් රහිතවූ, ආරක්ෂා සහිතවූ, මේ තත්ත්වය, එතං ආණණ්‍යමුත්තමං' - උතුම්ම වූ 'ණය නැති' බවයි. මේ ණය නැති බව කියන්නෙ - සාමාන්‍යයෙන් රහතන්වහන්සේලා ණය නැති බව ප්‍රකාශ කරනව සමහර අවස්ථාවල සිවුපස පරිභෝගය සම්බන්ධයෙන්. සිවුපස පරිභෝගය සම්බන්ධයෙන් ණය නැති බවකුත් තියෙනව. නමුත් ඒක නොවෙයි මෙතන කියවෙන්නෙ, බොහෝ තැන්වල නිවනටම උපපදයක් හැටියට, නිවනම හඳුන්වන වචනයක් හැටියට යොදනව 'ආණණ්‍ය' කියන වචනය. ඒකට හේතුව, මුළු මහත් සංසාරයම එකම ණයක්. කවදාවත් ගෙවල නිම කරන්න බැරි විදියෙ ණයක්. පොලී සහිතව - ගිනි පොලී සහිතව - ගෙවන්ට වෙන විදියෙ ණයක්. ඒ කියන්නෙ, කර්මයත් කර්ම විපාකයත් ගැන සලකල බලන කොට කවදාවත් ගෙවල ඉවර කරන්න බැරි ණයක් වගේ. ඒ ණයෙන් පවා මේ රහතන්වහන්සෙලා විමුක්ත වෙනව, කර්මක්ෂය කිරීමෙන්, කර්ම බීජ ක්ෂය කිරීමෙන්. ඒ වගේම මේ ජීවිතයෙන් එහාට කර්ම විපාක පලදීමට ඉඩ නොතැබීමෙන්. අර රතන සූත්‍රයෙ එහෙම කියවෙන 'ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං' කියන පාඨයත් මේ අනුව තේරුම් ගන්න පුළුවනි. පරණ ණය ඔක්කොම ගෙවල ඉවරයි තවත් ණය වෙන්නෙත් නැහැ. ඔන්න ඔය විදියෙ තත්ත්වයක්. එතකොට මෙන්න මේ අකුප්පා චෙතොවිමුත්තියෙ විශිෂ්ටත්වයයි මෙයිනුත් ප්‍රකාශ කෙරෙන්නෙ. සාමාන්‍යයෙන් ලෝකයේ කෙනෙකුට හිතන්න බැරි විදියේ ඥානයක් - මරණින් මතු තත්ත්වය ප්‍රත්‍යක්ෂ වශයෙන් දැකීම. නිවන පිළිබඳ සාකච්ඡා හැම එකකදීම වගේ ඉතාම සියුම් ප්‍රශ්නයක්, ගැටළුවක්, හැටියට ඉදිරිපත් කෙරෙන්නෙ විමුක්ත පුද්ගලයාගේ මරණින් මතු තත්ත්වය පිළිබඳ ප්‍රශ්නයයි. මේ ප්‍රශ්නයට බුදුරජාණන් වහන්සේ දුන්න කෙටි පිළිතුරක් අපි ගියවර දේශනයේදීත් දැක්වුව, උදාන පාළියෙ අවසාන වන අවසාන ගාථා දෙකෙන්. ඉතාමත්ම විශිෂ්ට අන්දමින්මයි ඒ උදාන ගාථා ප්‍රීතිවාක්‍ය පිළිබඳ සංග්‍රහය, ඒ

ධර්‍මග්‍රන්ථය කෙළවර වෙන්නෙ. ඒ අවසාන ගාථා දෙක අපි නැවතත් මතක් කර ගනිමු.

ආයොඝනහතස්සෙව - ජලතො ජාතවෙදසො
අනුපුබ්බූපසන්තස්ස - යථා න ඤායතෙ ගති

එවං සම්මා විමුත්තානං - කාම බන්ධොඝතාරිනං
පඤ්ඤාපෙතුං ගති නත්‍ථි - පත්තානං අචලං සුඛං

'රත්වූ ඝන යකඩ පිඩක් මෙන් දල්වෙන ගින්නක් ක්‍රමයෙන් නිවීගිය පසු එය ගිය අතක් දනගත නොහැකිවේද, එසේම කාමබන්ධන නමැති සැඩ පහරින් එතෙරව, මැනවින් විමුක්ත වූ අචල සුඛයට පත්වූවන් ගිය අතක් පෙන්නුම් කළ නොහැකිය'.

මේ අවසාන පද දෙක විශේෂයෙන්ම වැදගත්. '**පඤ්ඤාපෙතුං ගති නත්‍ථි - පත්තානං අචලං සුඛං**' 'අචල සුඛයට පත්වුවන්ගේ 'ගතිය' - ගියමග, ගියපාර - පැනවිය නොහැකිය'. අචල සුඛය හැටියට මෙතන හඳුන්වල තියෙන්නෙත් අර කියාපු අකුප්පා චෙතොවිමුත්තියමයි. 'අකුප්ප' කියන්නෙ 'අකෝප්‍ය' කුපිත නොවන, නොසෙල්වෙන. එතකොට මේ පදයෙන් හොඳටම පැහැදිලිව කියැවෙන්නෙ, ඒකෙ නියම අර්ථය, 'මරණින් මතු, එසේ විමුක්ත වූ රහතන් වහන්සේලාගේ ගිය අතක් දක්වන්ට බැහැ. හරියට අර ගින්නක්, ගිනි දල්ලක් වගේ. ගිනිදල්ලක් හැටියට පේන කොට මේක ඝන සංඥාව අනුව හරියටම ඇති දෙයක් හැටියටයි හැඟෙන්නෙ. නමුත් එබඳු ඒ ගිනිදල්ල පවා දර නැති වීමෙන් නිවීගියාට පස්සේ ගිය දිසාවක් - අහවල් දිසාවට ගියයි කියල - කියන්න බැහැ. අන්න ඒ වගේ ම, ගිය දිසාවක්, ගිය අතක්, දක්විය නොහැකිය කියන එකයි මෙන්න මේ 'පඤ්ඤාපෙතුං ගති නත්‍ථි' කියන එකේ අදහස. අර්ථය මෙහෙම උනත්, බොහොම දෙනෙක් උත්සාහ කරනව මීට වඩා වෙනස් අර්ථයක් මෙයින් මතු කරගන්න. 'පඤ්ඤාපෙතුං ගති නත්‍ථි' කියන එකේ මෙ 'ගති' කියන වචනය අනුව සමහර කෙනෙක් කල්පනා කරනව - අටුවාචාරීන් වහන්සේලා පවා ඇතැම් අවස්ථාවල - පෙන්නුම් කළ හැකි ගති විශේෂයකට, උත්පත්ති විශේෂයකට නොපැමිණෙන නමුත්, විස්තර කරන්න බැරි, කියල දෙන්න බැරි, යම්කිසි තැනකට රහතන් වහන්සේලා යනවයි කියල. උච්ඡේදවාදයට භයෙනුයි ඒ විදියෙ අදහසක් ඉදිරිපත් කරන්නෙ. මේක මේ අටුවාවලත් තිබෙන බවට හොඳ නිදසුනක් තමයි ධම්මපදට්ඨකථාවෙ[2] කොධ වග්ගයේ එක්තරා ගාථාවකට අටුවා දීමෙදිත් ඒ වගෙ අදහසක් දීම.

'අහිංසකා යෙ මුනයො - නිච්චං කායෙන සංවුතා
තෙ යන්ති අච්චුතං ඨානං - යත්ථ ගන්ත්වා න සොචරෙ'

කයින් නිතර සංවර වූ ඒ අහිංසක මුනිවරු, යම් තැනකට ගොස් ශෝක නොකෙරෙත්ද එබඳුවූ ඒ 'අච්චුත' තැනට - ඒ කියන්නෙ ගිලිහී නොයන තැනට - යෙත්, පත්වෙත්, කියන එකයි. මෙතෙන්දි මේ 'අච්චුතං' කියන වචනය තෝරන්නෙ 'සස්සතං' කියල. 'ශාශ්වත තත්ත්වයට යනව'. 'යන්ති' කියල යන බවක් මෙතන කියැවෙන නිසා කල්පනා කරන්ට ඇති මේ කියන 'අච්චුත' තත්ත්වය, අචල තත්ත්වය, මරණින් මතු ලබන එකක් හැටියට. නමුත් අපි දන් ප්‍රකාශ කළ කාරණයට තවත් සාධකයක් අපට දක්වන්ට පුළුවන් සුත්ත නිපාතයෙ පාරායණ වග්ගයෙ හෙමක මාණව පුච්ඡාවෙන්. එතන කියැවෙනව මොකක්ද මේ අච්චුත පදය කියන එක පැහැදිලිවම:

'ඉධ දිට්ඨසුතමුත විඤ්ඤාතෙසු - පියරූපෙසු හෙමක
ඡන්දරාග විනොදනං - නිබ්බාන පදමච්චුතං'[3]

'හෙමක, මෙලොවම මේ 'දිට්ඨ සුත මුත විඤ්ඤාත' - දුටු, ඇසූ, දැනුන, දැනගත් - කියන ඒ ඉන්ද්‍රියාරම්මණ පිළිබඳව, ප්‍රිය ස්වරූප වූ එබඳු දේවල් පිළිබඳව, **ඡන්දරාගය පහකිරීමම** 'අච්චුත' නම් වූ ඒ නිර්වාණපදයයි. එතකොට මෙයිනුත් අපට පැහැදිලි වෙනව, මරණින් මතු යම්කිසි ශාශ්වත වූ, අමරණීය වූ, තැනකට යනව නොවෙයි කියන එක. ඒ විදියට එහෙම නොයෙකුත් දෙනා තර්කයක් ඉදිරිපත් කරන්නෙ ඇත්ත වශයෙන්ම උච්ඡේද දෘෂ්ටියකට වැටෙයි කියන භය නිසයි. එහෙම භයක් ඇතිවෙන්ට හේතුව මොකද? **භව තෘෂ්ණාවෙන් මැඩුණු ලෝකයාට භව නිරෝධය පිළිබඳ දේශනාව බොහොම භය ගෙනදෙන විධියෙ දෙයක්.** මේ නිසාම තමයි ඒ අටුවාචාරීන් වහන්සේල වගේම මේ කාලෙත් ඔය අලුතෙන් හදාගත්තු උපමා දෙකක් දක්වන්නෙ. අපි එදා දවසෙ මතක් කළා 'ඉබි උපමා' 'ගෙඹි උපමා' ගැන. අර ජලයෙ වසන මාලුවට හෝ ඉස්ගෙඩියට, ගොඩබිම කුමක්ද කියල තේරුම් ගැනීමට අවශ්‍ය උනාම ඉබ්බගෙන් හරි ගෙම්බගෙන් හරි ඒ ගොඩබිම ගැන අසන අසන ප්‍රශ්නයට ඉබ්බටත් ගෙම්බටත් සිද්ද වෙන්නෙ 'නැත, නැත, නැත, නැත' කියන්නයි. ඒ විදියටම බුදුරජාණන් වහන්සේත් මේ නිර්වාණ ප්‍රතිසංයුක්ත දේශනාවල 'නැත, නැත' යන වචන රාශියක් දක්වල තියෙනවයි කියන එකයි ඒ අයගෙ තර්කය. නමුත් අපි ප්‍රකාශ කළා ඒ විධියට නොවෙයි ඒව තේරුම් ගත යුත්තෙ කියන එක. මේ භව නිරෝධය කියන කාරණයමයි මෙයින් පෙන්නුම් කරන්නෙ. බුදුරජාණන්

වහන්සේ මජ්ඣිම නිකායේ අලගද්දූපම සූත්‍රයේ[4] පැහැදිලිවම ප්‍රකාශ කරනව 'මා මේ භව නිරෝධය පිළිබඳව දේශනා කරන ධර්මය අහල ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයින්, ඇතැම් මහණ බමුණන්, මට අභූත චෝදනාවක් නගනවයි මා උච්ඡේද වාදියෙක්ය කියල, **'සතො සත්තස්ස උච්ඡේදං විනාසං විභවං පඤ්ඤපෙති'** කියල. 'ඇත්තාවූ සත්ත්වයකුගේ - ඇත්ත වශයෙන් සිටින්නා වූ සත්ත්වයකුගේ - උච්ඡේදය, විනාශය, නැතිවීම, පෙන්නුම් කරනවය කියල. ඒ වගේම, මේ ධර්මය අහල ඇතැම් කෙනෙක් බොහොම ශෝකයට, කලාන්ත බවට, පත්වෙනවයි, වැලපෙනවයි **'උච්ඡිජ්ජිස්සාමි නාම සු. විනස්සිස්සාමි නාම සු.න සු නාම භවිස්සාමි'** ආදි වශයෙන් කියමින් - 'මා උච්ඡේද වෙනවලු, මා විනාශ වෙනවලු, මා තවත් ඇතිවන්නෙ නැතිලු'. ඒ විධියට ශෝක කරන බව බුදුරාණන්වහන්සෙ පැහැදිලිවම ප්‍රකාශ කරල තියෙනව. විමුක්ත පුද්ගලයගෙ මරණින් මතු තත්ත්වය ගැන බුද්ධකාලයෙත් මහණ බමුණන් අතර නොයෙකුත් තර්ක විතර්ක පැවතුනා. ඒ අය අතර මතයක් පැවතුනා යම්කිසි ශාසනයක විමුක්ත පුද්ගලයාගේ මරණින් මතු තත්ත්වය ගැන විවරණයක් කළ යුත්තේ සතරකොන් තර්කයක් අනුවය කියල. 'සතරකොන් තර්කය' කියන මේ සිංහල වචනය අපි යොදා ගත්තේ 'චතුෂ්කෝටි' කියන එකට. 'චතුෂ්කෝටි' - කොන් හතරක් ඇති ප්‍රශ්නයක්. ඒ ප්‍රශ්නය සූත්‍ර දේශනාවල නිතරම සඳහන් වෙනව. මොකක්ද?

**'හොති තථාගතො පරම්මරණා**
**න හොති තථාගතො පරම්මරණා**
**හොති ච න ච හොති තථාගතො පරම්මරණා**
**නෙව හොති න න හොති තථාගතො පරම්මරණා'**[5]

'මරණින් මතු තථාගත තෙම **වෙයි**' - ඉන්නවයි කියන එකයි ඒ. දෙවෙනි එක: 'මරණින් මතු තථාගත තෙම **නොවෙයි**' තුන්වෙනි එක: 'මරණින් මතු තථාගත තෙම **වෙයි සහ නොවෙයි**' - ඒ දෙකේම සම්බන්ධයක්. හතරවෙනි එක: 'මරණින් මතු තථාගත තෙම **වෙයිත් නොවෙයි, නොවෙයිත් නොවෙයි**'. ඒ කියන්නෙ, අපි මේක තේරුම් ගත හැකි ආකාරයට කිව්වොත්, ඔන්න, යම්කිසි ප්‍රශ්නයකට දිය හැකි පිළිතුරු සමූහයමයි මේ හතර ඇතුළට කොටු කරල තියෙන්නෙ. 'හතරකොන්' කියල කිව්වෙ ඒකයි. දැන් 'උභතෝකෝටික' කියන එක අපි කවුරුත් දන්නව. ඒ දෙකෙන් එකකට අහුවෙනව කියන එක. ඒ වගේ මෙතන හතරක් හැටියටයි, හතරකොන් ප්‍රශ්නයක් හැටියටයි, ඉදිරිපත් කරල තියෙන්නෙ. යම්කිසි දෙයකට එක්කො 'ඔව්' කියන්න වෙනව. එහෙම නැත්නම් 'නෑ' කියන්න වෙනව. එහෙම නැත්නම් 'ඔව්' සහ 'නෑ' එකට එකතු කරල කියන්න වෙනව. එහෙමත්

නැත්නම් 'ඔවුත් නෑ නැත් නෑ' කියන්න වෙනව. ඔන්න ඔය විධියට චතුෂ්කෝටි ප්‍රශ්නයක් අනුවයි තථාගතවරයාගේ මරණින් මතු තත්ත්වය ගැන විවරණය කළ යුත්තේ කියන අදහස ඒ කාලයේ මහණ බමුණන් පරිබ්‍රාජකයන් අතර තිබුන. මෙතන මේ 'තථාගත' යන වචනෙ යොදන්නෙ - අපට දන් හුරු පුරුදු හැටියට 'තථාගත' කියල කියනකොටම මතක් වෙන්නෙ බුදුරජාණන්වහන්සේ - නමුත් ඒ කාලෙ මේ 'තථාගත' කියන වචනය එක්තරා පාරිභාෂික ශබ්දයක්ව තිබුන බවයි පේන්නෙ. ඒ මහණ බමුණන් 'තථාගත' කියන වචනය යෙදුවෙ ඕනෑම ශාස්තෘවරයෙකුගෙ ශාසනයක, 'උත්තමපුරිසො පරම පුරිසො පරමපත්තිපත්තො' යනුවෙන් හැඳින්විය හැකි පුද්ගලයා පිළිබඳවයි. ඒ කියන්නෙ, ඒ ශාසනයෙ ඉගැන්වීම සම්පූර්ණ කළ, එය කෙළවර කළ, උත්තම පුරුෂයා, පරම තත්ත්වයට ගිය තැනැත්තා, පරමප්‍රාප්තියට - උතුම් හැටියට සැළකෙන තත්ත්වයට ගිය තැනැත්තා.

මේ කාරණය අපට හොඳට පැහැදිලි වෙනව සංයුත්ත නිකායෙ අව්‍යාකත සංයුත්තයෙ 'කුතුහලසාලා' සූත්‍රයෙන්.[6] ඒ සූත්‍රයෙදි වච්ඡගොත්ත කියන පරිබ්‍රාජකයා බුදුරජාණන්වහන්සෙ දකීමට ඇවිල්ල, මෙන්න මෙහෙම කාරණයක් සැලකර සිටිනව. 'භවත් ගෞතමය, පහුගිය දවස්වල කුතුහල ශාලාවේ ලොකු රැස්වීමක් තිබුන මහණ බමුණන් පරිබ්‍රාජකයන් එකතු වෙල. ඒ රැස්වීම පැවැත්වෙන අතරතුර එක්තරා අතුරු කථාවක් ඔවුන් අතර පැන නැගුන. මොකක්ද අතුරු කථාව? ඔවුන් මෙන්න මෙහෙම ප්‍රකාශ කළා. ' මේ පූරණ කස්සප කියල ඉන්නව බොහොම ලොකු ශ්‍රාවක පිරිසක් ඇති, ලොකු ශ්‍රාවක පිරිසකගේ ආචාර්යවරයෙක් හැටියට සිටින, ප්‍රසිද්ධ, බොහෝ දෙනා විසින් හොඳයයි පිළිගත්තු, ශාස්තෘවරයෙක්. ඒ ශාස්තෘවරයා තමන්ගේ සාමාන්‍ය ශ්‍රාවකයා මිය පරලොව ගියාම, ඒ තැනැත්තා අසවල් තැන උපන්න, අහවලා අහවල් තැන උපන්න කියල විවරණය කරනව. ඒ වගේම, තමාගෙ ශාසනයෙ ඉහළම තත්ත්වයට පත්වූ, විමුක්තිය හැටියට සැලකෙන තත්ත්වයට පත්වූ පුද්ගලයා මියගියාම, ඔහු පිළිබඳවත් අර විධියෙ ප්‍රකාශයක් කරනව. අසුවල් තැන, අන්න අතන උපන්න කියල. පූරණකස්සප[2] කියන ශාස්තෘවරය එහෙමයි. 'මක්ඛලී ගෝසාල' කියන ශාස්තෘවරයත් එහෙමයි. 'නිගණ්ඨ නාතපුත්ත' කියන ශාස්තෘවරයත් එහෙමයි. 'සඤ්ජය බෙලට්ඨිපුත්ත' කියන ශාස්තෘවරයත් එහෙමයි. 'පකුධ කච්චායන' කියන ශාස්තෘවරයත් එහෙමයි. 'අජිත කෙසකම්බල' කියන ශාස්තෘවරයත් එහෙමයි. ඒ දෙදෙනා ගැනම පැහැදිලි ප්‍රකාශයක් කරනව. නමුත්, 'සමණ ගොතම' කියල මේ ඉන්න ශාස්තෘවරය - ඒත් ලොකු ගෝල පිරිසක් ඇති, බොහෝ දෙනා විසින් හොඳයයි පිළිගත්තු

තැනැත්තෙක් - ඒ ශ්‍රමණ ගෞතමයන් අර පළමුවෙනි ප්‍රශ්නයට නම් පිළිතුරක් දෙනව. ඒ කියන්නෙ, සාමාන්‍ය ශ්‍රාවකයෙක් මිය ගියාම, 'අසුවලා අසුවල් තැන උපන්නා' කියල පැහැදිලිව ප්‍රකාශයක් කරනව. නමුත් **'යොපිඛවස්ස සාවකො උත්තමපුරිසො පරමපුරිසො පරමපත්තිපත්තො, තම්පි සාවකං අඛ්භතීතං කාලකතං උපපත්තීසු න ව්‍යාකරොති'** - නමුත් තමන්ගේ ශාසනයේ අර උත්තම තත්ත්වයට, පරම තත්ත්වයට ගිය ශ්‍රාවකයා මිය ගියාම, ඒ පිළිබඳව යම්කිසි විවරණයක්, ප්‍රකාශයක්, අර කියාපු චතුෂ්කෝටික න්‍යාය අනුව කෙරෙන්නෙ නැහැ. 'අපි ච බො නං එවං ව්‍යාකරොති' නමුත් ඒ වෙනුවෙන් මේ විධියෙ විවරණයක් කරනව: **'අච්ඡෙච්ඡි තණ්හං, වාවත්තයි සඤ්ඤොජනං, සම්මා මානාභිසමයා අන්තමකාසි දුක්ඛස්ස'**. **'අච්ඡෙච්ඡි තණ්හං'** - තණ්හාව කපා හැරිය. **'වාවත්තයි සඤ්ඤොජනං'** - සංයෝජන බැම් හරවල දැම්ම. මේක හරියට කියනව නම්. **'වාවත්තයි'** කියන වචනෙ තියෙන්නෙ - දැන් අපට හිතාගන්න පුළුවන් - කොක්කකින් යමක් අවුණල තියෙනව නම්, ඒ කොක්ක අනිත් පැත්තට හැරෙව්ව. අන්න ඒ වගේ දෙයක්. **'සම්මාමානාභිසමයා'** - හොඳින්ම මානය තේරුම් ගැනීමෙන්, මානයේ ස්වභාවය හොඳින් තේරුම් ගැනීමෙන්, **'අන්තං අකාසි දුක්ඛස්ස'** - දුක කෙළවර කළා' - කියන ඔන්න ඔය විදියෙ විවරණයකුයි දෙන්නෙ. 'අර අපට ඕන අන්දමේ උත්තරයක් නොවෙයි,' කියල මෙන්න මෙහෙම අතුරු කථාවක් ඒ සභාවෙ පැවතුනාය. මේක අහලා - මේ වච්ඡගොත්ත තාම මේ විස්තරයයි කියන්නෙ - මේක අහල, මට සැකයක් විචිකිච්ඡාවක් ඇති වුන කොහොමද මේ ශ්‍රමණ ගෞතමයන්ගෙ ධර්මය තේරුම් ගන්නෙ කියල.

එහෙම ප්‍රකාශ කළාම, බුදුරජාණන් වහන්සෙ කිව්ව - **'අලං හි තෙ වච්ඡ කඞ්ඛිතුං, අලං විචිකිච්ඡිතුං, කංඛනීයෙ පන තෙ ඨානෙ කඞ්ඛා උප්පන්නා'** - 'ඒක හොඳයි වච්ඡ, එහෙම සැක කළ එක. විචිකිච්ඡාවක් ඇතිකරගත්තු එක. සැකයක් ඇතිවිය යුතු තැනකයි නුඹට සැකයක් ඇතිඋනේ. එහෙම ප්‍රකාශ කරල ඔන්න ඊළඟට අර වච්ඡගෙ සැකය දුරු කිරීමට නියම විධියටම හේතු දක්වනව. **'සඋපාදානස්ස ඛ්වාහං වච්ඡ උප්පත්තිං පඤ්ඤපෙමි නො අනුපාදානස්ස'** - 'වච්ඡය, මම උපතක් දක්වාලන්නේ උපාදාන සහිත වූවහුටයි. උපාදාන රහිතවූවහුට නොවේ.' උපාදානය නැති තැනැත්තා පිළිබඳව මම උපතක් පෙන්නුම් කරන්නෙ නැහැ. උපාදාන ඇති එක්කෙනා පිළිබඳව විතරයි මා උපතක් පෙන්නුම් කරන්නෙ'. ඊළඟට උපමාව දෙනව: **'සෙය්‍යථාපි වච්ඡ. අග්ගි සඋපාදානො ජලති නො අනුපාදානො. එවමෙව ඛ්වාහං වච්ඡ සඋපාදානස්ස උප්පත්තිං පඤ්ඤපෙමි නො අනුපාදානස්ස'** - යම් සේ, වච්ඡ උපාදාන සහිත වූ, ඒ කියන්නෙ, දර ඉන්ධන ද්‍රව්‍ය-

ගින්නක් අල්ල ගන්න යම්කිසි ද්‍රව්‍යයක් තියෙනව නම් එය - එවැන්නක් ඇති කල්හිම, 'සඋපාදානො ජලති' ගින්න දල්වෙනව. ඒ දර ආදියක් නැතිකල්හි එය දල්වෙන්නෙ නැහැ. අන්න ඒ විදියටම - මේ 'උපාදාන' කියන වචනයට අර්ථ දෙකක් තිබෙන බවයි අපි කලිනුත් සඳහන් කළේ- ගින්නට දර වගේ අර පුද්ගලයාට උත්පත්තිය පිළිබඳව උපාදානය උපකාර වෙනව. එහෙම ප්‍රකාශ කළාම වච්ඡ තවත් ප්‍රශ්නයක් අහනව. යම්කිසි ගැඹුරු අදහසක් දෙන ප්‍රශ්නයක් අහන්නෙ. 'යස්මිඤ්ච පන භො ගොතම සමයෙ අච්චි වාතෙන ඛිත්තා දූරම්පි ගච්ඡති, ඉමස්ස පන භවං ගොතමො කිං උපාදානස්මිං පඤ්ඤපෙති' - 'යම් අවස්ථාවක ගිනි සිලක් සුළඟින් විසිකරනු ලැබ දුරට පවා විහිදී යන්නේද ඒ පිළිබඳව, ඊට, කුමක් උපාදානය වේයයි ශ්‍රමණ ගෞතමයෝ පෙන්නුම් කරත්ද? කුමක්ද ඒ ගින්නට ඒ අවස්ථාවෙ උපාදාන වන්නෙ කියන එකයි. එතකොට බුදුරජාණන්වහන්සේ ඊට පිළිතුරු දෙනව: 'යස්මිං ඛො වච්ඡ සමයෙ අච්චි වාතෙන ඛිත්තා දූරම්පි ගච්ඡති, තමහං වාතූපාදානං වදාමි. 'වාතො හිස්ස වච්ඡ තස්මිං සමයෙ උපාදානං හොති'. 'යම් අවස්ථාවක ගිනිසිලක් සුළඟින් විසිකරනු ලැබ ඈතට විහිදී යේද, ඒ අවස්ථාවෙ වාතයම උපාදානය යයි මම කියමි'. 'ඒ අවස්ථාවෙ වාතයයි ඊට උපාදානය වන්නෙ' කියල පිළිතුරු දෙනව.

එතකොට මේ දුන්නෙ උපමාවක්. ඊළඟටයි ඔන්න වච්ඡ නියම ප්‍රශ්නෙ අහන්නෙ: '**යස්මිඤ්ච පන භො ගොතම සමයෙ ඉමඤ්ච කායං නික්ඛිපති සත්තො ච අඤ්ඤතරං කායං අනුපපන්නො හොති ඉමස්ස පන භවං ගොතමො කිං උපාදානස්මිං පඤ්ඤපෙති**' 'යම් අවස්ථාවක සත්ත්වයෙක් මේ කය අතහැරල එක්තරා කයකට පැමිණියේ වෙයිද, ඒ අවස්ථාවෙ කුමක් උපාදානය හැටියට ශ්‍රමණ ගෞතමයෝ දක්වත්ද?' එතකොට බුදුරජාණන්වහන්සේ ඊට දෙන පිළිතුර: '**යස්මිං ඛො වච්ඡ සමයෙ ඉමඤ්ච කායං නික්ඛිපති, සත්තො ච අඤ්ඤතරං කායං අනුපපන්නො හොති. තමහං තණ්හූපාදානං වදාමි. තණ්හා හිස්ස, වච්ඡ තස්මිං සමයෙ උපාදානං හොති**': 'යම් අවස්ථාවක සත්ත්වයෙක් මේ කය අතහැරල එක්තරා කයකට පැමිණියේ වෙයිද, ඒ අවස්ථාවෙ තණ්හාවම උපාදානය වෙනවය. තණ්හාවයි උපාදානය වන්නෙ. ඒ අවස්ථාවෙ තණ්හාවම ඔහුට උපාදානය වශයෙන් සිටිනවය'. එතනින්ම සූත්‍රය කෙළවර වෙනව. නමුත් මෙන්න මේ අවසානයට කියාපු කොටස් දෙකේ එක්තරා ගැටමුසු තැනක් තියෙනව. අපි මේ පාඨවලට යොදාගත්තෙ 'අනුපපන්නො' කියන වචනයයි. 'පැමිණියේය' කියන එකයි. සත්ත්වයා මේ කය අතහැරිය, '**අඤ්ඤතරං කායං අනුපපන්නො**' - 'එක්තරා කයකට පැමිණිය'. මේ කයද අතහැරියේ වෙයිද එක්තරා කයකට පැමිණියේ

වෙයිද?' නමුත් අටුවාව එහෙම, පිළිඅරගෙන විවරණය කරන්නෙ 'අනුප්පන්නො' කියන පාඨයක්. 'අනුප්පන්නො' කිව්වොත් මෙතන විරුද්ධාර්ථයයි තියෙන්නෙ. 'නූපන්නේ වෙයිද'. 'අනුප්පන්නො හොතීති චුතික්ඛණෙ යෙව පටිසන්ධිචිත්තස්ස අනුප්පන්නත්තා අනුප්පන්නො හොති[7] කියල විවරණයකුත් දෙනව. ඒ 'අනුප්පන්න' කියන එක එතන යොදල තියෙන්නෙ මක්නිසාද කියල අටුවාචාරීන් වහන්සේ තෝරන්නෙ සාරත්ථප්පකාසිනී සංයුත්ත අටුවාවෙ: 'චුතික්ෂණයෙහිම පටිසන්ධි සිත නූපදින නිසා අනුප්පන්නය'. මේ කය අතහැරිය නමුත් කොහෙවත් උපන්නෙත් නැහැ. එතකොට මේකට ප්‍රතිවිරුද්ධ අර්ථයක් තියෙන්නෙ. ඇතැම් ත්‍රිපිටක සංස්කාරකයින් මේ ගැන සැක කරනව. මෙතන ශුද්ධ විය යුතු පාඨයක්ය කියල. ඇත්ත වශයෙන්ම ඒ සැකය සාධාරණ හැටියට හැඟෙන නිසා තමයි අපි මෙතන **'අනුප්පන්නො'** යන වචනය වෙනුවට **'අනුප්පත්තො'** යන්න යෙදුවෙ. ඒ කියන්නෙ, සත්ත්වයා **මේ කය අතහැරිය එක්තරා කයකට පැමිණිය.** මේ පාඨය යොදා ගැනීමට හේතුව මොකද, **'අඤ්ඤතරං'** කියන වචනය නිතරම යෙදෙන්නෙ යම්කිසි ඇතිබවක් හැඟවීමටයි. **'එක්තරා'** කියල යොදන්නෙ යම්කිසිවකින් තෝරල, ඇතිබවක් ඇඟවීමටයි. එහෙම නැත්නම්, 'අඤ්ඤං' කියල යොදන්න තිබුන. මේ කයද අතහැරිය අනෙක් කයකට පැමිණියෙ නැහැයි කියලයි කියන්න තිබුනෙ. නමුත් 'එක්තරා' කියල යෙදුවෙ මේක ඇතිබවක් හඟවන නිසයි. 'එක්තරා කයකට පැමිණියේ වේද'. එතකොට නිරුක්ති අනුව බැලුවත් මේ 'අඤ්ඤතරං' කියන වචනය අනුව අපට ගන්න වෙන්නෙ 'අනුප්පන්නො' කියන පාඨය නොවෙයි **'අනුප්පත්තො'** කියන පාඨයයි. සත්ත්වයා මේ කය බහා තබනව, අතහරිනව, එක්තරා කයකට පැමිණෙනව.' ඒ වගේම උපමාව අනුව කල්පනා කරල බැලුවත්, මෙතන පෙනෙන්නෙ, - වච්ඡ අහන ප්‍රශ්නය ගැන ටිකක් කල්පනා කරල බැලුවහම, - ඉස්සෙල්ලම අහන ප්‍රශ්නය, 'ගිනිසිලක් හුලඟින් විසිකරනු ලැබ ඈතට විහිදෙනව කියල. මේ කියන්නෙ ලැව්ගින්නක් එහෙම පැතිරෙන ආකාරය පිලිබඳවයි. දන්, ලැව් ගින්නක් පැතිරීමේදි, එක ගහක ඉඳල තව ඈත තියන ගහකට ගින්න පැතිරෙන්නෙ හුළඟින් ඒක තල්ලු කරහමයි. අන්න ඒ කාරණය උපමා කරගෙනයි වච්ඡ අහන්නෙ. නමුත් අටුවාව තේරුම් කරල තියෙන්නෙ මේ කයත් අතහැරිය තව කොහෙවත් උපන්නෙත් නැහැ කියල. එතකොටයි අරෙහෙම තණ්හාව උපාදානය වෙන්නෙ. මේ විදියෙ විවරණයක් මුල් කරගෙන තමයි ඇතැම් කෙනෙක් අන්තරාභවවාදයකුත් මේකෙන් මතුකරගන්න බලන්නෙ. එතකොට, **අන්තරාභව වාදයකට කොහෙත්ම ඉඩක් නැහැ අර 'අනුප්පත්තො' කියන පාඨය ගත්තොත්.** වච්ඡ අහන්නෙ මෙතන ඉතාම සරල ප්‍රශ්නයක්. කෙනෙක්

මේ කය අතහැරල තව කයක උපදින කොට ඒ පරතරය කොහොමද පියැවෙන්නෙ කියන එක. බුදුරජාණන්වහන්සේ අර දෙන උපමාවත්, ගින්නක් එක ගහකින් අනිත් ගහකට පැතිරීමෙදී වාතය උපාදානය වෙන්නා වාගේ මේ තණ්හාව මරණ අවස්ථාවෙදී ඉදිරිපත් උනාම, එක කයක් අනික් කයක් එක්ක සම්බන්ධ වෙනව. අන්න ඒ නිසාම තමයි තණ්හාවට **'භවනෙත්ති'** කියල කියන්නෙ. **'භවනෙත්ති'**. **'නෙත්ති'** කියල කියන්නෙ 'නෙරායාම' ඉදිරියට නෙරා යන ගතියක් මේ තණ්හාවෙ තියෙනව. **'නති'** කියන වචනය යොදනව තණ්හාවට. **'භවනෙත්ති'** කියල යොදනව. එතකොට මෙතන මේ කියැවෙන්නෙ, නැවත ඉපදීමෙදී, මේ කයත් ඊළඟ කයත් අතර පරතරය පියැවෙන්නෙ මෙන්න මේ තණ්හාවෙන් බවයි. තණ්හාවම උපාදාන වශයෙන් සිටිනව. තණ්හාවම දර - ඉන්ධන ද්‍රව්‍ය - වශයෙන් සිටිනවයි එක තැනකින් තව තැනක ඉපදීමෙදී කියන එක. ඒ කාරණයයි අපට මෙතනින් තේරුම් ගන්න වෙන්නෙ. කොයිහැටි හෝ වේවා, මෙන්න මේ කුතුහලසාලාවෙ කෙරුණු සාකච්ඡාවෙන් අපට පෙනෙනව, මේ ශාසනයේ විමුක්ත පුද්ගලයාගේ මරණින් මතු තත්ත්වය සම්බන්ධයෙන් අනෙකුත් ශාස්තෘවරු වගේ බුදුරජාණන්වහන්සේ පැහැදිලි ප්‍රකාශයක් නොකිරීම මේ මහණ බමුණන්ගේ කුතුහලයට හේතුවුන බව. ඒ නිසායි ඔවුන් මේ ගැන දිගින් දිගටම කථා කළේ. බුදුරජාණන් වහන්සෙ මෙතෙන්දි කිසිවක් නොකිය හිටිය නොවෙයි. යම්කිසි අමුතු විදියෙ විවරණයක් දුන්න. ඒකයි අර වච්ඡ කියාපු ප්‍රවෘත්තියෙත් සඳහන් වෙන්නෙ. බුදුරජාණන්වහන්සෙ දුන්න විවරණය අර සතරකොන් ප්‍රශ්නය අනුව ගිය විවරණයක් නොවෙයි. අමුතුම විවරණයක්. **'අච්ඡෙච්ඡි තණ්හං වාවත්තයි සංයෝජනං, සම්මා මානාභිසමයා අන්තමකාසි දුක්ඛස්ස'**. 'තණ්හාව කපා හැරිය. 'භව කොකු' - භවයට සම්බන්ධවුනු කොකු - අනිත් පැත්තට හැරෙව්ව. මානය හරියට තේරුම් ගැනීමෙන් දුක කෙළවර කළා'. කියන අන්න ඒ විවරණයයි දුන්නෙ. ඒකයි එතකොට නියම උත්තරය. අර හතර කොනෙන් එකක්වත් නොවෙයි. මෙන්න මේ කාරණය ඉතාමත්ම වැදගත් දෙයක් වෙනව. මක්නිසාද? **'භවනෙත්ති'** කියන මේ තණ්හාව කපා හැරීම, සිඳ දැමීම. තණ්හාව කපා හැරීමෙන් වෙන්නෙ භවය යා කරන සංයෝජන ක්‍රියාවිරහිත වීමක්. කොකු ආ පස්සට හැරෙව්ව වගේ. 'භව සංයෝජන ක්ෂය' කියල කියන්නෙත් ඒකයි. ඊළඟට තවත් හොඳ අදහසක් කියැවෙනව මෙතන - **'සම්මා මානාභිසමයා'** මේ අස්මිමානයේ යථා ස්වභාවය තේරෙන්නෙ අවිද්‍යාව ඉවත්වීම හා සමඟයි. මානය හරියට තේරුම් ගත්තාම මානය එතනම ඉවරයි. හරියට අඳුර තියන තැනකට ලාම්පුවක් අරං ගියා වගේ. එතකොට 'සම්මා මානාභිසමයා' මානය හරියට තේරුම් ගැනීමෙන්ම, 'අන්තමකාසි

දුක්ඛස්ස' - දුක පිළිබඳ ප්‍රශ්නයක් නේ තිබුණේ. දුකයි කෙළවර වුනෙ. 'එච්චරයි කියන්න තියෙන්නෙ' - කියන එකයි. මෙයිනුත් අපට වැදගත් කාරණා රාශියක් හෙළිවෙනව. නමුත් මීටත් වඩා හේතු සාධක සහිතව බුදුපියාණන්වහන්සේ මේ ප්‍රශ්නයට පිළිතුරු දීල තියෙනව අග්ගිවච්ඡගොත්ත සූත්‍රයෙ - මජ්ඣිම නිකායෙ.[8]

අග්ගිවච්ඡගොත්ත සූත්‍රයෙ පැහැදිලිවම මේ ප්‍රශ්නය ඉදිරිපත් කරල තියෙන්නෙ 'හොති තථාගතො පරම්මරණා' ආදී චතුෂ්කෝටික රටාවට අනුවයි. අනිත් මහණ බමුණන් නම් කල්පනා කළේ දිය යුතු පිළිතුර මේ හතරෙන් එකක් විය යුතුයි කියල. අවශ්‍යයෙන්ම මේ හතරෙන් එකක් විය යුතුයි කියල. මෙයින් පිට පිළිතුරක් දෙන්න බැහැ කියන අදහසක් ඔවුන් තුළ තිබුණා. මරණින් මතු තත්ත්වය පිළිබඳව වූ මේ සතරකොන් ප්‍රශ්නයට බුදුරජාණන් වහන්සෙ පිළිතුරු නොදී ඒක පැත්තකට කළා - '**ඨපිතානි**'. ඒව ප්‍රතික්ෂේප කළා - '**පටික්ඛිත්තානි**'. ඒ විදියට විවරණය කළේ නැහැ - '**අව්‍යාකතානි**', කියන කාරණයයි මේ සූත්‍රවල නිතරම සඳහන් වෙන්නෙ.

එතකොට මෙන්න මේක ලොකු ගැටලුවක් උනා, මේ හතරට මොකද පිළිතුරු නොදෙන්නෙ කියන එක. අන්‍යතීර්ථකයින් පමණක් නොවෙයි, මේ ශාසනයේ භික්ෂූන්වහන්සේලා පවා - මාලුඞ්ක්‍යපුත්ත කියන භික්ෂූන් වහන්සේ නමක් බුදුරජාණන් වහන්සෙට අභියෝග කළා. බොහොම තදින්ම අභියෝග කළා, "මේ ප්‍රශ්න හතරෙන් එකකට පිළිතුරු දෙන්න. එහෙම නැත්නම් දන්නෙ නැතිබව කියන්න" කියල.[9] එතරම් උග්‍ර විධියට අභියෝග කළේ මක්නිසාද? මේ හතරෙන් එකක් සත්‍ය විය යුතුය යන හැඟීමක් ඒ අය තුළ තිබුන නිසයි. මේ හතරත් එක්කම ඇඳල තිබෙන තවත් ප්‍රශ්න හයක් තිබෙනව. ඒ කියන්නෙ, කොටින්ම ප්‍රශ්න දහයක්ම තිබෙනව බුදුරජාණන් වහන්සේ 'අව්‍යාකත' වශයෙන් පිළිතුරු නොදී පැත්තකට කළ. දැන් ඒ හයත් යන්තමින් නමුත් මෙතෙන්දි කිට්ටු කර ගන්න ඕන. ඒ මොකද? වැදගත් කාරණා රාශියක් එයිනුත් මතුකරගන්න පුළුවන් නිසා. ඒ හය මොනවද? ඒ හය ඇත්තවශයෙන්ම උභතෝකෝටික යුගල තුනක්. අවසානයෙ තියෙන්නෙ 'චතුෂ්කෝටික' සතරකොන් ප්‍රශ්නයක්. මුලින් තියෙන උභතෝකෝටික ප්‍රශ්න යුගල තුනෙන් පළමුවෙනි යුගලය තමයි '**සස්සතො ලොකො**', **අසස්සතො ලොකො**' - 'ලෝකය සදාකාලිකය' ලෝකය සදාකාලික නොවේය. දෙවෙනි යුගලය: '**අන්තවා ලොකො**', '**අනන්තවා ලොකො**' - 'ලෝකය කෙළවරක් සහිතය' ලෝකය කෙළවරක් රහිතය'. ඊළඟ යුගලය: '**තං ජීවං තං සරීරං**', '**අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං**' 'ජීවයත් ශරීරයත් එකක්මය. ජීවය එකක්ය, ශරීරය අනිකක්ය.' මෙතන ජීව කියල

යොදල තියෙන්නෙ 'ආත්මය' කියන අදහසින්. එතකොට වඩා තේරෙන භාෂාවෙන් කීවොත්, 'ආත්මයත් ශරීරයත් එකක්ය' 'ආත්මය එකකි, ශරීරය අනිකකි.' ඒ කියන්නෙ ඒ දෙක එකිනෙකට වෙනස්ය කියන එකයි. ඔන්න ඔය විධියෙ උභතෝකෝටික ප්‍රශ්න හයකුත් චතුෂ්කෝටික ප්‍රශ්න හතරකුත් අව්‍යාකෘත ප්‍රශ්න නමින් හැඳින්වෙනව. සමහරවිට පසේනදි කොසොල් රජ්ජු වැනි රජවරුත්, ඒ වගේම අන්‍යතීර්ථක ශ්‍රමණ බ්‍රාහ්මණයිනුත් අසනව මේ ප්‍රශ්න දහය. මේ ප්‍රශ්න දහයට පිළිතුරු ලබා ගන්න හුඟක් දෙනෙක් උත්සාහ කරනව. එතකොට, මේවට පිළිතුරු නොදීමට හේතු - නොදුන්නෙ මක්නිසාද කියන එක - මේ කාරණාව යට බොහොම වටිනා ගැඹුරු ධර්මකාරණා රාශියක් සැඟවිල තිබෙනව. බුදුරජාණන් වහන්සේ මේවට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කිරීමට එක හේතුවක් හැටියට බොහොම දෙනෙක් කියන්නෙ - අර මාලුඞ්කයපුත්ත ස්වාමීන් වහන්සෙ වගෙ - 'නොදන්න නිසා'. මේවට උත්තර දෙන්න බැරිනිසා උත්තර නොදී පැත්තකට කළා කියන එක. ඊළඟට තවත් හේතුවක් සමහර කෙනෙක් දක්වනව. 'ඒ නොදන්න නිසා නොවෙයි මේ ප්‍රශ්නවලට පිළිතුරු බුදුරජාණන් වහන්සේ දැනගෙන හිටිය. නමුත් අපට දේශනා කළේ නැත්තෙ ඒව නිවනට අවශ්‍ය නැති නිසයි'. දන්නව, නමුත් නිවනට අවශ්‍ය නැති නිසා අපට දේශනා කළේ නැත. ඒකට සාධක වශයෙන් සමහර කෙනෙක් ප්‍රකාශ කරනව, කිට්ටු කරගන්නව මේකට, අර සංයුත්ත නිකායෙ සච්ච සංයුත්තයෙ තියෙන 'සිංසපා' සූත්‍රය.[10] ඇට්ටේරිය වනයක බුදුරජාණන් වහන්සේ වැඩවාසය කරන අවස්ථාවක තමන් වහන්සෙගෙ අතට ඇට්ටේරිය කොළ අහුරක් අරගෙන සංඝයා වහන්සේලාගෙන් ඇහුව 'මේ අතේ තිබෙන කොළ ප්‍රමාණයද වැඩි, උඩ ගස්වල තිබෙන කොළද වැඩි කියල. සංඝයා වහන්සේල ප්‍රකාශ කළා, "අතේ තියෙන්නෙ කොළ බොහොම ටිකයි. ඉහළ ගස්වලයි වැඩිපුර කොළ තියෙන්නෙ". ඊළඟට බුදුරජාණන් වහන්සේ මෙන්න මෙහෙම ප්‍රකාශයක් කළා: **'එවමෙව බො භික්ඛවෙ එතදෙව බහුතරං යං වො මයා අභිඤ්ඤාය අනක්ඛාතං, අප්පමත්තකං අක්ඛාතං'** 'එසේම මහණෙනි, මෙයම වැඩිදෙයය, මොකක්ද? මා අභිඥාවෙන් දැනගත් නමුත් ප්‍රකාශ නොකළ කරුණුය වැඩි, අර ගස්වල තියෙන කොළ වගේ. 'අප්පමත්තකං අක්ඛාතං' - 'අභිඥාවෙන් දැනගෙන ප්‍රකාශ කළේ ඉතාම ටිකයි, අතේ තියෙන කොළ වගේ'.

මේ උපමාව අනුව අපි තේරුම් ගන්න ගියොත්, අපට කියන්න වෙනව, 'මේ ප්‍රශ්න දහයට පිළිතුරු දෙන්න පුළුවන්. මේ ප්‍රශ්න හරි. ඒව අපට නොකිව්වෙ - අර වැඩිහිටියෙක් කුඩා දරුවකුට නොකියන දේවල් වගේ - යම්කිසි රහසක් නිසයි' කියල. නමුත් මේකත් නොවෙයි හේතුව. මේ දහය

නිවනට අදාළ නොවන බව නම් ඇත්ත. නමුත් තවත් හේතුවක් තියෙනව, මේ ප්‍රශ්න දහයම යම්කිසි මිථ්‍යා පදනමක් උඩයි ගොඩනැගිල තියෙන්නෙ. යම්කිසි මිථ්‍යා දෘෂ්ටියක් අනුව ඇතිවුනු නිගමන දහයක් මෙතන තියෙන්නෙ. මේවට උත්තර දුන්නොත් ඒ මිථ්‍යා පදනම පිළිගත්ත වෙනව. මිථ්‍යා දෘෂ්ටියට අහුවුනා වෙනව. උත්තර දෙන තැනැත්තා කොටු කරන විදියෙ ක්‍රමයක් මේ ප්‍රශ්නවල තිබෙන්නෙ. ඒක නිසා තමයි අර උභතෝකෝටික චතුෂ්කෝටික වශයෙන් - දෙකොන්, සතරකොන් වශයෙන් - මේ ප්‍රශ්න, ඉදිරිපත්වෙලා තියෙන්නෙ. මේවට බුදුරජාණන්වහන්සේ 'අහුවුනේ' නැහැ. ඒකයි හේතුව. මේක අපි තවත් ටිකක් විමසලා බැලුවොත්, පළමුවෙනි ප්‍රශ්න යුගලය: **'සස්සතො ලොකො'**, **'අසස්සතො ලොකො'**. 'ලෝකය සදාකාලිකය', එහෙම නැත්නම්, 'ලෝකය සදාකාලික නොවේය'. මෙතනින් කියැවෙන්නෙ ලෝකය, කාලය අනුව විග්‍රහ කිරීමක්. ඊළඟ යුගලය: 'අන්තවා ලොකො', 'අනන්තවා ලොකො' - 'ලෝකයේ කෙළවරක් ඇත'. 'ලෝකයේ කෙළවක් නැත'. මේ ප්‍රශ්න යුගල දෙක, ඒ කියන්නෙ, මේ මුල් ප්‍රශ්න හතර, ලෝකය පිළිබඳවයි. මේවට බුදුරජාණන්වහන්සෙ පිළිතුරු නොදුන්නෙ මක්නිසාද කියල අපි ටිකක් විමසල බලමු. මේ ශාසනයේ 'ලෝකය' කියන වචනයට අමුතුම හැඳින්වීමක් දීල තියෙනව. **'අරියස්ස විනයෙ'** - දැන් බොහෝ අවස්ථාවල මේ බුද්ධශාසනයට අදාළ හැටියට යම්කිසි වචනයකට නිර්වචනය සපයනකොට- එය හඳුන්වන ආකාරය ඉදිරිපත් කරනකොට - බුදුරජාණන්වහන්සෙ 'අරියස්ස විනයෙ' කියල දක්වනව. 'අරියස්ස විනයෙ ලොකො'. එතකොට ආර්‍ය ව්‍යවහාරයට අනුව, එහෙම නැත්නම් ආර්‍ය ශික්ෂණයට අනුව, ලෝකය හඳුන්වන්නෙ අර සාමාන්‍ය ලෝකයා ලෝකය හඳුන්වන විධියට නොවෙයි. ආර්‍ය ව්‍යවහාරයට අනුව ලෝකය හටගත්තෙ සළායතනයේ බව අපි කලින් අවස්ථාවකත් ප්‍රකාශ කළා. **'ඡසු ලොකො සමුප්පන්නො'**[11]. මේ සළායතනය තුළයි ලෝකය හටගෙන තිබෙන්නෙ. මේ සළායතනයම ලෝකයයි. මේ කාරණය කොයිතරම් වැදගත්ද කියතොත්, සළායතන සංයුත්තයෙ සූත්‍ර රාශියක් තිබෙනව, භික්ෂූන් වහන්සෙල ඉදිරිපත් වෙල බුදුරජාණන් වහන්සෙගෙන් අහනව: මේ 'ලෝකය', 'ලෝකය' කියල හැමෝම කියනව, මොකක්ද මේ ලෝකය කියල කියන්නෙ? අපි කීපයක් විතරක් මෙතෙන්දි එළියට ගනිමු. සමිද්ධි සූත්‍රයෙ සමිද්ධි ස්වාමීන් වහන්සෙ අහනව: 'ලොකො ලොකොති භන්තෙ වුච්චති. කිත්තාවතා නුඛො භන්තෙ ලොකො වා අස්ස ලොක පඤ්ඤත්ති වා'[12] 'ස්වාමීනි, ලෝකය ලෝකය කියල කියනව, කෙතෙකින් ලෝකයක් හෝ ලෝක ප්‍රඥප්තියක් හෝ වේද?, මෙහෙම ඇසුවාම බුදුරජාණන් වහන්සේ ඊට පිළිතුරු දෙනව: **'යත්ථ ඛො සමිද්ධි අත්ථි චක්ඛු අත්ථි රූපා අත්ථි චක්ඛු විඤ්ඤාණං**

**අත්ථි චක්ඛු විඤ්ඤාතබ්බා ධම්මා. අත්ථි තත්ථ ලොකො වා ලොක පඤ්ඤත්තිවා'.** 'සමිද්ධි, යම්තැනක ඇසක් වේද, රූපයෝ වෙත්ද, ඇස පිළිබඳ විඤ්ඤාණයක් වේද (චක්ඛු විඤ්ඤාණයක් වේද), චක්ඛු විඤ්ඤාණයෙන් දතහැකි ධර්මයෝ වෙත්ද, අන්න එතන ලෝකයක් තිබෙනව, ලෝක ප්‍රඥප්තියක් තිබෙනව. ඒ විදියටම, කණ, නාසය, ආදී අනිකුත් ආයතන පිළිබඳවත් ප්‍රකාශ කරනව. එතකොට ඒ ලෝකය තිබෙන තැනයි බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළේ. ඊළඟට, ඒකෙම අනිත් පැත්ත ප්‍රකාශ කරනව. බුදුරජාණන් වහන්සෙ. **'යත්ථ ඛො සමිද්ධි නත්ථි චක්ඛු නත්ථි රූපා නත්ථි චක්ඛුවිඤ්ඤාණං නත්ථි චක්ඛුවිඤ්ඤාතබ්බා ධම්මා. නත්ථි තත්ථ ලොකො වා ලොක පඤ්ඤත්ති වා'** - 'සමිද්ධි, යම් තැනක ඇස හෝ රූප හෝ චක්ඛු විඤ්ඤාණය හෝ චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයෝ හෝ විද්‍යමාන නොවෙත්ද, එතැන ලෝකයක් හෝ ලෝක ප්‍රඥප්තියක් හෝ නැත'.

මෙයින් අපට තේරුම් ගන්න පුළුවනි, අර ලෝකය සදාකාලිකද කියල කාලය අනුව කෙළවරක් සෙවීමත්, එහි අන්තයක් තියෙනවද කියල දේශ වශයෙන් - අවකාශ වශයෙන් - එහි කෙළවරක් සෙවීමත් එහෙම පිටින්ම මිථ්‍යා දෘෂ්ටියක් පමණයි. මක්නිසාද? සළායතනය තිබෙනතාක් ලෝකයක් තිබෙනව. අන්න ඒක නිසයි බුදුරජාණන් වහන්සේ මේ ලෝකය පිළිබඳ ප්‍රශ්නවලට පිළිතුරු නොදුන්නෙ. තවදුරටත් මේ ලෝකය පිළබඳව දීපු විග්‍රහ තිබෙනව කීපයක්ම. අපි ඒ හැම එකක්ම නැතත්, වැදගත් දෙකක් ඉදිරිපත් කරමු. එක්තරා භික්ෂුවක් බුදුරජාණන් වහන්සේගෙන් ඉල්ලනව ලෝකය පිළිබඳව නිර්වචනයක්, හැඳින්වීමක්: **'ලොකො ලොකොති භන්තෙ වුච්චති. කිත්තාවතා නුඛො භන්තෙ ලොකොති වුච්චති'** ස්වාමීනි, 'ලෝකය', ලෝකය කියල කියනව, කෙතෙකින්ද ලෝකයක් වන්නෙ? බුදුරජාණන් වහන්සෙ ප්‍රකාශ කරනව: **'ලුජ්ජතීති ඛො භික්ඛු තස්මා ලොකොති වුච්චති. කිඤ්ච ලුජ්ජති චක්ඛු ඛො භික්ඛු ලුජ්ජති. රූපා ලුජ්ජන්ති. චක්ඛු විඤ්ඤාණං ලුජ්ජති, චක්ඛු සම්ඵස්සො ලුජ්ජති. යම්පිදං චක්ඛු සම්ඵස්ස පච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි ලුජ්ජති'**[13] 'ලෝක' කියල කියන්නෙ 'ලුජ්ජති' කියන අර්ථයෙන්. '**ලුජ්ජති**' කියන්නෙ 'ලුදු' වෙනව ඒක මේ කාලෙ ව්‍යවහාරයේ නැති වචනයක්. 'පලුදු වෙනව' කියන වචනය නම් තියෙනව. නමුත් 'ලුදුවෙනව' කියන වචනය ව්‍යවහාරයෙන් ඈත්වෙල වගෙයි පෙනෙන්නෙ. 'ලුදු' වෙනව කියල කියන්නෙ බිඳිල යනව. බුදුරජාණන්වහන්සේ සමහර අවස්ථාවලදී අලුත් නිරුක්ති දෙනව වචන වලට, පරණ නිරුක්ති අතහැරල. මොකද, ධර්මානුකූල නිසා. එතකොට, 'බිඳී යනව' කියන අර්ථයෙනුයි 'ලෝකය' කියල කියන්නෙ. 'ලුජ්ජතීති ලොකො' කුමක්ද බිඳී යන්නෙ? ඇස, රූපයන්, චක්ඛු විඤ්ඤාණය, චක්ඛු

සම්ඵස්සය, චක්ඛු සම්ඵස්සය නිසා හටගන්නා සැපදුක් ආදී සියලු වේදයිතයන්. මෙන්න මේ නිසා 'ලුජ්ජති' කියන අර්ථයෙන්, 'ලුජ්ජති' කියන නිරුක්තිය අනුවයි, මේ ශාසනයේ ලෝකය හඳුන්වන්නෙ. ඊළඟට, ආනන්ද ස්වාමීන්වහන්සේත් අහනව මේ ප්‍රශ්නයමː 'ස්වාමීනි, 'ලෝකය', 'ලෝකය' කියල කියනව කෙතෙකින්ද ලෝකයක් වන්නෙ?' කියල. එතකොට, බුදුරජාණන් වහන්සෙ ප්‍රකාශකරනවː '**යං ඛො ආනන්ද.පලොකධම්මං අයං වුච්චති අරියස්ස විනයෙ ලොකො**' 'ආනන්ද, යමක් - 'පලොකධම්මං' අන්න එතන කියවෙනව 'පලුදු' කියන වචනය - යමක් පලුදුවන ස්වභාවය ඇත්තේද, එය මේ ආර්‍ය ශික්ෂණයෙහි, ආර්‍ය ව්‍යවහාරයට අනුව, 'ලෝකය' යයි කියනු ලැබේ. '**කිඤ්ච ආනන්ද පලොකධම්මං**' 'කුමක්ද, ආනන්ද, මේ පලුදුවන ස්වභාවය ඇත්තේ?'. '**චක්ඛුං ඛො ආනන්ද පලොකධම්මං. රූපා පලොකධම්මා. චක්ඛුවිඤ්ඤාණං පලොකධම්මං. චක්ඛුසම්ඵස්සො පලොකධම්මො. යම්පිදං චක්ඛුසම්ඵස්ස පච්චයා. උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි පලොකධම්මං**'[14] 'ඇසත් පලුදුවෙනව, රූපයනුත් පලුදුවෙනව, චක්ඛු විඤ්ඤාණයත් පලුදු වෙනව, චක්ඛු සම්ඵස්සයත් පලුදු වෙනව, චක්ඛු සම්ඵස්සය නිසා ඇතිවන සැපදුක්, නොදුක් - නොසුව වේදයිතයනුත් පලුදු වෙනව'. එතකොට මෙයින් අපට තේරුම් ගන්න පුළුවන්, යමක් නිතර පලුදු වෙනව නම්, මොහොතක් පාසා බිඳී බිඳී යනව නම්, එය ඒකකයක් නොවෙයි. එහෙම ඒකකයක් නොවන දෙයක, සදාකාලිකත්වයක් හෝ කෙළවරක් ඇති බවක් හෝ කියන්න බැහැ. නිතරම පලුදු වෙනව නම්, හැදි-හැදී, බිදි-බිදී යනව නම්, ඒක එකක් හැටියට ගන්නෙ කොහොමද? ඒ ප්‍රශ්නවලට බුදුරජාණන් වහන්සෙ පිළිතුරු දුන්න නම්, අර අන්‍යාගමිකයන් අතර තිබුන ලෝකය කියන ප්‍රඥප්තිය තහවුරු වෙනව. ඒ දෘෂ්ටිය පිළිගත්ත වෙනව. එතකොට මේ අනුව අපට මේ මුල් ප්‍රශ්න හතරට බුදුරජාණන්වහන්සෙ පිළිතුරු නොදීමේ හේතුව තේරුම් ගන්න පුළුවන්.

අපි ඊළඟට බලමු ඊළඟ උභතෝකෝටික ප්‍රශ්නය ගැන. '**තං ජීවං තං සරීරං - අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං**' - 'ආත්මයත් ශරීරයත් එකකි. ආත්මය එකකි. ශරීරය අනිකකි' මේ ප්‍රශ්න යුගලටත් 'ඔව්' හෝ 'නෑ' හෝ කියයුතුමයි කියන එකයි අන්‍යාගමිකයන් අතර තිබුන මතය උනෙ. බුදුරජාණන් වහන්සෙ මේවට පිළිතුරු දුන්න නම් ඒත් අහුවෙනව. ඇත්ත වශයෙන්ම මේ ප්‍රශ්නය උපමා කරන්න පුළුවන් දන් මේ කාලෙ උසාවිවල එහෙම දක්ෂ නීතිඥයින් අහන ප්‍රශ්නවලට. ඒ අය සමහර විත්තිකරුවන්ගෙන්, එහෙම නැත්නම් සාක්ෂි කරුවන්ගෙන්, කටට වචනෙ දීල යම්කිසි ප්‍රශ්නයක් අහනව, තමන්ට ඕන කරන උත්තරේ ලබාගැනීමට. සමහර වෙලාවට

කියනව 'උසාවියෙ කාලය කා දමන්නෙ නැතිව, 'ඔව්' හෝ 'නෑ' හෝ යන කෙටි පිළිතුරක් දෙන්න' කියල. මෙන්න මේ විධියෙ ප්‍රශ්නයක් අහනව විත්තිකරුවකුගෙන්: 'ඔබ දැන් මත්පැන් බීම නතර කරලද? 'ඇත්ත වශයෙන්ම විත්තිකරු කවදාවත් මත්පැන් නොබිව් කෙනෙක් නම්, මෙයා 'ඔව්' කිව්වත් 'නෑ' කිව්වත් මේ තැනැත්තා ඉස්සෙල්ල බේබද්දෙක් වෙලා හිටියයි කියන එක උසාවිය ඉදිරියෙ ඔප්පු වෙනව. ඒක නිසා මේකට උත්තර දෙන්න බැහැ. ඔන්න ඔය විදියෙ දෙයක් තමයි මේ ප්‍රශ්නවලත් තියෙන්නෙ. ආත්මයත් ශරීරයත් එකක්මද? ආත්මය එකක්ද? ශරීරය වෙන එකක්ද? කියල ඇහුවොත් බුදුරජාණන් වහන්සෙ නොපිළිගන්න ආත්මයක්, පිළිගන්ට සිද්ධ වෙනව. මේ ආත්මය කියන එක පෘථග්ජනයන් අතර තිබෙන එහෙම පිටින්ම මෝඩ සංකල්පයක් කියලයි බුදුරජාණන් වහන්සෙ ප්‍රකාශ කරන්නෙ.[15] ඒක නිසා ආත්මයත් ශරීරයත් එකගොඩකට දාල හෝ වෙන්කරල හෝ දක්වීම පිළිබඳ මේ ප්‍රශ්නවලට බුදුරජාණන් වහන්සෙ පිළිතුරු දුන්නෙ නැහැ. ඔන්න ඔය විදියෙම 'හොරයක්', ඔය විධියෙම අඩුපාඩුවක්, මිථ්‍යා පදනමක්, මේ තථාගතයන් වහන්සේ පිළිබඳ ප්‍රශ්නවලත් තියෙනව. ඒක දැනටමත් හුඟක්දුරට අපි ප්‍රකාශකළ කරුණුවලින් පෙනුන. මේ 'තථාගත' කියන වචනයෙන් බුදුරජාණන්වහන්සෙ අදහස් කළේ අන්‍යාගමිකයන් අදහස් කළ කාරණාව නොවෙයි. අන්‍යාගමිකයන් නම් අර සාමාන්‍ය ශ්‍රාවකයාත්, මේ 'තථාගත' කියන 'උත්තම පුරුෂ, පරම පුරුෂ' පුද්ගලයත් යන දෙන්නාම තුළ ආත්මයක් ඇති හැටියට කල්පනා කළා. බුදුරජාණන් වහන්සෙ ඒ විග්‍රහය පිළිගත්තෙ නැහැ. 'තථාගත' කියන වචනයට මහපුදුම විදියෙ ගැඹුරු, සියුම් අන්දමේ අර්ථයක් බුදුරජාණන් වහන්සෙ ඉදිරිපත් කරල තියෙනව. අපට මේක තවදුරටත් පැහැදිලි වෙන්නෙ අපි මේ විවරණය කරන්න බලාපොරොත්තුවන, අග්ගි වච්ඡගොත්ත සූත්‍රයෙන්මයි.

මේ සූත්‍රයෙදි පළමුවෙන්ම වච්ඡගොත්ත පරිබ්‍රාජකයා උත්සාහ කරනව බුදුරජාණන් වහන්සෙගෙන් අර කියාපු ප්‍රශ්න ලැයිස්තුවට - අර දහයට - තමාට ඕන කරන උත්තරය ලබාගන්න. හරියට අර උසාවියෙ කටට වචනෙ දීල අහන ප්‍රශ්න වගේ, මෙන්න මෙහෙම අහනව: 'කින්නුඛො භො ගොතම සස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති එවං දිට්ඨි භවං ගොතමො' - 'කිමෙක්ද, භවත් ගෞතමය, 'ලෝකය ශාස්වතය මෙයම සත්‍යය. අනෙක් සියල්ල බොරුය' යන මේ දෘෂ්ටියද භවත් ගෞතමයන්ගෙ තියෙන්නෙ? "නඛො අහං වච්ඡ එවං දිට්ඨි" - 'නැහැ, වච්ඡ, මගේ එහෙම දෘෂ්ටියක් නැහැ'. ඊළඟට අහනව ඒකට ප්‍රතිවිරුද්ධ එක, ඒකටත් නැහැයි කියනව. ඔහොම දහයටම බුදුරජාණන් වහන්සෙ 'නැත, නැත' කියල පිළිතුරු දෙනව. මේවට මම උත්තර දෙන්නෙ නැහැ කියල පැත්තකින්

තබනව. එතකොට බුදුරජාණන් වහන්සෙගෙන් අහනව වච්ඡගොත්ත පරිබ්‍රාජකයා, 'කවර ආදීනවයක් දකලද මේ ප්‍රශ්නවලට පිළිතුරු නොදෙන්නෙ, කියල. එතකොට බුදුරජාණන් වහන්සෙ මෙන්න මෙහෙම ප්‍රකාශයක් කරනව:

'සස්සතො ලොකොති ඛො වච්ඡ දිට්ඨිගතමෙතං දිට්ඨිගහණං දිට්ඨිකන්තාරං දිට්ඨිවිසූකං දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසඤ්ඤොජනං සදුක්ඛං සවිඝාතං සඋපායාසං සපරිළාහං න නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තති'[16]

මෙතන තිබෙනව අර කියාපු හේතු දෙකම. මේ ප්‍රශ්න නිවනට අදාල නැති බව පමණක් නොවෙයි, මේ ප්‍රශ්නවල යම්කිසි අඩුවක් තිබෙන බවත් මේ පළමුවෙන් කියාපු කොටසෙන් පේනව. බුදුරජාණන්වහන්සෙ ආදීනව හැටියට දක්වන්නෙ මොකක්ද? වච්ඡට ප්‍රකාශ කරනව: 'මම මේ සස්සතො ලොකො ආදී ප්‍රශ්නවලට පිළිතුරු නොදුන්නෙ මේකයි. මේක 'දිට්ඨිගතං' - දෘෂ්ටියක් පමණයි, සත්‍යානුකූල නොවූ යම්කිසි දෘෂ්ටියක් පමණයි. 'දිට්ඨිගහණං' - දෘෂ්ටිවනාන්තරයක්, 'දිට්ඨි කන්තාරං - දෘෂ්ටි කාන්තාරයක් ශුෂ්ක දෙයක්. හිස් දෙයක්. 'දිට්ඨි විසූකං' - දෘෂ්ටි විහිලුවක්, විහිලු දක්මක්. දිට්ඨි විප්ඵන්දිතං දෘෂ්ටි තිගැස්සීමක්, දිට්ඨි සඤ්ඤොජනං - දෘෂ්ටි සංයෝජනයක්, හැකිල්ලක්, බැම්මක්. 'සදුක්ඛං' - ඊළඟට, ඒ වගේම, ඒව ගැන හිතන්න ගියාම දුක් ගෙන දෙනව. 'විඝාතං' - වෙහෙස ගෙන දෙනව. 'උපායාසං' - දැඩි වෙහෙස ගෙන දෙනව. 'පරිළාහං' - දැවිල්ල ඇති කරන විදියෙ ප්‍රශ්න රාශියක්. ඒ වගේම ඒ එකක්වත් නිර්වේදය පිණිස, විරාගය පිණිස, නිරෝධය පිණිස, උපසමය පිණිස, අභිඤ්ඤාව පිණිස, සම්බෝධිය පිණිස, නිර්වාණය පිණිස, හේතුවන්නෙ නැහැ.'

එතකොට අපිට පෙනෙනව මේ ප්‍රශ්නවල මිථ්‍යාපදනමක් තිබෙන බව. මේවා මිථ්‍යාදෘෂ්ටි ගොඩක්. වෙන එකක් තබා, බොහෝ අවස්ථාවල බුදුරජාණන්වහන්සෙ ප්‍රකාශ කරනව: ශ්‍රුතවත් ආර්යශ්‍රාවකයාට මේ ප්‍රශ්න ප්‍රශ්නවත් නොවෙයි කියල. අශ්‍රුතවත් පෘථග්ජනයටයි මේ ප්‍රශ්න පැනනගින්නෙ ලොකු ප්‍රශ්න හැටියට. මක්නිසාද? චතුරාර්යසත්‍යය පිළිබඳව අවබෝධයක් තිබෙනව නම් මේ ප්‍රශ්න අහන්නෙත් නැහැ. මෙන්න මෙයින් අපට පැහැදිලි වෙනව මේ ප්‍රශ්න දහයට බුදුරජාණන්වහන්සෙ පිළිතුරු නොදීමට හේතුව.

එහෙම ප්‍රකාශකරල, බුදුරජාණන් වහන්සේ ඊළඟට තේරුම්කරනව: 'මෙන්න මේ ආදීනව දැකලයි මම මේ ප්‍රශ්න දහයට පිළිතුරු නොදුන්නෙ'. ඒ වගේම තවදුරටත් ප්‍රකාශ කරනව: 'මේ ආදීනව දැකල මම ඒ වෙනුවට කළේ මොකක්ද? රූප වේදනාදී පඤ්චුපාදානක්ඛන්ධයේ උදයව්‍යය - හට ගැනීම නැතිවීම දෙක - දැකීමෙන්, අහංකාර මමංකාර මානානුසයන් දුරුකිරීමෙන්, මේ දුක් කෙළවර කළා, විමුක්ත උනා'. එහෙම තේරුම් කළාට පස්සෙත් වච්ඡගොත්ත අර සතරකොන් ප්‍රශ්නය අනුවම මේ ශාසනයේ විමුක්ත පුද්ගලයා ගැන තේරුම් ගන්න උත්සාහා කරනව. 'එවං විමුත්තචිත්තො පන භො ගොතම භික්ඛු කුහිං උපපජ්ජති?' - 'භවත් ගෞතමයෙනි, ඔය කියාපු විදියට ඔය විමුක්ත වෙන භික්ෂුව කොහේද උපදින්නෙ? එතකොට බුදුරජාණන් වහන්සෙ දෙන පිළිතුර: 'උපපජ්ජතීති ඛො වච්ඡ න උපෙති' - 'උපදියි' යනු වච්ඡ, නොයෙදෙයි'. ඒ ප්‍රශ්නයම ගැලපෙන්නෙ නැහැයි කියන එකයි. ඊළඟට අහනව: 'තෙන හි භො ගොතම න උපපජ්ජති' - 'එහෙනම් භවත් ගෞතමයෙනි නූපදීද? ඒකටත් බුදුරජාණන්වහන්සෙ පිළිතුරු දෙන්නෙ ඒ ප්‍රශ්නයත් ගැලපෙන්නෙ නැහැ කියලයි. ඔය විධියටම, 'උපදනේත් වෙයි නූපදනේත් වෙයි කියන ඒ තත්ත්වයද? 'ඒකටත් මේ ප්‍රශ්නය නොගැලපෙයි කියල වදාළ. 'එහෙමනම් උපදනේත් නොවෙයි, නූපදනේත් නොවෙයි කියන එකද තත්ත්වය? ඒකත් නොගැලපෙයි කියල වදාළ. එතකොට ඔන්න වච්ඡගොත්තට මේක මහ ප්‍රහේලිකාවක්. මේ හතරෙන් එකකට පිළිතුරු ලබාගැනීමට නේ බලාපොරොත්තු උනේ.

මේ ප්‍රහේලිකාව විසඳා දීමට බුදුරජාණන්වහන්සේ මෙන්න මෙහෙම අහනව: 'හොඳයි එහෙනම් වච්ඡ මම නුඹගෙන්ම යම්කිසි ප්‍රශ්නයක් අහන්නම්. ඒකට පුළුවන් හැටියට පිළිතුරු දෙන්න. දැන් නුඹ ඉදිරියෙහි ගින්නක් දැල්වුනොත්, නුඹ දන්නවද තමා ඉදිරියෙහි ගින්නක් දැල්වෙනව කියල? 'ඔව්, මම දන්නව'. කවුරුවත් ඇහුවොත් මේ ගින්න කුමක් නිසාද දැල්වෙන්නෙ කියල, මොකද කියන්නෙ? 'තණකොළ ලී කැබලි උපාදානයක් නිසා මේ ගින්න දැල්වෙනව කියල මම ප්‍රකාශ කරනව'. 'හොඳයි අපි හිතමු මේ ගින්න නිවී ගියා කියල නුඹ ඉදිරියෙ. එතකොට නුඹ දන්නවද මේ ගින්න නිවුනා කියල?', ඔව්, මම දන්නව මේ ගින්න මා ඉදිරියෙ නිවුනා කියල'. 'මේ නිවුනු ගින්න මෙතනින් කොයි දිසාවටද ගියෙ, නැගෙනහිරටද, බටහිරටද, උතුරටද, දකුණටද කියල ඇහුවොත් නුඹ මොකක්ද කියන්නෙ?' අන්න ඒ අවස්ථාවෙ වච්ඡටත් කියන්න සිද්ධ උනා අර 'න උපෙති' කියන වචනය, 'නොයෙදේ' කියන වචනය. 'න උපෙති භො ගොතම' ගැලපෙන්නෙ නැහැ, භවත් ගෞතමය' මක්නිසාද? 'යං හි

**සො භො ගොතම අග්ගි තිණකට්ඨුපාදානං පටිච්ච අජලි. තස්ස ච පරියාදානා අඤ්ඤස්ස ච අනුපාහාරා අනාහාරො නිබ්බුතොත්වෙව සඞ්ඛං ගච්ඡති'** 'මක්නිසාද? භවත් ගෞතමය, ඒ ගින්න යම් තණකොළ ලී කැබලි උපාදානයක් නිසා දැල්වුනේද, ඒවායේ අවසන්වීමෙනුත් අනෙක් දරක් නොලැබීමෙනුත් නිවුණේය යන ගණයට වැටෙයි'. '**නිබ්බුතොති සඞ්ඛං ගච්ඡති**' ආහාර නැතිව, දර නැතිව, නිවුනේය යන සංඛ්‍යාවට වැටේ. 'සඞ්ඛං ගච්ඡති. කියන වැදගත් වචනයක් එතෙන්දි මතු වෙනව. අපි මේක කලිනුත් සාකච්ඡා කළා. 'සංඛං ගච්ඡති' කියන්නෙ ගණන් ගනු ලැබේ කියන එකයි. ගිණීමට හසුවෙයි කියන එකයි. ප්‍රඥප්තියට හසුවෙයි කියන එකයි. එතකොට, නිවුනේය යන සංඛ්‍යාවට වැටේ' කියල කීමට සුදුසු වෙනව. ඒ මිසක්, නිවිල කොහේ ගියාද කියල කියන්න බැහැ. මක්නිසාද? 'නිවීගියේය' කියල කිවූ පමණින්, එය නිවුනට පස්සෙ තවත් කොහේවත් ගියයි කියල හිතුවොත්, ඒක අර භාෂා ව්‍යවහාරය පිළිබඳ එක්තරා විධියක මිථ්‍යා අදහසක් වෙනව. මිථ්‍යා නිගමනයක් වෙනව. භාෂා ව්‍යවහාරය හරියාකාරව තේරුම් නොගැනීමක් වෙනව. '**නිබ්බුතොත්වෙව සංඛං ගච්ඡති**' එතකොට කියන්න වෙන්නෙ නිවුනයි කියන ඒ වචනය පමණයි. ඔන්න ඊළඟට බුදුරජාණන් වහන්සෙ ප්‍රකාශ කරනව:

> **'එවමෙව ඛො වච්ඡ, යෙන රූපෙන තථාගතං පඤ්ඤාපයමානො පඤ්ඤාපෙය්‍ය, තං රූපං තථාගතස්ස පහීනං උච්ඡින්නමූලං තාලාවත්ථුකතං අනභාවකතං ආයතිං අනුප්පාදධම්මං රූපසංඛාවිමුත්තො ඛො වච්ඡ තථාගතො ගම්භීරො අප්පමෙය්‍යො දුප්පරියොගාහො සෙය්‍යථාපි මහා සමුද්දො උප්පජ්ජතීති න උපෙති, න උප්පජ්ජතීති න උපෙති, උප්පජ්ජති ච න ච උප්පජ්ජතීති න උපෙති, නෙව උප්පජ්ජතී න නුප්පජ්ජතීති න උපෙති'**

මෙන්න මේ ප්‍රකාශයේ තියෙනව මහා වටිනා, ගැඹුරු ධර්ම කාරණා රාශියක් අඩංගු වෙලා. වච්ඡගොත්ත අර කාරණය පිළිගත්තට පස්සෙ- අර, ගින්න නිවුනහම නිවී ගියේය කියන ව්‍යවහාරය මිසක් ඒක කොහේ ගියාද කියල කීම නුසුදුසු බව ප්‍රකාශ කළාම - බුදුරජාණන් වහන්සේ ඊටම සම්බන්ධ කරල කියනව, 'එසේම වච්ඡ, යම් රූපයකින් යම් කෙනෙක් තථාගත කෙනෙකුන් පනවාලන්නේද තථාගත කෙනෙකුන් පිළිබඳව යම්කිසි රූපයක් මෙන්න මේ රූපය තථාගතයන්ගේ යයි පනවන්නේද, එබඳු ඒ රූපය තථාගතයන් වහන්සේ පිළිබඳව, '**පහීනං**' - - ප්‍රහීනය. අතහරින ලද්දේය. '**උච්ඡින්නමූලං**' - මුලින් සිඳින ලද්දේය. '**තාලාවත්ථුකතං**' 'වාස්තු

වත්‍ථු, කියල කියන්නෙ ඉඩමට. තාල+අවත්‍ථු +කතං' කියන්නෙ තල්ගහ උගුල්ලල කෙලින් හිටවල තියෙනව, හරියට නිකං, හැදෙන ගහක් වගේ පිටට පේන්නෙ, **'අනභාවකතං'** - **'නැති'** බවට පමුණුවන ලද, **'ආයතිං අනුප්පාදධම්මං'** නැවත නූපදනා බවට පත්කළ. අන්න එබඳු ඒ තත්ත්වයට පත්කළාම, **'රූපසංඛාවිමුත්තො බො තථාගතො'** එතකොට තථාගතයන් වහන්සේ රූපය වශයෙන් ගණන් ගන්න බැරි වෙනව. රූප සංඛ්‍යාවෙන් මිදෙනව. රූප යන ප්‍රඥප්තියෙන් මිදෙනව. ඒ මිදීම නිසාම, **'ගම්භීරො අප්පමෙය්‍යො දුප්පරියොගාහො සෙය්‍යථාපි මහා සමුද්දො'** - ඒ තථාගතයන් වහන්සේ **'ගම්භීරෝ'** ගැඹුරු කෙනෙක් වෙනව, **'අප්පමෙය්‍යො'** - ප්‍රමාණ කළ නොහැකි, මිනිය නොහැකි. **'දුප්පරියොගාහො'** - ගැඹුරු මනින්න බැරි, **'සෙය්‍යථාපි මහාසමුද්දො'** - හරියට මහා සමුද්‍රය වගේ. එම නිසාම තථාගතයන් වහන්සේ උපදියි කියල හෝ නූපදියි කියල හෝ උපදනේත් වෙයි නූපදනේත් වෙයි කියල හෝ ඒ දෙකම නොවන්නේය කියල හෝ කියන්න බැහැ. මෙතන මේ රූපය ප්‍රහීන වෙන්නෙ මරණයෙන් නොවෙයි. රූපය විනාශවීමක් නොවෙයි මෙයින් හැඟෙන්නෙ. තණ්හාව නැති කිරීමයි. ඒ බව අපට පැහැදිලි වෙනව - තණ්හාව නැති කිරීමෙන්ම රූපය මුලින් සිඳෙන බව ප්‍රකාශ වෙනව - ඛන්ධ සංයුත්තයේ එන රාධ සංයුත්තයෙන්. බුදුරජාණන් වහන්සෙ ප්‍රකාශ කරනව: 'රූපෙ බො රාධ යො ඡන්දො යො රාගො, යා නන්දි, යා තණ්හා, තං පජහථ. එවං තං රූපං පහීනං භවිස්සති උච්ඡින්නමූලං තාලාවත්‍ථුකතං අනභාවකතං ආයතිං අනුප්පාදධම්මං,[17] රාධ, රූපය පිළිබඳව යම් ඡන්දයක්, රාගයක්, නන්දි නම් වූ සතුටක්, තණ්හාවක් වෙයිද, එය දුරලන්න. මෙන්න මේ විධියටයි රූපය ප්‍රහීන වෙන්නෙ. මුලින් සිඳින ලද්දක් වෙන්නෙ. උගුලා තැබූ තල් ගහක් වගේ වෙන්නෙ. නැති බවට පත්වෙන්නෙ. නැවත නූපදනා බවට පත්වෙන්නෙ'. එතකොට, මේ පඤ්චුපාදානක්ඛන්ධය රහතන් වහන්සේගේ මරණයෙන් නැතිවෙන දෙයක් හැටියටයි සාමාන්‍ය ලෝකයා කල්පනා කරන්නෙ. නමුත් රහතන් වහන්සේ කියල අපි ව්‍යවහාර කළාට, හරියට උගුල්ලල තැබූ තල්ගහක් වගේ. ඒක ඈතට පෙනෙන නිසා තල්ගහක් හැටියට, කෙනෙක් හිතාගන්නව ඇත්තටම තල්ගහක්ය කියල. ඒ වගේම, **'තථාගත'** කියන වචනයට ගැලපෙන සත්ත්වයෙක්, තැනැත්තෙක් ඇත්තවශයෙන්ම සිටිනව කියල හිතාගන්නව. මෙන්න මේකයි, එතකොට, මේ කොටසින් අපට වැටහෙන්නෙ. මේකටම අදාළ වටිනා ගැඹුරු කාරණා රාශියක් මේ පාඨය තුළින් අපට මතුකරගන්නට පුළුවන්. නමුත් කාලය මදි නිසා අදට මෙතනින් නතර කරනව.

# අධෝලිපි

1. අං.නි. IV 122 පිට (බු.ජ.21)
2. ධ.අ. 2-503 පිට (හේ.මු.)
3. සු.නි. 334 පිට (බු.ජ.25)
4. ම.නි. I 350 පිට (බු.ජ.10)
5. චූල මාලුඩක්‍ය සු.ම.නි. II 152 පිට: අග්ගි වච්ඡගොත්ත සු.ම.නි. II 256 පිට (බු.ජ.11)
6. සං.නි. IV 700 පිට (බු.ජ.16)
7. සා.ප. III 107 පිට (හේ.මු.)
8. ම.නි. II 256-264 පිට (බු.ජ.11)
9. ම.නි. II 152-154 පිටු (බු.ජ.11)
10. සං.නි. V - 2-294 පිට (බු.ජ.17-2)
11. සං.නි. I 76 පිට (බු.ජ.13)
12. සං.නි. IV 88 පිට (බු.ජ.16)
13. සං.නි. IV 118 පිට (බු.ජ.16)
14. - එම - 120 පිටුව
15. අලගද්දූපම සු.ම.නි. I 344 පිට (බු.ජ.10)
16. ම.නි. I 260 පිට (බු.ජ.11)
17. සං.නි. III 348 පිට (බු.ජ.15)

# 21 වන
# දේශනය

# 21 වන දේශනය

" නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස"

"එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාරසමථො සබ්බූපධි පටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං"

"මෙය ශාන්තය මෙය ප්‍රණීතය එනම් සියලු සංස්කාරයන්ගේ සංසිඳීම, සියලු උපධීන් අතහැර දැමීම, තණ්හාව ක්ෂය කිරීම, නොඇල්ම නම් වූ විරාගය, නැවැත්ම නම් වූ නිරෝධය, නිවීම නම් වූ නිබ්බානය"

අතිපූජනීය මහෝපාධ්‍යාය මාහිම්පාණන් වහන්සේ ප්‍රධාන ගරුතර යෝගාවචර මහා සංඝරත්නයෙන් අවසරයි. නිබ්බාන යන මාතෘකාව යටතේ පවත්වනු ලබන දේශනා මාලාවේ විසි එක්වන දේශනයයි මේ.

බුදුරජාණන් වහන්සේ 'ඔව්' හෝ 'නැහැ' හෝ යනුවෙන් ඒකාන්ත වශයෙන් පිළිතුරක් නොදුන්, පසෙකින් තැබූ, අව්‍යාකත ප්‍රශ්න දහය - විවරණය නොකළ ප්‍රශ්න දහය - ගැන පසුගිය දේශනයේදී අපි තරමක් දුරට සාකච්ඡා කළා. ඒ ප්‍රශ්නවලට බුදුරජාණන් වහන්සේ පිළිතුරු නොදීමට හේතුව වශයෙන් අපි දැක්වූයේ ඒ ප්‍රශ්න යම්කිසි මිථ්‍යා දෘෂ්ටි - මිථ්‍යා මත - උඩ පදනම් වී තිබීමයි. ඒ මිථ්‍යා දෘෂ්ටි වලට තුඩු දෙන නිසා ඒ ප්‍රශ්නවලට අර විධියේ නිශ්චිත පිළිතුරක් දීම ඒ දෘෂ්ටි තහවුරු කිරීමක් වෙනව. අන්න ඒක නිසා බුදුරජාණන් වහන්සේ ඒවා කිසිවකට ඒකාන්ත පිළිතුරක් දුන්නෙ නැහැ. ශාස්වත දෘෂ්ටියත් උච්ඡේද දෘෂ්ටියත් මේ ප්‍රශ්න තුළින් එබිකම් කරන හැටි ගියවර දේශනයෙන්මත් තරමක් දුරට පැහැදිලි වෙන්ට ඇති. අපේ මාතෘකාවට කෙළින්ම අදාළවන 'තථාගතවරයාගේ මරණින් මතු තත්ත්වය' පිළිබඳ චතුෂ්කෝටි ප්‍රශ්නය - ඒ කියන්නෙ සතරකොන් ප්‍රශ්නය - තුළිනුත් එබිකම්පාන්නෙ මේ කියාපු ශාස්වත දෘෂ්ටියත් උච්ඡේද දෘෂ්ටියත්. ඒවාට ඒකාන්ත පිළිතුරක් දුන්න නම් බුදුරජාණන් වහන්සේත් ඒ දෘෂ්ටි වලට අහු වෙනව. බුදුරජාණන්වහන්සේ ලෝකයාට හෙළිකොට වදාළ මධ්‍යම ප්‍රතිපදාව මේ අන්ත දෙක ඉක්මවූවක්. මේ අන්ත දෙකෙන් කොටස් අරගෙන පුරුද්දා සාදාගත් මැදුම් මඟක් නොවෙයි. ඒ විධියේ මැදුම් මඟක් නම්, බුදුරජාණන් වහන්සේට අර ප්‍රශ්න හතරෙන් පසුව සඳහන් වන ප්‍රශ්න දෙකට 'තථාගතයන් වහන්සේ මරණින් මතු වෙයි සහ නොවෙයි' නැත්නම්, 'වෙයිත් නොවෙයි නොවෙයිත් නොවෙයි' වැනි අඩාල විසඳුමක් ඉදිරිපත් කරන්න තිබුන. නමුත් බුදුරජාණන් වහන්සේ එහෙම නොකර ඒ ප්‍රශ්න සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කළා. ඒ වෙනුවට

බුදුරජාණන් වහන්සේ කළේ චතුරාර්ය සත්‍ය දේශනාවට පදනම් වූ පටිච්ච සමුප්පාද ධර්ම න්‍යායය මතුකර දෙන අමුතුම විවරණ මාර්ගයකින් ඒ ප්‍රශ්නවල මිථ්‍යා ස්වරූපය හෙළිකර දීමයි.

මජ්ඣිම නිකායේ අග්ගිවච්ඡගොත්ත සූත්‍රයේදී බුදුරජාණන් වහන්සේ ඒ වච්ඡගොත්ත පරිබ්‍රාජකයා තථාගතවරයාගෙ මරණින් මතු තත්ත්වය ගැන ඇසූ ප්‍රශ්නයට දුන්න අවසාන නිගමනය අපි එදා සඳහන් කළා - ඒ නිගමන පාඨය. නමුත් ඒ ගැන සෑහෙන පමණ සාකච්ඡා කරන්න කාලය මදි උනා. ඒක නිසා අපි නැවතත් ඒ ඡේදය ඉදිරිපත් කරගනිමු. ඒ අර වච්ඡගොත්ත පරිබ්‍රාජකයා පිළිගත්තහම අර නිවුන ගින්න අහවල් දිසාවට යනව කියල කීම නොගැලපෙන කියමනක් කියල, 'න උපෙති' කියල පිළිගත්තහම, ඒ වගේම 'නිබ්බුතො' කියන වචනය ඒක හුදෙක් සංඛාවක් ගිණීමක් පමණක් බව පිළිගත්තහම, බුදුරජාණන් වහන්සේ ඒකටම අල්ලල ඊ ළඟට දෙනව විසඳුම: 'එවමෙව ඛො වච්ඡ යෙන රූපෙන තථාගතං පඤ්ඤාපයමානො පඤ්ඤාපෙය්‍ය තං රූපං තථාගතස්ස පහීනං. උච්ඡින්නමූලං තාලාවත්ථුකතං අනභාවකතං ආයතිං අනුප්පාද ධම්මං. රූප සංඛා විමුත්තො ඛො වච්ඡ තථාගතො ගම්භීරො අප්පමෙය්‍යො දුප්පරියොගාහො සෙය්‍යථාපි මහාසමුද්දො. උප්පජ්ජතීති න උපෙති න නෙව උප්පජ්ජති න නඋප්පජ්ජතීති න උපෙති' - අරකටම සම්බන්ධ කරල- එසේම වච්ඡ, යම් රූපයකින්, තථාගත කෙනෙකුන් පණවන්නේ පණවාලිය හැක්කේද එබඳු ඒ රූපය, තථාගතයන් වහන්සේ පිළිබඳව ප්‍රහීනය - ප්‍රහානය කරන ලද්දේය. උච්ඡින්නමූලං - මුලින් සිඳින ලද්දේය. මුලින් සිඳින ලද ගසක් මෙන් කරන ලද්දේය. තාලාවත්ථුකතං - උගුලා තබන ලද තල් ගසක් බවට පත් කරන ලද්දේය. අනභාවකතං - නොපවත්නා බවට පත් කරන ලද්දේය. 'රූප සංඛා විමුත්තො ඛො වච්ඡ තථාගතො, ගම්භීරො අප්පමෙය්‍යො දුප්පරියොගාහො සෙය්‍යථාපි මහා සමුද්දො' - වච්ඡ තථාගත තෙම රූප සංඛ්‍යාවෙන් විමුක්තය රූපය කියල ගණන් ගැනීම් වශයෙන් - ගිණීමක් කිරීමෙන් - විමුක්තය. 'ගම්භීරො, අප්පමෙය්‍යො දුප්පරියොගාහො සෙය්‍යථාපි මහාසමුද්දො - මහා සමුද්‍රය මෙන් ගැඹුරුය, ප්‍රමාණ කළ නොහැකිය ගැඹුර මිනිය නොහැකිය. එමනිසා 'උප්පජ්ජතීති න උපෙති - එමනිසා අර කියාපු හතර විධියට - අර සතර කොන් ප්‍රශ්නයට-ගැලපෙන්නෙ නැහැ, කියන එකයි. උපදීය කියල කියන්නත් බැහැ. නූපදීය කියල කියන්නත් බැහැ. උපදින්නේත් වෙයි නූපදින්නේත් වෙයි කියල කියන්නත් බැහැ. උපදින්නේත් නොවෙයි නූපදින්නේත් නොවෙයි කියල කියන්නත් බැහැ.

ඒ විධියටම, ඒ රූපය ගැන කිව්ව වගේම, රූපස්කන්ධය ගැන කිව්ව වගේම, වේදනාව ගැනත් සඤ්ඤාව ගැනත් සංස්කාර ගැනත් විඤ්ඤාණය ගැනත් මේ පඤ්චස්කන්ධය - පඤ්ච උපාදාන ස්කන්ධය - පිළිබඳවම බුදුරජාණන් වහන්සේ ඒ විධියට දක්වූවා. එතකොට මෙතෙන්දි අපට පැහැදිලි වෙනව මේ ශාසනයේ තථාගතවරය රූප වේදනා ආදී ඒ කිසිම ස්කන්ධයක් අනුව ගණන් ගැනීමට නොහැකි බව. මේ උපමා වලින් හොඳට පැහැදිලි වෙනව තථාගතවරයාගේ තත්ත්වය - හරියට අර ගස පිළිබඳ උපමාවමයි - මුලින් සිඳින ලද ගසක් වගෙයි. මුලින් සිඳින ලදුව කෙලින් තියෙනව නම් ගහක්, ඒක දක්කහම කෙනෙක් හිතනවා, ඒකට ඇත්ත වශයෙන්ම රැවටෙනව, සාමාන්‍ය ගහක් කියල. ඒ වගේම උගුලන ලද තල් ගහක් තවමත් කෙලින් තියෙනව නම් ඒකටත් සමහර විටක මේ වැඩෙන තල් ගසක් කියල හිතනව. අන්න ඒ විධියට මේ තථාගතවරය පිළිබඳව ලෝකයා හිතන්නෙත් ඒ ආකාරයටයි.

මෙන්න මේ ගස පිළිබඳ උපමාව අපට නැවතත් මතක් කරල දෙනව ඉසිදත්ත ථෙර ගාථාව. මේ කාරණය හෙළිවෙන වටිනා ගාථාවක්.

> පඤ්චක්ඛන්ධා පරිඤ්ඤාතා - තිට්ඨන්ති ඡින්නමූලකා
> දුක්ඛක්ඛයො අනුප්පත්තො - පත්තො මෙ ආසවක්ඛයො.[1]

ඒකෙ තේරුම: පඤ්චක්ඛන්ධා පරිඤ්ඤාතා' - පිරිසිඳ දනගන්නා ලද පඤ්චස්කන්ධයෝ, ස්කන්ධ පහ, තිට්ඨන්ති ඡින්නමූලකා' මුලින් සිඳින ලදුව කෙලින් සිටිත් කියන එකයි. 'දුක්ඛක්ඛයො අනුප්පත්තො' දුක් කෙළවර කිරීමට ළඟාවීමි. 'පත්තො මෙ ආසවක්ඛයො' ආශ්‍රවක්ෂය නම් වූ නිවනට පැමිණියෙමි. එයිනුත් හැඟෙනව රහත් වුනාම ඔන්න ඔය විධියෙ තත්ත්වයක් තියෙන්නෙ - මහ පුදුම විධියෙ තත්ත්වයක්. දැන් මෙතන මේ සංඛා කියන වචනය විශේෂයෙන් වැදගත් වෙනව. අපි අර පපඤ්ච කියන වචනය ගැන සාකච්ඡා කළ අවස්ථාවෙ පපඤ්ච සංඛා කියන වචනයක් ඉදිරිපත් උනා. පපඤ්ච සංඛා - පපඤ්ච සඤ්ඤා සංඛා, එතෙන්දි අපි මේ සංඛා කියන වචනය ගැන හුඟක් දුරට විස්තර කළා. සංඛා කියන එකට සමානයි සමඤ්ඤා, පඤ්ඤත්ති කියන පදත්. සංඛා, සමඤ්ඤා, පඤ්ඤත්ති කියන්නෙ සමානාර්ථවත් - බොහෝදුරට කිට්ටු කිට්ටු අර්ථ ඇති -පදයි. ගිණීම්, හැඳින්වීම්, පැණවීම්, ගණන් ගැනීම්, හඳුන්වා දීම්, පැණවීම්. එතකොට අර බුදුරජාණන් වහන්සේ දුන් නිගමන පාඨයෙන් පැහැදිලි වෙනව මේ සාසනයේ තථාගතවරය රූප වශයෙන් ගණන් ගන්නත් බැහැ. රූප ස්කන්ධය තිබුනත්. වේදනා වශයෙන් ගණන් ගන්නත් බැහැ. වේදනා

වින්දත්. සඤ්ඤා ස්කන්ධය වශයෙන් ගණන් ගන්නත් බැහැ, මේ තථාගතයන් වහන්සෙය කියල සඤ්ඤාවෙන් අඳුනගන්නත් බැහැ, සංස්කාර වලින්වත්, විඤ්ඤාණයෙන්වත් බැහැ. එතකොට මෙන්න මේ විධියෙ පැණවීම් ගණන්ගැනීම් කියන ඒව කිරීමට නම් යම්කිසි ද්වයතාවක් අවශ්‍ය වෙනව - ද්වයතාවක් - දෙකක් පිළිබඳව - ඒක අපි කලින් අවස්ථාවක ප්‍රකාශ කළා මේ ද්වයතා පිළිබඳ යම්කිසි ධර්මතාවක්. දැන් ඔන්න ඉතාමත් සුළු නිදසුනක් වශයෙන් කිව්වොත් සාමාන්‍යයෙන් බඩුවක් පවා මිළ කරන්න පුළුවන් වෙන්නෙ සැපයුමත් ඉල්ලුමත් අතර වට්ටයක් කරකැවෙනව නම් තමයි. ඔන්න ඔය විධියෙ එක්තරා වට්ටයක් තියෙනව - දෙකක් අතර කරකැවෙන වට්ටයක් තියෙනව - වට්ටය කියන්නෙ කරකැවීමක්. ඒ විධියෙ කරකැවීමක් තියෙන තාක් තමයි ප්‍රඥප්තියකට ඉඩ තිබෙන්නෙ. එතකොට මෙන්න මේ ද්වයතාවෙන් මිදිල තථාගතයන් වහන්සේ. විඤ්ඤාණයත් නාමරූපයත් අතර තියෙන ද්වයතාව මේ සංසාරික දියසුළිය බව අපි ප්‍රකාශ කළා. දැන් මෙතෙන්දි අපට මේ දිය සුළිය ගැන තවත් වරක් මතක් කරගන්න පුළුවන්. කලින් අවස්ථාවකත් අපි ඉදිරිපත් කළ උද්ධෘත පාඨයක් - උදාන පාළියෙන් ඉදිරිපත් කළ උද්ධෘත පාඨයක් - **'ඡින්නං වට්ටං න වත්තති එසෙවන්තො දුක්ඛස්ස'**. ඒ රහතන් වහන්සේ පිළිබඳව සඳහන් වෙනව සිඳින ලද වට්ටය - 'සිඳින ලද ඒ සුළිය නොකැරකැවෙයි. මෙයම දුකෙහි කෙළවරයි, කියල. එතකොට මේ විඤ්ඤාණ නාමරූප අතර දිය සුළිය, නාමරූපය අතහැරීමෙන්, අනිදස්සන විඤ්ඤාණ තත්ත්වය ප්‍රත්‍යක්ෂ කර ගැනීමෙන් සිඳ දමල, රහතන් වහන්සේ මේ ජීවිතයේදීම භව නිරෝධය ප්‍රත්‍යක්ෂ කර ගත්ත. දුක්ඛ නිරෝධය ප්‍රත්‍යක්ෂ කර ගත්ත. ඒක නිසා ඉන්පසු ජීවත්වුනාට මොකද, අර ස්කන්ධ එකක් වත් උපාදාන වශයෙන් අල්ල ගන්නෙ නැහැ. ඒ වගේම අර නාම රූපයේ ඇලෙන්නෙ නැහැ විඤ්ඤාණය. අන්න ඒක නිසා තමයි වට්ටයක් කරකැවෙන්නෙ නැහැ කියල කියන්නෙ. එතකොට මේ වට්ටය පිළිබඳ අදහසට තවත් අපට එකතුකර ගන්න පුළුවන් වටිනා උද්ධෘත පාඨයක් සංයුක්ත නිකායේ උපාදානපරිවට්ට සූත්‍රයේත් සත්තට්ඨාන සූත්‍රයේත් සඳහන් වෙනව.

> **'යෙ සුවිමුත්තා තෙ කෙවලිනො යෙ කෙවලිනො වට්ටං තෙසං නත්ථි පඤ්ඤාපනාය'**[2]

'යම් කෙනෙක් මැනවින් විමුක්තද ඔවුහු කේවලීය. යම් කෙනෙක් කේවලීද, ඔවුන් පිළිබඳව පැනවීමක් කිරීමට වට්ටයක් නැත. අර විධියෙ කරකැවීමක් නැත. මෙක අමුතු විධියක කියමනක්. මේ කේවලී කියන

වචනය සංයුක්ත නිකායෙ පමණක් නෙවෙයි සුත්තනිපාතයෙ එහෙමත් බොහෝ තැන්වල සඳහන් වෙනව, රහතන් වහන්සේ පිළිබඳව.

සුත්ත නිපාත අටුවාව, පරමත්ථජෝතිකාව, කසීභාරද්වාජ සූත්‍රයේ ඒ වචනය සඳහන් වන තැනදි දෙන අර්ථ විවරණය - කෙවලී කියන වචනයට දෙන අර්ථ විවරණය - 'සබ්බගුණ පරිපුණ්ණං සබ්බයොග විසංයුත්තං වා'[3] සියලු ගුණයන්ගෙන් පිරිපුන් නිසා හෝ සියලු බැම් වලින් මිදුන නිසා හෝ මේ ශාසනයේ විමුක්ත පුද්ගලයාට - රහතන් වහන්සේට - කෙවලී යන වචනය යොදනවයි කියල අටුවාචාරීන් වහන්සේ ප්‍රකාශ කරනව. නමුත් ඊට වඩා යම්කිසි විශේෂ ගැඹුරු අර්ථයක් තිබෙන බවයි අපට පේන්නෙ, මේ වට්ටය කියන අදහසත් මේකට කිට්ටු කළාම. මේ කේවලී කියන වචනය නිරුක්ති වශයෙන් බැලුවාම - 'කේවල' කියන වචනය නිතර යෙදෙනව - එතනින් හැඟෙන්නෙ තනි, තනිකර, හුදු, හුදෙකලා කියන මේ අර්ථ ගෙන දෙනව. තනි බවක්, හුදු බවක්, හුදෙකලා බවක් අඟවනව. දැන් අපි සඳහන් කළා නාමරූපයෙන් මිදුන කියල. නාම රූපයෙන් මිදුනු අනිදස්සන විඤ්ඤාණය ඇත්ත වශයෙන්ම රහතන්වහන්සේගේ හුදෙකලා බව, තනිබව, පෙන්නුම් කරන කාරණයක්. කලින් අවස්ථාවකත් අපි උපුටා දක්වපු ධම්මපදයෙ කොධ වග්ගයෙ එන ගාථාවක් මෙම නාම රූපයෙන් මිදීම පිළිබඳ අදහස හොඳට ඉදිරිපත් කරනව.

**'කොධං ජහෙ විප්පජහෙය්‍ය මානං**
**සඤ්ඤොජනං සබ්බමතික්කමෙය්‍ය**
**තං නාමරූපස්මිං අසජ්ජමානං**
**අකිඤ්චනං නානුපතන්ති දුක්ඛා'**

ක්‍රොධය හැරලන්නේය මානය දුරලන්නේය. සියලු සංයෝජන, සියලු බැම් ඉක්මවා යන්නේය. 'තං නාමරූපස්මිං අසජ්ජමානං' නාමරූපයෙහි නොඇලෙන - නාම රූප දෙලෙහි අහු නොවන කියන වගේ අදහසක් තියෙනව - නාමරූපයෙහි නොඇලෙන්නා වූ. නාමරූපය අතහැරියාම අකිඤ්චන බවයි එන්නෙ, කිසිවක් අයිති නැහැ. අකිඤ්චන කියල කියන්නෙ කිසිවක් අයත් නැති. අකිඤ්චන තත්ත්වයට පත් වූ ඒ තැනැත්තා මත - ඒ රහතන් වහන්සේ මත - දුක් කඩා නොවැටේ. 'නානුපතන්ති දුක්ඛා'.

ඊ ළඟට ඒ වගේම තවත් වැදගත් ගාථාවක් තියෙනව සුත්ත නිපාතයෙ මාඝ සූත්‍රයෙ.

'යෙ වෙ අසත්තා විචරන්ති ලොකෙ - අකිඤ්චනා කෙවලිනො යතත්තා
කාලෙන තෙසු හව්‍යං පවෙච්ඡෙ - යො බ්‍රාහ්මණො පුඤ්ඤපෙඛො යජෙථ.'[4]

'යම් සංයත වූ සිත් ඇති, කේවලී පුද්ගලයෝ, ලෝකයේ නොඇලී අකිඤ්චනව, කිසිවක් අයත් නැති අන්දමින්, අයිති කරගත් කිසිවක් නැතිව, හැසිරෙත්ද, පින් බලාපොරොත්තු වන බ්‍රාහ්මණයා විසින් එබඳු වූ උත්තමයන් කෙරෙහි හෝම පූජාව පූජා කළ යුතුය'. කියල ඔය විදියටයි ඒ ගාථාවෙ අදහස.

ඉතින් මෙයිනුත් අපට පේනව අර අකිඤ්චන බව - කිසිවක් අයත් නැති බව - නොඇලුනු බව - මේ කෙවලී වචනය හා සම්බන්ධයි. ඒ වගේම ඒ වචනයෙ අර්ථය හුදු බව, හුදෙකලා බව, බව හැඟෙනව. එතකොට මේ අනුව මේ කේවල ශබ්දයෙන් අපට හෙළි වෙන්නෙ අර දිය පුළියෙන් මිදුන තත්ත්වයයි. දැන් දිය සුළියක් නතර උනාම මහ මුහුදෙ, ඒ දිය සුළිය කොහේ ගියාද කියල අහන්න පුළුවන්ද? ඒකත් අර නිවුනු ගින්න කොහේ ගියාද කියල අහන්න වගේ කියමනක්. සමහර විට හිතන්න පුළුවන් දිය සුළිය මහ මුහුදට එකතු උනා කියල. ඒ කියමනත් වැරදියි. මුල ඉඳලම තිබුනෙ මහ මුහුදයි. එතකොට දිය සුළිය අහවල් තැනකට ගියයි කියල කියන්නත් බැහැ. නොගියයි කියල කියන්නත් බැහැ. මහ මුහුදට එකතු උනා කියල කියන්නත් බැහැ. ඔන්න ඔය විධියෙ තත්ත්වයක් තියෙන්නෙ අර වට්ටය නතර උනාම. අන්න එහෙම තමයි කේවලී බව. එතකොට කෙවලී කියන්නෙ මොකක්ද? දිය සුළිය දැන් මහ මුහුදමයි. අන්න ඒක නිසා තමයි දැන් ඇත්ත වශයෙන්ම අපි අර ඉදිරිපත් කළ උඩෘත පාඨයෙ 'සෙය්‍යථාපි මහා සමුද්දො' - මහා සමුද්‍රයට ඒ විමුක්ත පුද්ගලයා උපමා කරල තිබෙනව. මේ උපමාව ගැන අටුවාචාරීන් වහන්සේල ඒ තරම් සැළකිල්ලක් දක්වල නැති හැඩයි. නමුත් දිය සුළියත් මහ මුහුදත් අතර සම්බන්ධතාව ගැන කල්පනා කරල බලනකොට ඇත්ත වශයෙන්ම රහතන් වහන්සේ හරියට අර මහ මුහුදට එකතු උනා වගේ. එකතු උනා කියල අපි නිකමටයි කියන්නෙ. ඇත්ත වශයෙන්ම දියසුළිය මහ මුහුදෙ ඇතිවුන එක්තරා විකෘත විපරීත තත්ත්වයක්. ඒ විපරීත තත්ත්වය අතහැරුන. ඒක ඉවර උනා. ඒ විපරීත තත්ත්වය නිසා තමයි දුකක් හැටියට පෙනුනෙ. එතකොට දුක්ඛ නිරෝධයට අන්න අර දිය සුළිය නතර වෙල නැවත මහ මුහුදම විතරක් පෙනෙන තත්ත්වයක් ආවයි කියල කියන්න පුළුවන්. දියසුළියක් කරකැවෙනවනම් තමයි අපට පුළුවන් වෙන්නෙ ඒකට අත දිගු කරල 'අතන' 'මෙතන' කියල කියන්න. මහ මුහුදේ, ඉමක් කොනක් නොපෙනෙන මහා සමුද්‍රයේ, දිය සුළියක් තියෙනව නම් අපට පුළුවන්

එතැනට අත දික්කරල 'අතන' 'මෙතන' කියල කියන්න. ඒ වගේම මේ සංසාරික පුද්ගලය පිළිබඳවත්, අර දිය සුළිය කරකැවෙන තාක් ඇත්ත වශයෙන්ම 'මේ තැන' - මේ තැන - ඇත්තා: 'මේ තැනැත්තා' - 'අර තැනැත්තා' 'අර තැන' ආදී වශයෙන් ව්‍යවහාර කරන්න ඉඩක් තිබෙනව. නමුත් දිය සුළිය නතර උනාට පස්සේ ඒ විධියෙ තැනක් වශයෙන් හඳුන්වන්න බැහැ. ඇත්ත වශයෙන්ම හඳුන්වන්න බැහැ. කියනවනම් කියන්න තියෙන්නෙ 'දියසුළිය නතරඋන තැන' කියලයි. අන්න ඒ විධියෙ තත්ත්වයක් මේ තථාගතයන්වහන්සේ පිළිබඳව තියෙන්නෙ. මක් නිසාද, ද්වයතාවෙන් මිදීම නිසා, අර වට්ටයෙන් මිදුන. මේ දියසුළිය ගැන අපි කලින් අවස්ථාවකත් සඳහන් කළා, දියසුළියක් ඇතිවන ආකාරය. මහමුහුදේ මහ ජලකඳට එරෙහිව එයින් පලායාමට තැත්කරන යම්කිසි දිය වැලක්, තව දුරටත් එහාට යාමට බැරි උනාම ඒ මහ ජලකඳේ හැපිල විසිවෙල, තෙරපිල, කරකැවිල ඇතිකරගන්න එක්තරා වටරවුමේ යෑමක් තමයි අපි දියසුළිය හැටියට හඳුන්වන්නෙ. එතකොට මේක යථා තත්ත්වයක් නොවෙයි එක්තරා අයථා තත්ත්වයක්. විපරීත තත්ත්වයක්. කරන්නට බැරි වැඩක් කරන්ට උත්සාහ කිරීම නිසා මේ විධියෙ විපරීත තත්ත්වයක් ඇති උනා. දියසුළිය කියල දෙයක් ඇති වුනා. සංසාරගත සත්ත්වයාගේ තත්ත්වයත් ඒ වගෙ. විපල්ලාස හතරක් කියල ධර්මයේ උගන්වන්නේ මෙන්න මේ විපරීත චිත්ත තත්ත්ව හතරයි. 'අනිච්චෙ නිච්චසඤ්ඤා, දුක්ඛෙ සුඛසඤ්ඤා, අසුභෙ සුභසඤ්ඤා අනත්තනි අත්තසඤ්ඤා'.

අනිත්‍යයෙහි නිත්‍ය සංඥාව ඇතිකරගෙන - ඒ විපල්ලාසය, ඒ විපරීත හැඟීම ඇතිකරගෙන - අසුභයෙහි සුභ සංඥාව ඇතිකරගෙන, දුක්ඛයෙහි සුඛ සංඥාව ඇති කරගෙන, අනාත්ම වූ දෙයෙහි ආත්ම සංඥාව ඇතිකරගෙන, භවයේ ඉදිරියට යෑමට සංසාරගත පුද්ගලයා යම්කිසි උත්සාහයක් දරනව. ඒ උත්සාහයේ ප්‍රතිඵලයක් තමයි ඔය විඤ්ඤාණ - නාමරූප අතරෙ නිරන්තර වශයෙන් කරකැවෙන දියසුළිය. එතකොට මෙන්න මේ දියසුළියේ කරකැවීම නිසාම මේ ලෝකය පිළිබඳව යම්කිසි අසත්‍ය ස්වභාවයක් තියෙනව. මේ ලෝකය පිළිබඳව අපි යථා ස්වභාවය හැටියට හිතන එක ඇත්ත වශයෙන්ම අසත්‍ය දෙයක් හැටියටයි බුදුරජාණන් වහන්සේ හඳුන්වන්නේ. ඒකට හොඳ නිදසුනක් අපි කලින් අවස්ථාවකත් සුත්ත නිපාතයේ ද්වයතානුපස්සනා සූත්‍රයෙන් උද්ධෘත කරල දක්වුව.

**'අනත්තනි අත්තමානිං - පස්ස ලොකං සදෙවකං**
**නිවිට්ඨං නාමරූපස්මිං - ඉදං සච්චන්ති මඤ්ඤති.'**[5]

අනත්තනි අත්තමානිං පස්ස ලොකං සදෙවකං' අනාත්ම වූ දෙයෙහි ආත්මය යන මානය ඇති කර ගත්තු මේ දෙවියන් සහිත ලෝකයා දෙස බලව. 'නිවිට්ඨං නාමරූපස්මිං' නාමරූපයට රිංගාගෙන - නාමරූපයට ඇතුල්වෙලා', ඉදං සච්චන්ති මඤ්ඤති' මෙය සත්‍යයයි හඟියි. ඒක හැඟීමක් පමණයි, සත්‍ය කාරණයක් නොවෙයි. මේ ලෝකයේ සත්‍යයයි කියල ඇත්ත වශයෙන්ම හිතන දේ අසත්‍ය ස්වභාවයක් හැටියටයි මෙයින් හැඟෙන්නේ. ඒකම තවත් හොඳට පැහැදිලි වෙනව සුත්ත නිපාතයෙ උරග සූත්‍රයේ කීප තැනකමත් සඳහන් වෙන එක සමාන පාඨයකින්. විශේෂයෙන්ම මෙන්න මේ පාඨය සඳහන් වෙනව **'සබ්බං විතථමිදන්ති ඤත්වා ලොකෙ'**[6] මේ ලෝකයේ සියල්ලම විතථයි කියල දැනගෙන - ඒ උරග සූත්‍රයේ විශේෂත්වය අපි කලිනුත් සඳහන් කළා නොයෙකුත් අවස්ථාවල. සජීයා හැව දමන්න වගේ මේ සියල්ලම අතහැරීම ගැනයි ඒ සූත්‍රයේ කියැවෙන්නෙ. එතකොට මේ සජීයා හැවදැමීම - හැව දන් අසත්‍ය දෙයක් බව තේරුම් ගැනීමෙනුයි හැව අතහරින්නෙ. ඒ වගේ 'සබ්බං විතථං ඉදංති ඤත්වා ලොකෙ' ලෝකයේ හැම දෙයක්ම විතථයි කියල තේරුම් ගැනීම, එය 'තථා' නොවෙයි බව තේරුම් ගැනීමයි. තථා කියන්නෙ එසේ බව. යමක් යථාභූත නම්, එයට තථා කියල කියන්න පුළුවන්, ඒ යථාභූත විධියටම. එය යථාභූත නොවෙයි නම් ඊට යොදන වචනය අයථා, එහෙම නැත්නම් විතථ - සත්‍ය නොවන, කියන හැඟීම. එතකොට මේ කියන හැටියට අර වට්ටය - අර දිය සුළිය, විඤ්ඤාණයත් නාමරූපයත් අතර මේ සත්ත්වයාගේ චිත්ත සන්තානයේ කරකැවෙන මේ දිය සුළිය - ඇත්ත වශයෙන්ම විතථ තත්ත්වයක් - අසත්‍ය තත්ත්වයක්. මෙන්න මේ අසත්‍ය තත්ත්වයෙන් මිදීමම තමයි - මේ ද්වයතාවෙන් මිදීමම තමයි - අරහත්වය කියල කියන්නෙ. මේ ද්වයතාව නිසාමයි ලෝභ, දෝස, මෝහ, කියන තත්ත්ව තුන ඇති වෙන්නෙ. අර වටවළල්ලෙ කරකැවෙන තාක් ඒ හැපෙන හැපිලි සමහරවිට ලෝභය නිසා සමහර විට ද්වේශය නිසා ඊළඟට ඒ දෙකටම හේතු වෙන්නෙ මුළාවීම. මේ එකම වතුර පාරක් වටරවුමේ හැපි හැපි යන්නෙ. අන්න ඒ වගෙ - විඤ්ඤාණයත් නාමරූපයත් අතර තියෙන මේ විපරීත තත්ත්වය ඇත්ත වශයෙන්ම විතථ, විපරීත අසත්‍ය තත්ත්වයක්. මේ අසත්‍ය තත්ත්වයෙන් සත්‍ය තත්ත්වයට පැමිණීම තමයි තථාගත බව. අපි කලින් සඳහන් කළා තථාගත කියන පදය අන්‍ය තීර්ථකයන් අතරත් භාවිත වූ බව. නමුත්, ඒ අර්ථයෙන්ම නොවෙයි බුදුරජාණන් වහන්සේ තථාගත කියල පාවිච්චි කරන්නේ. ඒ අන්‍ය තීර්ථකයින් නම් තථාගත කියන ඒ වචනයෙන් අදහස් කළේ අර සත්ත්ව පුද්ගල සංඥාව ගෙනදෙන, විමුක්ත කියල කිව්වට ඇත්තවශයෙන් සත්ත්ව පුද්ගල සංඥාවක් ඇති කෙනෙක්. නමුත් මේ ශාසනයේ,

තථාගතයන් වහන්සේ එහෙම නොවෙයි. බුදුරජාණන් වහන්සේ සමහර අවස්ථාවල නිරුක්තියකුත් දක්වල තියනව තථාගත පදයට. යථා කියන වචනයට සමානයි තථා කියන එක. යථා - තථා- මහා සමුද්‍රය 'යථා' - යම්සේද, එසේ බවට පත් උනා නම් අර දිය සුළිය යම් අවස්ථාවක, අන්න තථාගත බව. මහා සමුද්‍රයේ ආකාරයටම ගියා. මහා සමුද්‍රයට එකඟ නොවී යාම නිසයි අර දිය සුළිය හටගත්තෙ. මහාසමුද්‍රයට අනුව ගියා නම්, අනිච්ච නිච්ච සඤ්ඤා ආදී අර විපරීත දර්ශනය ඉවත් කළා නම්, යථාභූත ඥාන දර්ශනයෙන්- අවිපරීත වූ යථාභූත ඥාන දර්ශනයෙන් විපරීත වූ විපල්ලාස හතර ඉවත් කරගෙන ලෝකයේ යථා ස්වභාවයට අනුව තමන් සකස් උනා නම් -අන්න එබඳු පුද්ගලයයි 'තථාගත'. ඒ 'තථා' විධියටම ගියා. එහෙම නැත්නම් අපට තවත් විධියකට කියන්න පුළුවන්. 'තථතා' කියල කියන්නෙ පටිච්ච සමුප්පාද ධර්මයටමයි. තථාබව කියන එකයි 'තථතා' කියල කියන්නෙ - පටිච්ච සමුප්පාද ධර්මයේ වැදගත්කම හෙළිවන ඉතාම වටිනා වචනයක් බොහෝ දුරට කොන්වෙලයි තියෙන්නෙ මේ වචනය - 'තථතා' කියල කියන්නෙ අර තථාබව. එතකොට ඒ තථතාව තේරුම් අරගෙන-තථතාවට නැවත පැමිණීමක් වගෙයි - අනික් අතට බලනවනම් 'තථ+ආගත' බව-තථාගත බව. සමහර අවස්ථාවල අටුවාචාරීන් වහන්සෙලාත් 'තථ+ආගත' නිරුක්තිය දක්වනවා. නමුත් මේ අර්ථය නොවෙයි දෙන්නෙ. ඒ විධියට අපට තථ+ආගත කියලත් කියන්න පුළුවන්. සත්‍ය තත්ත්වයට නැවත පැමිණි. ඒ සත්‍ය තත්ත්වයට නැවත පැමිණීම නිසා මහාසමුද්‍රයට අමුතුවෙන් එකතු වීමකුත් නැහැ. අඩුවීමකුත් නැහැ. මක්නිසාද? අර මුලින් දිය සුළියෙ ඇතුළෙ තිබුනෙත් වතුර, පිටත තිබුනෙත් වතුර. එතකොට ඒ විධියටම තමයි මේ සංසාරගත සත්ත්වයාගෙ තත්ත්වයත්.

දැන් මෙතන ඉඳල කියන ටික - අපි ඒ සංසාරගත පුද්ගලයා ගැන කියන ටික - ඇත්ත වශයෙන්ම භාවනාවටත් උපකාරවන කාරණයක්. මක්නිසාද? අපි කලිනුත් සඳහන් කළා - පඨවි, ආපො, තේජෝ, වායො කියන ධාතු හතර ආධ්‍යාත්මික වශයෙනුත් බාහිර වශයෙනුත් ලැබෙනව. මහාහත්ථිපදෙපම සූත්‍රයේ සඳහන් වෙනව විදර්ශනාවට උපකාරවන එක්තරා සම්මර්ශන විධියක්. 'යා චෙව බො පන අජ්ඣත්තිකා පඨවි ධාතු යා ච බාහිරා පඨවි ධාතු පඨවි ධාතුරෙවෙසා, තං නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තාති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.'[7] යම් ආධ්‍යාත්මික වූ පඨවි ධාතුවක් වෙයිද යම් බාහිර වූ පඨවි ධාතුවක් වෙයිද ඒ දෙකම හුදු පඨවි ධාතුවමයි. එය 'මෙය මගේ නොවෙයි', 'මෙය මම නොවෙමි', 'මෙය මගේ ආත්මය නොවෙයි', යනුවෙන් සම්‍යක් ප්‍රඥාවෙන්

දකිය යුත්තේය. ඉතින් මෙතනින් හැඟෙන්නේ මේ අපි පුද්ගලයා සත්ත්වයා හැටියට හඳුන්වන මේ දිය සුළිය හැදිල තියෙන්නෙත් මේ මහාභූත ධර්මයන්ගෙන්, අවට තියෙන්නේත් ඒවමයි. එතකොට මේ ඇතිකරගෙන තියෙන්නේ එක්තරා විපරීත අදහසක් පමණයි. 'මමය මාගේය' යනුවෙන් මේ සංසාරගත සත්ත්වයා තුළ තිබෙන පෞද්ගලිකත්වය පිළිබඳ හැඟීම, අර දියසුළියක පෞද්ගලිකත්වය පිළිබඳ හැඟීම වගෙයි. පුද්ගලිකත්වයක් මවාපාන දෙයක්. ඒකයි 'අස්මි මාන' කියල කියන්නේ. එතකොට එය මානයක් පමණයි. අපට වඩාත් පැහැදිලිව පේනව අවට තිබෙන පිරිසිදු වාතය දියසුළියට අහු වෙනව ආශ්වාසය හැටියට. ටික වේලාවකින් අපිරිසිදුව ප්‍රශ්වාසය වශයෙන් පිට වෙනව. බාහිර ලෝකයේ පඨවි, ආපෝ, ධාතු ප්‍රධාන යම් යම් කොටස් පිරිසිදු ආහාර පාන නමින් දියසුළියට අහුවෙල වටරවුම් කීපයක් කරකැවිලා අපවිත්‍ර මල මූත්‍ර හැටියට පිටවෙනවා. ඔන්න ඔය විදියට මෙතන තියෙන්නේ අර ඇතුළතත් පිටතත් පිළිබඳව ඇතිකරගත්තු එක්තරා මානයක් මැනීමක්. මේ මැනීම් ගිණීම් ආදී හැම එකකටම උපකාරවන දෙයක් තමයි මේ 'ද්වයතාව', දෙකක්ය කියන හැඟීම. දෙකක්ය කියල ඇතිකර ගත්තු හැඟීම. අන්න එතකොට ද්වයතාවෙන් මිදීම නිසාම ලෝභ ද්වේශ වශයෙන් තියෙන ඇලීම් ගැටීම් දෙකෙනුත් මිදෙනවා. පටපැනීම වගේ වටරවුමෙ යන ගමනක්, අවිද්‍යාව කියල කියන්නේ. ඇත්ත වශයෙන්ම වටරවුමෙ ගියාට අඳුන ගන්න බැහැ ඊළඟ රවුම කරකැවිල එනකොට. අන්න ඒ විදියෙ මහ පුදුම පටපැනීමක් තිබෙනව. අවිද්‍යාවෙ අමතක වන ස්වභාවයක් තියෙනව. එක ජීවිතයක කොයිතරම් දුක් වින්දත් ඊළඟ ජීවිතයෙ නැවත උපදින කොට අලුත් ලෝකයක්, අලුත් භවයක්. අරව මුකුත් මතක නැහැ. ඔන්න ඔය විදියටම වටරවුමක් තමයි කාලයත් අවකාශයත් මුල්කර ගත්තු මේ මහා සංසාරය හැටියට තියන සංසරණය. සංසාරය කියන්නෙත් අර වගේ වටරවුමෙ යාමක්. ඒ වට්ටය උනත් මේ වගේමයි. එහිම බීජය වගෙයි මේක. ලෙඩක් තියෙනවනම් විෂබීජයෙන්ම අහුවෙනව ලෙඩේ. ඒ වගේ බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන්න විඤ්ඤාණ - නාමරූප කියන මේ අපේ සිත තුළ කරකැවෙන වට්ටයේ තිබෙන්නෙත් ඔය ධර්මතාව බව. කාලය අවකාශය පැත්තට අහුවෙන්නෙ නැති ඉතාම සියුම් එකක් ඒ විඤ්ඤාණයත් නාමරූපයත් අතර වටටය. ප්‍රතීත්‍ය සමුත්පාදයෙ තිබෙන අකාලික වූ ධර්මතාවත් මේකමයි. එතකොට මේක පටිච්චසමුප්පාදය වටහාගැනීමෙන්ම විසඳෙන ප්‍රශ්නයක්. අපි කලින් අවස්ථාවකත් ප්‍රකාශ කළා සංඛතය අසංඛතය වෙන්නෙ සංඛතයේ සංඛත ස්වභාවය වටහා ගැනීමෙන් බව. මක් නිසාද, සංඛතය සංඛතය හැටියට තියෙන්නෙ සංඛතය සංඛතය බව තේරුම් නොගැනීමෙන්. මේක

බැලුවාම මහ ප්‍රහේලිකාවක් වගේ. නොදනීම නිසාමයි මේ වටවළල්ලේ යන්නෙ. ඒක නිසා තමයි ප්‍රඥාවෙන් අවසාන වශයෙන් විමුක්තිය ලැබෙන බව මේ සාසනයේ ප්‍රකාශ කරන්නෙ.

කොහොම නමුත් දන් අපට මෙතනින් ඉතාම වැදගත් කාරණයක් හෙළි වෙනව. මේ 'තථාගත' කියන පදයට බුදුරජාණන් වහන්සේ දුන්න මේ නිරුක්තිය ඉතාමත්ම අර්ථවත් නිරුක්තියක්. අර ප්‍රශ්නවලට පිළිතුරු නොදීමට හේතුව මෙතනින්මත් හෙළි වෙනව. අර දිය සුළිය නතර උනාම කොයි පැත්තට ගියාද මහ මූදට එකතුවුනාදවත් කියල කියන්න බැරුව වගේ ඒ තථාගතවරය ජීවමානව සිටියදීම හඳුනගන්න බැහැ. අන්න එහෙම තත්ත්වයක් තිබෙනව - මේ මහා සමුද්‍රය පිළිබඳ උපමාව ආශ්‍රයෙන් නිර්වාණය පිළිබඳව ඉතාම ගැටලු හැටියට සැළකෙන එක්තරා සූත්‍ර දේශනාවක අර්ථය අපට මතුකර ගන්න පුළුවන්. බොහෝ විට නිර්වාණය පිළිබඳව ශාස්වත දෘෂ්ටියට නැඹුරුවන විවරණයක් ඉදිරිපත් කරන අපේ බෞද්ධ උගතුන් උඩෘත කරල දක්වන සූත්‍රයක් තමයි අඩගුත්තර නිකායේ අට්ඨක නිපාතයේ එන පහාරාද සූත්‍රය.[8] ඒ සූත්‍රය කීප තැනකම සඳහන් වෙනව විනය චුල්ල වග්ගය, උදාන පාළිය, ආදී කීප තැනක. ඒ සූත්‍රයේදී, ඒ පහාරාද සූත්‍රයේදී, බුදුරජාණන් වහන්සේ පහාරාද අසුරේන්ද්‍රයාට මහා සමුද්‍රයේ ආශ්චර්යාද්භූත ධර්ම අටකට මේ ධර්ම විනයේ - මේ ශාසනයේ- ආශ්චර්යාද්භූත ධර්ම අටක් සංසන්දනය කරමින් එක්තරා දේශනාවක් ප්‍රකාශ කළා. එයින් පස්වැනි ආශ්චර්යාද්භූත ධර්මය හැටියට සඳහන් වෙන්නෙ මේකයි-

**'සෙය්‍යථාපි පහාරාද යා ච ලොකෙ සවන්තියො මහාසමුද්දං අප්පෙන්ති-යා ච අන්තලික්ඛා ධාරා පපතන්ති න තෙන මහාසමුද්දස්ස ඌනත්තං වා පූරත්තං වා පඤ්ඤායති. එවමෙව ඛො පහාරාද බහූ චෙපි භික්ඛූ අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බායන්ති. න තෙන නිබ්බාන ධාතුයා ඌනත්තං වා පූරත්තං වා පඤ්ඤායිස්සති'.**

එහි අදහස 'යම් සේ පහාරාද ලෝකයේ යම් ගලායන ගංගාවෝ මහා සමුද්‍රයට ගලා බසිද්ද, ඒවගේම අහසින් වැටෙන යම් ජල ධාරාවෝ වෙත්ද, ඒ කිසිවකින් මහා සමුද්‍රයේ අඩුවක් හෝ වැඩියක් හෝ නොපැනෙයිද? එසේම බොහෝ භික්ෂූහු අනුපාදිසේස නිබ්බාන ධාතුවෙන් පිරිනිවියාහු නමුත් අනුපාදිසේස නිබ්බාන ධාතුවේ අඩුවක් හෝ වැඩියක් හෝ නොපෙනේ.

මෙන්න මේ සූත්‍ර පාඨය උපකාර කර ගන්නව බොහොම දෙනෙක් 'මේ රහතන් වහන්සේලා මරණින් මත්තෙ ගිහිල්ලා කොහේ හරි තැනකට

එකතු වෙනව ඒතැන පිරෙන්නෙ නැහැ, කියල ඔය විධියෙ අදහසක් දෙන්න. ඉතාම ඕළාරික අදහසක් - පුදුම හිතෙනව මේ විධියෙ අදහස් ඉදිරිපත් කිරීම පවා. මක්නිසාද අර ශාස්වත දෘෂ්ටියත් උච්ඡේද දෘෂ්ටියත් සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප වන ධර්මයක් නිසා මේක. මේ සූත්‍ර දේශනාවේ රූපකාර්ථය අමතක කිරීම නිසාත්, රහතන් වහන්සේ මහා සමුද්‍රය හා සම්බන්ධ කිරීමෙන් ඉදිරිපත් කරන්ට බලාපොරොත්තු වෙන අර කේවල බව 'තථතා' බව, ගැන නොතැකීම නිසාත් ඔය විධියෙ මත ඉදිරිපත් කරන බවයි පේන්නෙ. අන්න ඒක නිසා අපට හිතාගන්න තියෙන්නෙ ඇත්ත වශයෙන්ම නිර්වාණය කියන එකයි නියම සත්‍යය. ලෝකයා සංසාරයයි කියන එක විපරීත තත්ත්වයක්. ඒක නිසාම තමයි අර අපි කලින් අවස්ථාවකත් කෙටියෙන් ප්‍රකාශ කළ ද්වයතානුපස්සනා සූත්‍රය ඉතාම වටිනා සූත්‍රයක් වන්නෙ. එතන සඳහන් වෙනව: 'ලෝකයා සත්‍යයයි කියන දේ ආර්‍ය්‍යයන් වහන්සේලාට අසත්‍යයි. ලෝකයා සුඛ හැටියට හිතන දේ ආර්‍ය්‍යයන් වහන්සේලා දුක හැටියට සලකනව, කියල. 'පස්ස ධම්මං දුරාජානං - සම්පමූළ්හෙත්ථ අවිද්දසු'[1] කියලයි. බුදුරජාණන් වහන්සේ එතෙන්දි ප්‍රකාශ කරන්නෙ. මේ තරම් තේරුම් ගැනීමට අපහසු ධර්මයක් දිහා බලන්න. මේ ධර්මය පිළිබඳව බොහෝ දෙනෙක් මුළා වෙනව කියල. මුළා වෙන බවත් ඇත්තයි. ඔන්න එතකොට ඔයින් පෙනෙනව මේ 'තථතා' කියන වචනයේ ඇති ගම්භීරාර්ථය.

ඒ වගේම තථාගතයන් වහන්සේ පිළිබඳව මේ දක්වූ අදහස් කීපය තවදුරටත් පැහැදිලි කරනව නම්- මේ විමුක්ත පුද්ගලයා මරණින් මතු වෙයිද නොවෙයිද ආදී ප්‍රශ්නවලට පිළිතුරු දිය යුතු ආකාරය ගැන - හොඳ වටිනා සූත්‍රයක් එනව සංයුක්ත නිකායේ අව්‍යාකත සංයුක්තයේ, අනුරාධ සූත්‍රය හැටියට. මේ සූත්‍රයේ සඳහන් වන ආකාරයට බුදුරජාණන් වහන්සේ එක්තරා අවස්ථාවක විශාලා නුවර කූටාගාර ශාලාවේ වැඩ වාසය කළා. ඒ කාලයේ බුදුරජාණන් වහන්සේ වැඩ විසූ තැනට නුදුරින්, ආරණ්‍ය කුටියක අනුරාධ කියල ස්වාමීන් වහන්සේ නමක් වැඩ වාසය කළා. ආරණ්‍ය කුටියක හිටියට මොකද මේ වගේ ප්‍රශ්නවලින් බේරිල ඉන්න අමාරු බව පැහැදිලි වෙන කාරණයක් අනුරාධ ස්වාමීන් වහන්සේට එක දවසක්දා සිද්ධ උනා. අන්‍යතීර්ථක පරිබ්‍රාජකයින් පිරිසක් ඇවිල්ල අනුරාධ ස්වාමීන් වහන්සේ ඉස්සරහ ඉඳගෙන මෙන්න මේ විධියෙ ප්‍රකාශයක් කළා - මොනවද කියන්නේ කියල දැන ගන්න වෙන්න ඇති.

**'යො සො ආවුසො අනුරාධ තථාගතො උත්තමපුරිසො පරමපුරිසො පරමපත්තිපත්තො. තං තථාගතං ඉමෙහි චතූහි ඨානෙහි පඤ්ඤාපයමානො**

**පඤ්ඤාපෙති, හොති තථාගතො පරම්මරණා. න හොති තථාගතො පරම්මරණා. හොති ච න හොති ච තථාගතො පරම්මරණා නෙව හොති න න හොති තථාගතො පරම්මරණා'**[9]

ඇවැත්නි ඔය උත්තමපුරිස පරමපුරිස පරමපත්තිපපත්ත නමින් හැඳින්වෙන, ඒ කියන්නේ, උත්තම පුරුෂයා - යම්කිසි ශාසනයක උත්තම පුරුෂයා, - පරම පුරුෂයා පරම තත්ත්වයට පත් වූ පුද්ගලයා හැටියට සැළකෙන ඒ තථාගත වරයා, එබඳු පුද්ගලයා පිළිබඳ මරණින් මතු තත්ත්වය පනවන කෙනෙක් පැනවිය යුත්තේ මෙන්න මේ හතරෙන් එකකටයි. එම තථාගතවරයා පිළිබඳව යම්කිසි කෙනෙක් පැනවීමක් කරනව නම් එය කරන්න පුළුවන් වෙන්නෙ මේ සතරකොන් තර්කයෙන් පමණයි කියන එක. ඒකයි ප්‍රකාශය, මේ පිරිවැජියන්ගෙ. එතකොට මේ අනුරාධ ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කරනව 'යො සො ආවුසො තථාගතො උත්තම පුරිසො, පරම පුරිසො පරමපත්තිප්පත්තො තං තථාගතං අඤ්ඤත්‍රිමෙහි චතූහි ඨානෙහි පඤ්ඤාපයමානො පඤ්ඤාපෙති' ඒ කියන්නෙ අර උත්තම පුරිස පරම පුරිස පරමපත්තිපත්ත වශයෙන් හැඳින්වුන තථාගතවරය පිළිබඳව යම්කිසි කෙනෙක් පනවනවනම් ඒ පැනවීමක් කළ හැක්කේ මේ හතරෙන් පිටතය - මේ හතරෙන් පිටතය ඒ තථාගතවරය පිළිබඳ යම්කිසි පැනවීමක් කළ හැක්කේ කියල. මේක කිව්ව හැටියෙ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ මෙන්න මෙහෙම දෙයක් කිව්ව, එක්තරා නිග්‍රහයක් හැටියට වගේ. 'එක්කො මේ ළඟදී පැවිදි වෙච්ච නවක භික්ෂුවක්, එහෙම නැත්නම් මෝඩ අව්‍යක්ත කෙනෙක්' කියල නැගිටල යන්න ගියා. එතකොට මේ අනුරාධ ස්වාමීන් වහන්සේ ටිකක් කල්පනාවේ වැටුන. 'මින් එහාටත් මගෙන ප්‍රශ්න කළානම් එහෙම, මේ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයින්, මං කොයි විධියටද පිළිතුරු දිය යුත්තෙ. කොයි අන්දමින් පිළිතුරු දුන්නහමද ධර්මයට එකඟව - ධර්මානුකූලව - පිළිතුරු දුන්නා වෙන්නෙ. බුදුරජාණන් වහන්සේගේ වචනයෙ නොකී දෙයක් කී හැටියට ඉදිරිපත් කිරීමේ දෝෂයෙන් ඉවත්ව ඒ වගේම ගර්හාවට ලක්වන්නේ නැතිව මං කොහොමද මේකට පිළිතුරු දෙන්නෙ' කියල. ඔය කුකුස නිසා අනුරාධ ස්වාමීන් වහන්සේ වැඩම කළා බුදුරජාණන් වහන්සේ ළඟට. වැඩම කරල මෙන්න මෙහෙම මේ කාරණය ප්‍රකාශ කළාම, බුදුරජාණන් වහන්සේ එකපාරටම ඊට පිළිතුරු නොදී ධම්මානුකූලවම ඉතාම පුදුම අන්දමේ ක්‍රමානුකූලත්වයකින් අනුරාධ ස්වාමීන් වහන්සේට ඒ ධර්මාවබෝධය ලබා දුන්න. මෙන්න මේ විදියටයි ඉස්සෙල්ලාම කළේ. ඉස්සෙල්ලාම ත්‍රිලක්ෂණ දේශනාවෙන් 'තං කිං මඤ්ඤසි අනුරාධ රූපං නිච්චං වා අනිච්චං වා' කුමක්ද අනුරාධ නුඹ හිතන්නේ රූපය නිත්‍යද අනිත්‍යද, ඉතින් ඊට දෙන පිළිතුර 'අනිච්චං භන්තෙ' එය

අනිත්‍යයි ස්වාමීනි. 'යං පන අනිච්චං දුක්ඛං වා තං සුඛං වා' යමක් අනිත්‍ය නම් එය දුකක්ද සැපක්ද? 'දුක්ඛං භන්තෙ' එය දුකයි ස්වාමීනි. 'යං පන අනිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලං නු තං සමනුපස්සිතුං එතං මම, එසො හමස්මි, එසො මෙ අත්තාති' යමක් අනිත්‍යද දුක් සහිතද ඒ වගේම වෙනස්වන ස්වභාවය ඇත්තේද එය පිළිබඳව මෙය මගේය මෙය මම වෙමි මෙය මගේ ආත්මය යයි දැකීම - කල්පනා කිරීම - සුදුසුද? සුදුසුද කියලයි අහන්නෙ. 'නො හෙතං භන්තෙ'-නැත කියල ඒ කාරණය පිළිගත්ත.

එතකොට පියවර තුනකිනුයි බුදුරජාණන් වහන්සේ මේ ධර්මාවබෝධය ලබාදෙන්නෙ- මේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්නෙ. මේ පළමු වැනි පියවර. පළමු වැනි පියවර වශයෙන් කළේ තථාගත ප්‍රශ්නය පැත්තකින් තියල එකපාරටම ත්‍රිලක්ෂණ දේශනාවේ අනාත්ම ලක්ෂණය මතුකරල දුන්න. 'කල්ලං නු තං සමනුපස්සිතුං - මේක සුදුසුද කියල අහනව - අනිත්‍යයි නම් දුක් නම් මේක ආත්ම හැටියට සැළකීම සුදුසු නැහැ. ඒක පිළිගත්තට පස්සේ ඔන්න ඊළඟට දෙවෙනි පියවර. දෙවෙනි පියවර ඇත්ත වශයෙන්ම සම්මර්ශනයක් වගේ විදර්ශනා පැත්තටම යොමුවෙන එකක්.

'තස්මාතිහ අනුරාධ යං කිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා සබ්බං රූපං නෙතං මම නෙසොහමස්මි න මෙ සො අත්තාති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා, රූපස්මිං නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති විරාගා විමුච්චති' ආදී වශයෙන් අන්න අර්හත්වය දක්වාම ප්‍රකාශ වෙන සම්මර්ශනවිධියක් බුදුරජාණන් වහන්සේ එතෙන්දි ඉදිරිපත් කරනව. අනාත්ම බව පිළිගත්ත නම්, එහෙම නම් කරන්න තියෙන්නේ, යම් රූපයක් - අර ස්කන්ධ පහ ගැනම කියනව ඉස්සෙල්ලාම රූපස්කන්ධය - අතීත වූ හෝ වේවා අනාගත හෝ වේවා වර්තමාන වූ හෝ වේවා ආධ්‍යාත්මික හෝ බාහිර හෝ ඕලාරික හෝ සියුම් හෝ දුර හෝ ළඟ හෝ හීන හෝ ප්‍රණීත හෝ ඒ සියලුම රූපය, මෙය මගේ නොවෙයි මෙය මම නොවෙමි. මෙය මගේ ආත්මය නොවෙයි යනුවෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දැකිය යුතුයි. එහෙම දැකල ඊළඟට ඒ පිළිබඳව නිබ්බිදාව ඇති වෙනව, ඊළඟට විරාගය ඊළඟට විමුක්තිය. අරහත්වය දක්වාම ප්‍රකාශ කරනවත ඒ දෙවෙනි පියවර.

ඔන්න ඊළඟට තුන්වන පියවර වශයෙන් ප්‍රශ්න මාලාවක් ඉදිරිපත් කරනව අනුරාධ ස්වාමීන් වහන්සේට. දැන් මේ විධියට විමුක්ත වූ පුද්ගලයා

පිළිබඳව කල්පනා කරල බලන කොට - 'තවං කිං මඤ්ඤසි රූපං තථාගතො ති සමනුපස්සසි'. ඊළඟට අහනව දැන් මේ විදියට විමුක්ත පුද්ගලය පිළිබඳව - ඒ පුද්ගලය දැන් තථාගත නමින් හැඳින්වෙන්නෙ - ඒ විමුක්ත පුද්ගලයාට තථාගත වශයෙන් ව්‍යවහාර කරන්නේ රූපයටද 'රූපං තථාගතො ති'. නැත කියල පිළිතුරු දෙන්න සිද්ධ වෙනව, ඒ වගේම වේදනාවටත් නොවෙයි, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ ආදී එක ස්කන්ධයකටත් නොවෙයි තථාගත කියල කියන්නෙ. ඊළඟට අහනව බුදුරජාණන් වහන්සේ 'රූපස්මිං තථාගතො ති සමනුපස්සති' - ඒ වගේම වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ වශයෙන් - රූපය තථාගත හැටියට නුඹ බලන එක හරි නැත්නම්, රූපය තුළ තථාගතයන් ඉන්නව කියල කල්පනා කරනවද? 'නැත' කියල ඒකටත් පිළිතුරු දෙනව. එහෙමනම්, ඊළඟට අහන ප්‍රශ්නය 'අඤ්ඤත්‍ර රූපා තථාගතො ති සමනුපපසති' රූපයෙන් පිට තථාගත කෙනෙක් ඉන්නව කියල හිතනවද? ඒත් නැත. රූපය ගැන කියනව වගේම වේදනා සඤ්ඤා ආදී අනික් ස්කන්ධ ගැනත් කියැවෙන බව හිතාගන්නට ඕනෑ. එතකොට දැන් තුන් ආකාරයකට කිව්ව විදියටම හතරවෙනි ආකාරයට ප්‍රශ්න කරනව තථාගතයන් වහන්සේ 'අරූපී, අවෙදනො, අසඤ්ඤී අසංඛාරො, අවිඤ්ඤාණො තැනැත්තෙක්ද?. ඒ කියන්නේ රූපය නැති වේදනාව නැති, සංඥාව නැති, සංස්කාර නැති, විඥාණයක් නැති කෙනෙක්ද? මේ තථාගතයන් වහ්නසේ. ඒකත් නොවෙයි කියන්නේ. ඒ ප්‍රශ්න හතරටම 'නැත' 'නැත' කියල පිළිතුරු දෙන්ට සිද්ධ උනා. ඔන්න ඊ ළඟටයි නිගමන පාඨය බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කරන්නෙ - නියම ධර්මානුකූල විවරණ පාඨය:

**'එත්ථ තෙ අනුරාධ දිට්ඨෙව ධම්මෙ සච්චතො ථෙතතො තථාගතෙ අනුපලබ්භියමානෙ කල්ලන්නු තං වෙය්‍යාකරණං යො සො අවුසො තථාගතො උත්තම පුරිසො පරම පුරිසො පරමපත්තිපත්තො තං තථාගතං අඤ්ඤත්‍රිමෙහි චතුහි ඨානෙහි පඤ්ඤාපයමානො පඤ්ඤාපෙතීති'.**

අනුරාධ මෙහිදී, මේ කාරණයෙහි ලා, දිටු දම්යෙහිදීම-මෙලොවදීම-මේ ජීවිතයේදීම සතය වශයෙන්, ඇත්තවශයෙන්ම, තථාගත කෙනෙකුන් නොලැබෙන කල්හි - 'අනුපලබ්භියමානෙ', හුඟ දෙනෙකුට භය හිතෙන කියමනක්. අනික් කොයි එක නැතත් තථාගතයන් වහන්සේ නැතැයි කිව්වොත් මහා භයක් ඇතිවෙනව. නමුත් මෙතන කියවෙන්නේ නම් ඒක වගෙයි. ඇත්ත වහයෙන්ම තථාගත කෙනෙකු නොලැබෙන කල්හි' 'කල්ලන්නු තං වෙය්‍යාකරණං' - නුඹ අර අන්‍ය තීර්ථකයන්ට දුන්නු පිළිතුර හරිද කියලයි මේ අහන්නෙ. අර විදියට විවරණය කිරීම හරිද? කියල. අනුරාධ

ස්වාමීන් වහන්සේ දුන්න පිළිතුරයි බුදුරජාණන් වහන්සේ ඊ ළඟට කියන්නෙ. අර කියාපු 'හොති තථාගතො පරම්මරණා' ආදී සතර ආකාරයෙන් පිට යම්කිසි ආකාරයකින් පිළිතුරක් දිය හැකිය. කියල. තීර්ථකයන් අර විධියට උපහාසය නහල නැගිටල හිනාවෙල ගියෙ යම්කිසි හේතුවක් ඇතිවයි. මක් නිසාද? අර චතුෂ්කෝටි ප්‍රශ්නයේ ස්වභාවය කොයි තරම්ද කියතොත් එයින් පිට තථාගත කෙනෙක් පිළිබඳ විවරණයක් කරන්න ඉඩක් නැහැ. ඒක අර කොන් හතරින් ඉවරයි. ඒ නිසයි ඒ තීර්ථකයින් 'මෙච්චරවත් කාරණයක් දන්නෙ නැහැ' කියල කියන්න වගේ නැගිටල ගියෙ. එතකොට බුදුරජාණන් වහන්සේ මේ අර තීර්ථකයින්ගේ උපහාසය සහේතුක බවයි අනුරාධ ස්වාමීන් වහන්සේට ඒත්තු ගන්වන්නෙ. 'නුඹ දුන්න පිළිතුර හරි නැහැ'. හතර ආකාරයෙන් පිට තථාගත කියන වචනය උපකාර කරගෙන විවරණයක් දෙන්න බැහැ. මක්නිසාද මරණින් මත්තෙහි තථාගතයන් වහන්සේ වෙයි නොවෙයි කියල කියන්ට කලින් දිටු දැම්යෙහිදීම තථාගත කෙනෙක් නැහැ. 'දිට්ඨෙ ව ධම්මෙ සච්චතො ථෙතතො'..... එතකොට අනුරාධ ස්වාමීන් වහන්සේ පිළිගන්නව - බුදුරජාණන් වහන්සේ අහන්නෙ නුඹ කලින් දුන්නු පිළිතුර හරිද කියලනෙ. 'නොහෙතං භන්තෙ' 'මම කලින් දුන්නු විවරණය වැරදියි ස්වාමීනි' කියල පිළිගත්ත. අන්න එතකොට බුදුරජාණන්වහන්සේ 'සාධු සාධු අනුරාධ, පුබ්බෙ චාහං එතරහි ච දුක්ඛං. චෙව පඤ්ඤපෙමි, දුක්ඛස්ස ච නිරොධං'. සාධු කියල ඒක අනුමත කරල, අනුරාධ ඉස්සරත් දැනුත් මම දේශනා කරන්නෙ මෙච්චරයි. දුකත් දුක්ඛ නිරෝධයත් පමණයි මා පනවාලන්නෙ. මගේ සත්‍ය දේශනාව මෙච්චරයි. චතුරාර්‍ය්‍ය සත්‍ය දේශනාවයි. ඒ තථාගත සත්ත්ව පුද්ගල ආදී ඒව ප්‍රඥප්ති පමණයි. එතකොට මෙන්න මේක සමහර විට කෙනෙකුට මහ භය හිතෙන කියමනක්. අපි ඉස්සෙල්ල බලමු ටිකක් හරි ඉඩ තියෙනවද මේ තථාගතයන් වහන්සේ බේරගන්න කියල. 'උපලබ්භති. කියන එකේ අර්ථය. සමහර අය ඇත්ත වශයෙන් පරිවර්තනය කරනව, මේ 'උපලබ්භති' කියන එක මෙහෙම-'ඉන්නව, නමුත් හොයාගන්න බැහැ'. උපලබ්භති කියන වචනයේ අර්ථය, ඇත්ත වශයෙන්ම තථාගත කෙනෙක් ඉන්නව නමුත් සොයාගන්න අමාරුකමයි තියෙන්නෙ, ඔය විධියේ අර්ථයකුත් දෙනව. මේ උපලබ්භති කියන වචනයෙ අර්ථය අපි පළමුවෙන් විමසල බලමු. ඒකට හොඳ නිදර්ශනයක් තමයි සංයුක්ත නිකායේ සගාථක වග්ගයෙ එන වජිරා සූත්‍රය. වජිරා රහත් මෙහෙණිය මාරයාට ප්‍රකාශ කරන එක්තරා ගාථාවක්. එක්තරා අභියෝග ගාථාවක්.

'කින්නු සත්තො ති පච්චෙසි - මාර දිට්ඨි ගතන්නු තෙ
සුද්ධසංඛාරපුඤ්ජොයං - න ඉධ සත්තුපලබ්භති'[10]

'මාරය, නුඹ කුමක් සත්ත්වයා හැටියට සළකන්නෙහිද? මේක නුඹගේ දෘෂ්ටිගතයක් පමණක් නොවේද? මෙය හුදු සංස්කාර ගොඩක් පමණයි. 'න ඉධ සත්තූපලබ්භති' මෙහි සත්ත්වයෙක් නොලැබේ. එතන නූපලබ්භති කියන එක හොඳටම පැහැදිලියි. 'නොලැබෙයි කියන එක'. 'සත්ත්වයෙක් ඉන්නව සොයාගන්න බැහැ', නොවෙයි. ඒ වගේම තවත් ඕනනම් නිදසුනක් අපට හමුවෙනව සුත්ත නිපාතයේ පුරාභෙද සූත්‍රයෙන් රහතන් වහන්සේලා පිළිබඳව.

**'න තස්ස පුත්තා පසවො වා - ඛෙත්තං වත්ථුං න විජ්ජති,**
**අත්තං වාපි නිරත්තං වා - න තස්මිං උපලබ්භති'**[11]

ඒ රහතන් වහන්සේ පිළිබඳව ප්‍රකාශ කරනව, ඒ රහතන් වහන්සේට, උපශාන්ත මුනිවරයාට, පුත්‍රයෝ හෝ ගෙරි හරක් හෝ නැත. ඒ වගේම කෙත් වතු ආදියක් නැත. 'අත්තං වාපි නිරත්තං වා 'න තස්මිං උපලබ්භති' උන්වහන්සේ පිළිබඳව අල්ලාගත් දෙයක් හෝ අතහැරිය දෙයක් හෝ නැත. ද්වයතාවෙන් මිදීමයි එතනින් ප්‍රකාශ වෙන්නෙ. එතකොට මෙයිනුත් අපට පැහැදිලි වෙනව මේ 'න උපලබ්භති' කියන්නෙ ඇත්ත වශයෙන්ම නැතැයි කියන අර්ථය. නොමැත කියන අදහසයි. එයින් අපට පැහැදිලි වෙනව මේ සතරකොන් ප්‍රශ්නය, බුදුරජාණන් වහන්සේ මේකට පිළිතුරු නොදී පැත්තකට කළේ, පිළිතුරු දෙන්න පුළුවන් අවබෝධයක් තිබෙද්දිත් ඒක නිවනට අනවශ්‍ය නිසා නොවෙයි. කාටද කියන්න පුළුවන් මරණින් මතු රහතන් වහන්සේ පිළිබඳ තත්ත්වය නිවනට අදාල නොවෙයි කියල. ඒක නිසා නොවෙයි - මේ ප්‍රශ්නවලම තිබෙන යම්කිසි මිථ්‍යා ස්වරූපයක් නිසයි. මේ ප්‍රශ්නකරුවන් තථාගත වචනයෙන් අදහස් කළේ සත්ත්වයෙක් පුද්ගලයෙක් කියන අදහසයි. නමුත් බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කළා මේ සත්ත්ව පුද්ගල සංඥාව එහෙම පිටින්ම මිථ්‍යාවක් බව. ඒ මිථ්‍යාව උනාට මොකද ලෝකයා මිථ්‍යා ලෝකයක, අසත්‍ය ලෝකයක ජීවත් වන නිසා ඒකට ඉඩ තිබෙනව. අල්ලගත්තු එක නිසාම ඒ පිළිබඳ යම්කිසි බැඳීමක් තියෙනව. ඒක නිසා ලෝකයා, මමය මාගේය, එහෙම නැත්නම් සත්ත්ව පුද්ගල ආදී වශයෙන් වචන පාවිච්චි කරන කොට ඒක නිකර ව්‍යවහාර මාත්‍රයක්ම නොවෙයි. ඒක ලෝකයාගේ සත්‍ය මට්ටමින් සත්‍යයක්. නමුත් රහතන් වහන්සේලා පිළිබඳව - අර තථ තත්ත්වයට පැමිණි රහතන් වහන්සේලා පිළිබඳව - ඇත්ත වශයෙන්ම ඒක නිකම්ම ප්‍රඥප්තියක් පමණයි. ඒක ප්‍රඥප්ති තත්ත්වයට පත් වෙනව අර උපමාව ගැන අපි තවදුරටත් කල්පනා කරල බැලුවොත්. අපට හිතාගන්න පුළුවන් - මහා සමුද්‍රයත් දිය සුළියත් පිළිබඳ උපමාව - දැන් රහතන් වහන්සේලාගේ

තත්ත්වය හරියට, යටින් නතර උන දියසුළියක් මතුපිට වටේ නිදැල්ලේ පාවෙමින් තිබෙන අතු ඉති කොළ රොඩු ආදියක් වගෙයි, රහතන් වහන්සේලාගේ පඤ්චස්කන්ධය. නිදල්ලෙ ඔහේ පාවෙමින් තිබෙනව. මේක දකින කෙනෙක් අත දික්කරල කියනව, අන්න රහතන් වහන්සේ, අන්න බුදු කෙනෙක් කියල. අන්න තථාගත කෙනෙක් කියල. ඔන්න ඔය විධියෙ තත්ත්වයක් තියෙන්නෙ. එතකොට අර සත්ත්ව ප්‍රඥප්තිය මුල ඉඳල අගටම - ඒක එහෙම පිටින්ම බුදුරජාණන් වහන්සේ පිළිනොගන්නා දෙයක්. ඒ නොපිළිගන්නා නමුත් මේ සත්ත්ව පුද්ගල කියන අදහස් ඇත්ත වශයෙන් සූත්‍රවල සඳහන් වෙනව බොහෝ තැන්වල: දන් අට්ඨ අරිය පුගගල වචනය යෙදිල තියෙනව, ඒ රහතන් වහන්සේ පිළිබඳවත්. ඒ වගේම සත්ත්ව කියන වචනයත් සමහර තැන්වල ව්‍යවහාර වශයෙන් යොදල තියෙනව. අගගප්පසාද සූත්‍ර ආදියේ[12] - 'යාවතා භික්ඛවෙ සත්තා අපදා වා දිපදා වා චතුප්පදා වා බහුප්පදා වා' යම්තාක් ලෝකයේ සත්ත්වයෝ වෙත්ද අපා, දෙපා, සිව්පා, බුහුපා, 'රූපිනො වා අරූපිනො වා සඤ්ඤිනො වා අසඤ්ඤිනො වා නෙවසඤ්ඤී නාසඤ්ඤිනොවා තථාගතො, තෙසං අගගමක්ඛායති අරහං සම්මා සම්බුද්ධො රූපී අරූපී සඤ්ඤී අසඤ්ඤී නෙවසඤ්ඤීනාසඤ්ඤී වූ ඒ සත්ත්වයින් අතර අර්හත් වූ සම්මා සම්බුද්ධ වූ තථාගතයන් වහන්සේම ශ්‍රේෂ්ඨය. අන්න එබඳු තැන්වල සත්ත්ව කියන එකත් යොදල තියෙනව. ඒ කොයි විදියට යෙදූ නමුත් ඒ ලෝකයාගේ වචනයයි මේ ප්‍රකාශ කරන්නේ. **ඇත්ත වශයෙන්ම සත්ත්වයෙක් මෙතන නැහැ.**

ලෝක කියන වචනයට බුදුරජාණන් වහන්සේ දුන්නු අළුත්ම නිරුක්තියක් ගැන අපි කලින් දේශනයේදී සඳහන් කළා. ඒ වගේම මේ සත්ත්ව කියන වචනයටත් බුදුරජාණන් වහන්සේ අමුතු නිරුක්තියක් දීල තියෙනව. සංයුක්ත නිකායෙ රාධ සංයුක්තයේ රාධ ස්වාමීන් වහන්සේ අහනව ප්‍රශ්නයක් - 'සත්තො සත්තො ති භන්තෙ වුච්චති කිත්තාවතා නු බො භන්තෙ සත්තො ති වුච්චති'[13] ස්වාමීනි, මේ 'සත්ත්වයා' කියල කියනව, කෙතෙකින්ද කෙනෙක් සත්ත්වයෙක් වෙන්නෙ?. සත්ත්වයා කියල කියන්නෙ මක් නිසාද?. මේ, නිරුක්තියක් අහන්නෙ. එතකොට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනව **'රූපෙ බො රාධ යො ඡන්දො යො රාගො යා නන්දි යා තණ්හා තත්‍ර සත්තො තත්‍ර විසත්තො තස්මා සත්තො ති වුච්චති'**. රාධ රූපය පිළිබඳව යම් ඡන්දයක් යම් රාගයක් යම් නන්දියක් යම් තණ්හාවක් වේද ඒ රූපය පිළිබඳව ඇලුනේ වෙසෙසින් ඇලුනේ: එහෙයින් සත්ත්වයායි කියනු ලැබේ. එතන එක්තරා විධියක ප්‍රාසයක් සහිතව අර වචනයට ගැලපෙන හැටියටයි බුදුරජාණන් වහන්සේ ඒ නිරුක්තිය දෙන්නෙ. විසත්ත - සත්ත - කියල කියන වචනයේ අර්ථ දෙකක් තිබෙනව - සත්ත්වයා කියල අපි සාමාන්‍යයෙන්

ප්‍රකාශ කරන අදහස වගේම 'ඇලුනු' කියන අදහස පාළියෙ ඒ සත්ත කියන වචනයෙ තියෙනව, ඇලෙන - සජ්ජති කියන්නෙ ඇලෙනව, එහෙයින් සත්ත්වයා යැයි කියනු ලැබේ. එතකොට සජ්ජති කියන - ඇලීම කියන - අර්ථය අනුවයි බුදුරජාණන් වහන්සේ නිරුක්තිය දෙන්නෙ. අර ලුජ්ජති පලුජ්ජති' ති, ලුදු, පලුදු වේනුයි ලෝකය නම්, කිව්ව වගේ මෙතන ඇලුනේ යයි 'සත්ත්ව' වෙයි. 'ඇලුනේ යයි වෙසෙසින් ඇලුනේයයි යනු සත්ත්වයා වෙයි'. 'සත්තො විසත්තො තස්මා සත්තො ති වුච්චති' එහෙම ප්‍රකාශ කරල ඊළඟට පුදුම විධියේ උපමාවකුත් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනව. යම්සේ රාධ, කුඩා දරුවන් දැරියන් සෙල්ලං ගෙවල් - පස් වලින් ගෙවල් - හදාගෙන, ඒවා පිළිබඳව සතුට, රාගය, ඇල්ම, පිපාසය, ආශාව, ඇතිතාක් ඒ සෙල්ලම් ගෙවල් එක්ක සෙල්ලම් කරනව. සෙල්ලං ගෙවල් ඇත්ත හැටියට සළකනව. 'ආලයන්ති කෙලායන්ති ධනායන්ති මමායන්ති' ඒවා පිළිබඳ ඇලුමක් ඇතිකර ගන්නව, ඒවා සමඟ ක්‍රීඩා කරනව, ඒවා ධනය හැටියට, වටිනා දෙයක් හැටියට, සළකනව. මමායනය කරනව, මගේය කියල කියා ගන්නව. නමුත් යම් අවස්ථාවක අර රාග නන්දි ආදිය ඉවත් උනා නම්, අන්න එබඳු අවස්ථාවෙ අර දරුවන් මොකද කරන්නෙ? ඒ නුවණ මුහුකුරා ගියහම අතින් පයින් අර පස් ගෙවල්වලට ගහල ඒවා විසුරුවල විනාශ කරනව. ඊළඟට ඒක අනුව බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනව '**එවමෙව ඛො රාධ තුම්හෙ රූපං විකිරථ විධමථ විද්ධංසෙථ විකීළනිකං කරොථ තණ්හක්ඛයාය පටිපජ්ජථ**' ඒ වගේම වේදනාව, සංඥාව, සංස්කාර, විඥාන කියන පඤ්චස්කන්ධය පිළිබඳව ..... 'එසේම රාධ නුඹලා රූපය විසුරුව විනාශ කරව - විධමථ විද්ධංසෙථ - නැවත ක්‍රීඩා නොකළහැකි තත්ත්වයට පත්කරව - විකීළනිකං කරොථ, තණ්හක්ඛයාය පටිපජ්ජථ - තණ්හාව ක්ෂය කිරීම පිණිස පිළිපදුව. ඒ වගේම වෙදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ කියන ස්කන්ධ පිළිබඳවත් පිළිපදුව. ඊ ළඟට **අවසාන වශයෙන් ප්‍රකාශ කරනව. 'තණ්හක්ඛයො හි රාධ නිබ්බානං' මක්නිසාද රාධ, තණ්හාව ක්ෂය කිරීමම නිවනය.**

# අධෝලිපි

1. ථෙර. 50 පිට (බු.ජ.28)
2. සං.නි. III 106,108,110, පිටු (බු.ජ.15)
3. ප.ජො. 105 පිට (හේ.මු.)
4. සු.නි. 146 පිට (බු.ජ.25)
5. සු.නි. 236 පිට (බු.ජ.25)
6. සු.නි. 4 පිට (බු.ජ.25)
7. ම.නි. I 450 පිට (බු.ජ.10)
8. අං.නි. V 90 පිට (බු.ජ.22)
9. සං.නි. IV 676 පිටු (බු.ජ.16)
10. සං.නි. I - 246 පිට (බු.ජ.13)
11. සු.නි. 270 පිට (බු.ජ.25)
12. අං.නි. II 70 පිටුව (බු.ජ.11)
13. සං.නි. III 342 පිට (බු.ජ.15)